ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්

පියෙකු මෙන් මවක මෙන්

අවශ්‍යම මොහොතේ හොඳම මිතුරා

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

වාර්ෂික වාර්තාව 2016

අවශ්‍යම මොහොතේ හොඳම මිතුරා

සියලු ශ්‍රී ලාංකිකයන් උදෙසා සුරක්ෂිත, ලබාගත හැකි සහ විනිවිදභාවයෙන් යුතු රක්ෂණ වාරිකයක් නිර්මානය කිරීමේ අපගේ පවත්නා ගමන් මඟ තුළ අප සමාගමේ ඉතා වැදගත්ම අංග වලින් එකක් වන අපගේ සේවාව කෙරෙහි අප විශේෂ අවධානය යොමුකර ඇත. සියලුම වැදගත් මානව සාධක ඇතුළත්වී පුද්ගලාරෝපිත පාරිභෝගික සේවාවක් ලබා දීමේදී ඉහළම ප්‍රමිතියට අනුකූල වෙමින් අනාගතය උදෙසා ස්වකීය රැකවරණය ගැන සැලකිලිමත්වන අය සමඟ, තම අපේක්ෂාවන් සහ තැති ගැනීම් අපගේ පාරිභෝගිකයන් විසින් අන්‍යෙන්‍යව ක්‍රියාකිරීම මත සහ බෙදා හදා ගන්නා බවට ඔවුන් තුළ හැඟීම් ඇති කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු වී ඇත. ඔවුන් ගේ ගමන තුළින් අපගේ සේවය පිළිබිඹු වන අතර අවශ්‍යම මොහොතේ නිරන්තරයෙන් අපි ඔවුන් වෙනුවෙන් සිටින්නෙමු.

පටුන

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සමාගමේ ඉතිහාසය	4
දැක්ම, මෙහෙවර, ශ්‍රේණිගත කිරීම සහ ප්‍රතිපත්තිය	5
සමායතනික තොරතුරු	6
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහය	8
සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන කළඹ	10
ජීවිත රක්ෂණ නිෂ්පාදන කළඹ	11
අපගේ ජාලය	12

කාර්ය සාධන සමාලෝචනය 2016

මූල්‍ය ප්‍රගමනයන්	16
සභාපතිවරයාගේ පණිවිඩය	18
සම කළමනාකරණ අධ්‍යක්ෂකගේ සමාලෝචනය	22
මූල්‍ය සමාලෝචනය	26
ආයෝජන සමාලෝචනය	33
ආයෝජන අවදානම් කළමනාකරණය	36
මෙහෙයුම් සමාලෝචනය	39
පරිපාලිත සමාගම්වල කාර්යසාධනය	46
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කණ්ඩායම	47
සමායතනික සමාජ වගකීම්	51

පාලනය සහ අභ්‍යන්තර පාලනය

සමායතන පාලනය	56
අධ්‍යක්ෂ මණ්ඩලය	58
ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම	63
ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්	64
අවදානම් කළමනාකරණය	70
විගණන සහ අනුකූලවීමේ කමිටු වාර්තාව	78
ආයෝජන කමිටු වාර්තාව	81

මූල්‍ය ප්‍රකාශන

ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	85
අධ්‍යක්ෂක මණ්ඩල වගකීමේ ප්‍රකාශය	89
ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීමේ ප්‍රකාශය	90
රක්ෂකයාගේ ආයුගණක සහතිකය	91
වගකීම් ප්‍රමාණවත් පරීක්ෂණය	92
අලාභය සිදුවන ලද නමුත් (ප්‍රමාණවත් ලෙස) වාර්තා නොවූ හිමිකම් පිළිබඳ සහතිකය	93
ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව	94
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	96
ලාභ හෝ අලාභ සහ අනෙකුත් පූර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය	98
කොටස් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය	100
මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	104
ආංශික සමාලෝචනය : ආදායම් පිළිබඳ ප්‍රකාශය	106
ආංශික සමාලෝචනය :මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	108
මූල්‍ය ප්‍රකාශන සටහන්	110

අතිරේක තොරතුරු

මූල්‍ය ප්‍රකාශන ජීවිත රක්ෂණ පිළිබඳ තත්ත්වය	220
මූල්‍ය ප්‍රකාශන සටහන් - ජීවිත රක්ෂණ අරමුදල	221
දස වසරක සාරාංශය	232
ශාඛා කාර්යාල	236
වාර්ෂික මහ සභා රැස්වීමේ නිවේදනය	246
ආකෘතිය (ඡරදංහ)	247

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සමාගමේ ඉතිහාසය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, 1961 අංක 2 දරණ රක්ෂණ සංස්ථා පනතේ විධි විධාන යටතේ රජයට අයත් සංස්ථාවක් වශයෙන් ස්ථාපිත කරන ලදි.

1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ මෙම සංස්ථාව වර්ෂ 1993 දී භාණ්ඩාගාර ලේකම්වරයා 100% කොටස්වල තනි හිමිකාරත්වය දරන්නාවූ පූර්ණ වශයෙන්ම රජයට අයත් සීමිත වගකීම් සහිත සමාගමක් බවට පරිවර්තනය කරන ලදි. රජයේ පෞද්ගලීකරණය වැඩ සටහන යටතේ, 2003 වර්ෂයේ දී මෙම සමාගම පෞද්ගලීකරණය කරනු ලැබූ අතර සමාගම වර්ෂ 6 ක පමණ කෙටි කාල පරිච්ඡේදයක් පෞද්ගලික කලමනාකරණය යටතේ පැවතුණි. 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාව නැවත ලියා පදිංචි කරන ලදි. පෞද්ගලීකරණය අවලංගු කරමින් 2009 ජූනි මස 04 වන දින ලබාදෙන ලද ශේෂ්ඨාධිකරණ තීන්දුවට අනුව සංස්ථාවේ 99.97% කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පවරන ලදි.

රුපියල් බිලියන 62.9 ක විශාලතම කොටස් හිමියන්ගේ අරමුදලකින් සහ රුපියල් බිලියන 87.3 විශාලතම ජීවිත රක්ෂණ අරමුදලකින් සමන්විත රුපියල් බිලියන 176.8 වටිනාකමකින් යුත් මුළු වත්කම් ප්‍රමාණයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුවේ.

පුරෝගාමී රක්ෂකයකු වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, රට තුළ ක්ෂේත්‍රය පිළිබඳ ඉහළම තාක්ෂණික දැනුම් සම්භාරයකින් සමන්විත වේ. මෙතෙක් ගෙවනු ලැබූ විශාලතම හිමිකම් මුදල වන රුපියල් බිලියන 39.5 සහ ස්වකීය ජීවිත රක්ෂණ ඔප්පු හිමියන් වෙත ප්‍රදානය කළ ජීවිත රක්ෂණ රුපියල් බිලියන 6.2 ක විශාලතම ප්‍රසාද දීමනාව පිරිනැමීම ශ්‍රී ලංකා රක්ෂණ ක්ෂේත්‍රය තුළ බොහෝ ඓතිහාසික අද්දියරයක් සනිටුහන් කිරීමට සමාග මේ මූල්‍ය ස්ථාවරත්වය සහ ශක්තිමත් ප්‍රති රක්ෂණ කටයුතු මනා පිටුවහල් වී ඇත. ආරම්භයේදී රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද සුවිශේෂී ලක්ෂණ සහ සේවාවන් ඉටු කිරීම සඳහා පැවරු බලය පසුගිය වර්ෂ ලෙසින්ම පවත්වාගෙන ගොස් ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විශේෂඥ ඥානයකින් හා දසක කීපයක් තුළ ඇති කරගත් විශ්වාසනීයත්වයකින් ශ්‍රී ලාංකික ජනතාවට සේවය ලබා දෙයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ඉදිරි දැක්ම

ජාතියේ විශ්වාසය දිනූ රක්ෂකයා වීම

මෙහෙවර

අප සේවකයන්ට ප්‍රතිලාභ ලබාදෙමින් සහ අප කොටස් හිමියන්ට සහන චිකතුකර දෙමින් පාරිභෝගිකයා කෙරෙහි විශේෂ අවධානය යොමුකර, හැම විටම හොඳම වටිනාකමකින් යුත් නව රක්ෂණ සේවා අප පාරිභෝගිකයන්ට ලබා දෙමින් ඔවුන්ගේ විශ්වාසය දිනා ගන්නා සමාගමක් වීම

ශ්‍රේණිගත කිරීම් හා ප්‍රතීතනය (ප්‍රත්‍යාගනය)

AA(lka)

ස්ථාවර දැක්මක් සහිත ජාතික දීර්ඝකාලීන ශ්‍රේණිගත කිරීම



AA(lka) ස්ථාවර දැක්මක් සහිත ජාතික රක්ෂකයාගේ මූල්‍ය ශක්තිය ශ්‍රේණිගත කිරීම



අයිඑස්ඕ 9001:2008

සමායතනික තොරතුරු

සමාගමේ නම සහ ලියාපදිංචි කාර්යාලය:
සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 2.
දු.ක : +94 11 2357457
ෆැක්ස් : +94 11 2447742
වෙබ් අඩවිය : www.srilankainsurance.com

සමාගමේ ලියා පදිංචි ප්‍රමිතිය
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1993.02.0.03 වන දින අංක එන් (පීබීඑස්/සීපීබී)/159 යටතේ සංස්ථා ගත කරනු ලැබ 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2008.04.17 වන දින අංක පීබී 289 යටතේ නැවත ලියාපදිංචි කරන ලදි.

අධ්‍යක්ෂක මණ්ඩලය
කීත් ඩී බර්නාඩ් මහතා 2016.12.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ ධූරය අවසන් කරනු ලැබූ අතර ඒ අනුව ඩී.බී. අරුණ පී.එස්. සිරිවර්ධන මහතා 2016.12.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදි.

වාර්තා කළ දිනය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.
හේමක ඩී.එස්. අමරසූරිය මහතා (සභාපති)
ටී.එම්.ආර්. බන්ස ජයා මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)
ඩී.බී. අරුණ පී.එස්. සිරිවර්ධන මහතා මහතා
(සම කළමනාකාර අධ්‍යක්ෂ)
විද්‍යාජෝති මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා
(විධායක නොවන අධ්‍යක්ෂ)
පී. අල්ගම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)
ඒ.සංජය පද්මපෙරුම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)
ප්‍රදීප ඒ. ලියනමාන (විධායක නොවන අධ්‍යක්ෂ)

නෛතික රාමුව
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, 1961 අංක 2 දරණ රක්ෂණ සංස්ථා පනතේ විධි විධාන යටතේ රජයට අයත් සංස්ථාවක් වශයෙන් ස්ථාපිත කරන ලදි.

1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ මෙම සංස්ථාව වර්ෂ 1993 දී භාණ්ඩාගාර ලේකම්වරයා 100% කොටස්වල තනි හිමිකාරත්වය දරන්නාවූ පූර්ණ වශයෙන්ම රජයට අයත් සීමිත වගකීම් සහිත සමාගමක් බවට පරිවර්තනය කරන ලදි. රජයේ පෞද්ගලීකරණය වැඩ සටහන යටතේ, 2003 වර්ෂයේ දී මෙම සමාගම පෞද්ගලීකරණය කරනු ලැබූ අතර සමාගම වර්ෂ 6 ක පමණ කෙටි කාල පරිච්ඡේදයක් පෞද්ගලික කළමනාකරණය යටතේ පැවතුණි. 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාව නැවත ලියා පදිංචි කරන ලදි. පෞද්ගලීකරණය අවලංගු කරමින් 2009 ජූනි මස 04 වන දින ලබාදෙන ලද ශේෂ්ඨාධිකරණ තීන්දුවට අනුව සංස්ථාවේ 99.97% කොටස් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පවරන ලදි.

බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය
294001590

චැට් ලියාපදිංචි අංකය
294001590-7000

සමාගම් ලේකම්
ඩී.ඒ. රුවනි ධර්මවර්ධන
එල්ව්ල්බී නීතිඥ ඩබ්ඩිඒ ඒසීඅයිඑස්අයි (එ.රාජධානිය)

පරිපාලිත සමාගම්
- සී/ස මැනේජ්මන් සර්විසස් රක්ෂණ (පෞද්ගලික) සමාගම
- ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
- ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්
- ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්
- කැන්විල් හෝල් ඩිංස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
- කැනෝවිල් හොටේල්ස් ඇන්ඩ් ස්පාක් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

උප පරිපාලිත ආයතන
- ලංකා හොස්පිටල්ස් ඩයග්නොස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්
- හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්
- සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ්

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

විගණකවරුන්

විගණකාධිපති

බැංකු කරුවන්

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
- හැටන් නැෂනල් බැංකුව පීඑල්සී
- නේෂන් ට්‍රස්ට් බැංකුව පීඑල්සී
- ස්ටෑන්ඩඩ් චාර්ටඩ් බැංකුව
- සම්පත් බැංකුව පීඑල්සී
- සෙලාන් බැංකුව පීඑල්සී
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
- පෑන් ඒසියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී
- ඩීඑෆ්සීසී බැංකුව පීඑල්සී

ආයුගණක - ජීවිත

එම්/එස් ටුවර්ස්වොට්සන් සිංගප්පූරු ප්‍රයිවෙට් ලිමිටඩ්
63 චෙෂ්ලියා වීදිය #09-01 ඕසීබීසී මධ්‍යස්ථානය, නැගෙනහිර
සිංගප්පූරුව 049514

ආයුගණක - ජීවිත නොවන


එම්/එස් එන්එම්ජී ෆයිනෑන්සියල් සර්විසස් කන්සල්ටින්
30, හිල් වීදිය, #03-02 ඒ,
සිංගප්පූරුව 179360

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහය


වර්ෂ 2016 දෙසැම්බර් මස අවසන් වනවිට, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පවරන ලද සමාගමේ කොටස්වලින් 99.97% සහිතව ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ බහුතර කොටස් හිමිකරුවා විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සමූහය පූර්ණ වශයෙන් අයිති පාලිත සමාගම් 3 කින් සහ ආංශික වශයෙන් අයිති පාලිත සමාගම් තුනකින් සමන්විත වේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමූහයේ පූර්ණ වශයෙන් අයිති පරිපාලිත සමාගම වන්නේ ලිට්රෝ ගෑස් ටර්මිනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් වේ. ආංශික වශයෙන් පරිපාලිත සමාගම් වන්නේ ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් 99.94% හිමිකාරිත්වයක් ශ්‍රී.ලං.ර.සං. සතුවේ. ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී (54.61% හිමිකාරිත්වය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුවේ) සහ කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (45.95% ක කොටස් අයිතිය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුවේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සමූහ ව්‍යුහය




ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248



4-13 **ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව**
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන කළඹ



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ජීවිත රක්ෂණ නිෂ්පාදන කළඹ

Sri Lanka Insurance
LIFE
Invest wisely in life

ළමයින් සඳහා රක්ෂණ විසඳුම්

Minimuthu
Children's Plan

Minimuthu Dayada
Children's Plan

ආයෝජන රක්ෂණ විසඳුම්

Divi Thilina
Protection Plan

Yasa Isuru
Advance Benefit Plan

Janadiri
Two year relief plan

Praguna
High Returns Plan

සෞඛ්‍ය රක්ෂණ විසඳුම්

Sri Lanka Insurance
HEALTH
A Healthy Nation Is A Wealthy Nation

විශ්‍රාම ගැනීමේ රක්ෂණ විසඳුම්

Freedom
Retirement Plan

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

අපගේ ජාලය

උතුරු මැද පළාත

අනුරාධපුරය
- අනුරාධපුරය
- දඹුල්ල
- ගලේවෙල
- ගල්ගමුව
- හිඟුරක්ගොඩ
- කඳුරුවෙල
- කැකිරාව
- තඹුත්තේගම
- වව්නියාව
- හොරොව්පතාන
- බකමූණ
- අරලගංවිල

ඌව වෙල්ලස්ස පළාත

බදුල්ල
- අම්පාර
- බදුල්ල
- බණ්ඩාරවෙල
- බිබිලෙ
- මහියංගනය
- මොනරාගල
- වැලිමඩ
- වැල්ලවාය

නැගෙනහිර පළාත

- මඩකලපුව
- කල්මුනෙයි
- කන්තලේ
- ත්‍රිකුණාමලය
- අක්කරපත්තුව
- දෙහිඅත්තකණ්ඩිය

මධ්‍යම පළාත

මධ්‍යම 1
- දිගන
- නුවර (තැපෑ)
- පිළිමතලාව
- ගම්පොල
- නුවර
- මාතලේ

මධ්‍යම 2
- හැටන්
- කෑගල්ල
- මාවනැල්ල
- නාවලපිටිය
- නුවරඑළිය
- රිකිල්ලගස්කඩ

බස්නාහිර පළාත

කොළඹ - 01
- බත්තරමුල්ල
- හෝමාගම
- කිරුලපන
- මහරගම
- මාලබේ
- නුගේගොඩ
- පිටකෝට්ටේ

කොළඹ 2
- කොළඹ කොටුව
- කඩවත
- කඩුවෙල
- කිරිබත්ගොඩ
- කොටහේන
- වත්තල
- රාගම

බස්නාහිර පළාත

කොළඹ 3
- බම්බලපිටිය
- නගර ශාඛාව
- දෙහිවල
- මොරටුව
- පිලියන්දල
- රත්මලාන

කොළඹ - 4
- බොරැල්ල

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

දකුණු පළාත

ගාල්ල
- අම්බලන්ගොඩ
- බැද්දෙගම
- ඇල්පිටිය
- ගාල්ල
- තල්ගස්වල
- උඩුගම

හම්බන්තොට
- අම්බලන්තොට
- බෙලිඅත්ත
- තිස්සමහාරාමය
- හම්බන්තොට
- තංගල්ල

දකුණු පළාත

මාතර
- මාතර
- දෙනියාය
- දික්වැල්ල
- අකුරැස්ස
- වැලිගම
- හක්මන

බස්නාහිර පළාත

ගම්පහ
- ගම්පහ
- මිනුවන්ගොඩ
- නිට්ටඹුව
- වේයන්ගොඩ
- ජා-ඇල
- කදාන
- මීගමුව
- කොච්චිකඩේ

කලුතර
- බණ්ඩාරගම
- අලුත්ගම
- හොරණ
- කලුතර
- මතුගම
- පානදුරය

උතුරු පළාත

යාපනය
- චන්කනෙයි
- යාපනය
- කිළිනොච්චි
- මන්නාරම
- නෙල්ලිඅඩි
- චාවකච්චේරි
- මුලතිව්

වයඹ පළාත

කුරුණෑගල
- ආනමඩුව
- ගිරිඋල්ල
- කුරුණෑගල
- මැල්සිරිපුර
- නාරම්මල
- කුලියාපිටිය
- නිකවැරටිය
- වරකපොළ
- වාරියපොළ
- හලාවත
- මාරවිල
- පුත්තලම
- වෙන්නප්පුව

සබරගමුව පළාත

රත්නපුර
- අවිස්සාවේල්ල
- බලන්ගොඩ
- ඇහැලියගොඩ
- කහවත්ත
- කලවාන
- රත්නපුර
- ඇඹිලිපිටිය

Note : Branches in Ragama, Bakamuna and Aralaganwila were opened in 2017

කාර්ය සාධන සමාලෝචනය 2016

මූල්‍ය ප්‍රගමනයන්

	2016	2015
මුළු ආදායම	42,108	31,157
දළ ලිඛිත ආදායම	27,614	24,521
ශුද්ධ ඉපයූ ආදායම	24,013	20,393
බදු පෙර ලාභය (PBT)	13,791	4,821
බදු පසු ලාභය (PAT)	12,741	3,439
මුළු වත්කම්	176,802	166,947
වත්කම් මත ලාභය (%)	7	2
සාමාන්‍ය රක්ෂණය		
සාමාන්‍ය රක්ෂණ අරමුදල	16,517	14,917
ශුද්ධ හිමිකම් අනුපාතය (%)	69.8	65
වියදම් අනුපාතය (%)	29.1	28.52
ජීවිත රක්ෂණය		
ජීවිත රක්ෂණ අරමුදල	87,357	77,858
වියදම් අනුපාතය (%)	41	35
මුහුණත වටිනාකම් ප්‍රසාද දීමනාව	6,216	5,385
ශ්‍රේණිගත කිරීම්		
පිච් රේටින්	AA(lka)	AA(lka)
ජාතික රක්ෂබ මූල්‍ය ශක්තිය	AA(lka)	AA(lka)
ජාතික දීර්ඝකාලීන දැක්ම	Stable	Stable

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248



වර්ෂය සඳහා ලාභය
රු.බි. 12.7



මුළු වත්කම්
රු.බි. 176.8



ජීවත අරමුදලේ ප්‍රමාණය
රු.බි. 87.3



වර්ෂයේ ප්‍රකාශිත
මුළු ප්‍රසාද දීමනා
රු.බි. 6.2




බදු සඳහා දායකත්වය
රු.බි. 2.9



ආයෝජන ආදායම
රු.බි. 17.3

සභාපතිවරයාගේ පණිවිඩය



" අධිවේගී මාර්ග, මෙගා පොලිස් ව්‍යාපෘති සහ කොළඹ වරාය නගරයේ මූල්‍ය මධ්‍යස්ථානය වැනි මහා පරිමාන ජාතික වැඩසටහන් මගින් බොහෝ අනුබල දෙන කර්මාන්ත ඇතිවීම මෙන්ම විවිධ ආර්ථික අංශ හරහා රක්ෂණ සැලසුම් කෙරෙහි විශාල ඉල්ලුමක් ජනනය කරනු ඇත. "

ශ්‍රී ලංකා රජය වෙත, (රජයට අයත් අනෙකුත් ව්‍යාපාර ආයතන මෙන්ම) ස්වකීය යුතුකම් හා වගකීම් උචිත ලෙස ඉටු කරමින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ව්‍යාපාර ප්‍රතිඵල පිළිබඳ තවත් සතුටුදායක වර්ෂයක් 2016 වර්ෂයේදී වාර්තාගත කළ බව සතුටින් දන්වමි.

ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිමිකාරිත්වයෙන් 99.9% කට වඩා කියන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කොටස් හිමිකරු වේ. රජයට අයත් අනෙකුත් ව්‍යාපාර ආයතන වගේම, රජයේ මැදිහත්වීම හරහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ බෙදා හැරිය හැකි ලාභ ජනතාව වෙත ප්‍රතිඵලදායී ලෙස යොදවනු ලබන අතර සමහර අවස්ථාවලදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වර්ධන හා ආයෝජන තීරණ රජයේ ප්‍රතිපත්ති මගින් මෙහෙයවනු ලබයි. එමනිසා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කාර්ය සාධනය, මුදල් තත්ත්වය පමණක් සැලකිල්ලට ගෙන හෝ කර්මාන්තයේ රක්ෂණ තරඟකරුවන්ට විරෙහිව හැර, ජනතාවගේ වගකීමේ අනාගත දැක්මෙන් අනිවාර්යයෙන්ම සමාලෝචනය කළ යුතුය.

රජයට අයත් ව්‍යාපාරවල වර්ධණීය වැදගත්කම සහ ඉතා ඉහළ වෘත්තිමය යෙදවුම් සහ අදාළ කළමනාකරණ විශේෂඥ ඥානය සහිතව මෙම ව්‍යාපාර ආයතන කළමනාකරණය කිරීම ඉතා අවශ්‍ය බව මෙමගින් පිළිඹිඹු කරනු ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

රජය වෙත ලාභාංෂ

2016 මූල්‍ය වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් රුපියල් බිලියන 10.85 ක ලාභාංශ ශ්‍රී ලංකා රජය වෙත ගෙවන ලදි. මෙය ලාභාංශ පොලී අනුපාතය 85% වන අතර පසුගිය වසරට සාපේක්ෂව 46% ක ගෙවීම වැඩිවීමකි.

බදු ගෙවීම

ආදායම් බදු, වැට් බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදිය ඇතුළු රජයේ භාණ්ඩාගාරය වෙත බදු වශයෙන් රුපියල් බිලියන 2.9 ක මුදලක් දායක කරමින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රධාන බදු ගෙවන්නා බවට අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.

පරිත්‍යාග සහ සමායතන සමාජීය වගකීමට(CSR) දායකවීම

සේවා සහ පහසුකම් ආකාරයෙන් ජනතාව වෙත නැවත දායක කරනු ලබන රජය වෙත ලබාදෙන ලාභාංෂ සහ බදුවලට අමතරව, ආගමික, අධ්‍යාපනික සංඛ්‍යායට අදාළ සහ අනෙකුත් පොදු ආයතනවලට බොහෝ පුන්‍යාධාර පරිත්‍යාග තුළින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සමාජයට සෘජුවම දායකත්වය ලබා දෙයි.

එසේම, දීර්ඝකාලීන සමායතනික සමාජ වගකීම් ව්‍යාපෘති, රාශියක් සංස්ථාව සතුවේ. සැලකිල්ලෙන් තෝරාගනු ලැබූ සමායතන සමාජීය වගකීම (CSR) වැඩසටහන් ඒවායේ ප්‍රතිලාභීන්ට සහ සමාජයට විශාල වශයෙන් අර්ථාන්විත ප්‍රතිලාභ බවට පත්වීමට නම් එම වැඩසටහන් තිරසාර වීම පැවතීම අවශ්‍ය බව විශ්වාසය තුළින් අවබෝධ කර ගෙන ඇත.

සියලුම පුන්‍යාධාර දායකවීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත් ක්‍රියාවලියක් හරහා අනුමත කරනු ලබයි. එක වරක් සිදු කරන ජනහිතකාමී කටයුතු වලට වඩා දීර්ඝකාලීන සමායතන සමාජීය වගකීම (CSR) ව්‍යාපෘති වලින් සුවිසල් ප්‍රතිඵලදායි සමාජීය බලපෑම් ඇති බැවින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, එවැනි කටයුතු වලදී ස්වකීය සන්නාමය හඳුන්වා දීමේ අදහසින් අනාගතයේදී එවැනි කටයුතු වලට අවධානය යොමු කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

වෙළඳපොල හැසිරීම

2016 මුළු වෙළඳපොල මුලින්ම 2014 වර්ෂයේ අත්විඳීමට සිදුවූ දුර්වල තත්ත්වය සහ පසුව 2015 වර්ෂයේ යළි ශක්තිමත්ව වර්ධනය වූ සමස්ථ වෙළඳපොළ 2016 වර්ෂය තුළදී ස්වකීය පාවිය හැකි වර්ධන රටාව නැවත සිදු කිරීමට නොහැකි වීම බලපොරොත්තු කඩවූ අවස්ථාවක් විය. සමස්ථ ආර්ථිකයේ වේගය අඩුවීම හේතු කීපයකින් එකක් විය හැකිය. නමුත් ශාඛා පුළුල් කිරීමේ වේගය අඩුවීම මගින් වර්ධන වේගය රඳවා ගැනීම සඳහා රක්ෂණ කර්මාන්තයේම නොහැකියාව සහ ව්‍යුහගත ප්‍රවර්ධන වැඩසටහන් සාමුහිකව අඩු කිරීම, කර්මාන්තයේ වර්ධන වේගය අඩුවීමට බලපෑ හේතු කීපයක් විය හැකිය.

2016 වර්ෂයේ හතරවන කාර්තුවේදී සමායතන අංශයේ වේගය අඩුවීම මඟින් වර්ෂයේ කාර්ය සාධනය අවසන් කිරීමට ස්වකීය සම්ප්‍රදායක තල්ලුවෙන් ඇතිවන වර්ධනයේ මෙම ප්‍රධාන අංශය පහත හෙලනු ලැබූ අතර මෙය රක්ෂණ අංශයටද බලපාන ලදි.

ඉහළ යන උද්ධමනය පාරිභෝගිකයාගේ මිලදී ගැනීමේ හැකියාවට බලපැමි කරන ලදි. 2015 වර්ෂය, ප්‍රවේශය යථා තත්ත්වයට පත් කරන ලද දිවයින පුරා ශාඛා විවෘත කිරීම් සඳහා යහපත් ඵලදායී වර්ෂයක් වූ අතර නව විවෘත කිරීම් 2016 වර්ෂයේදී පහත වැටුණි.

මෙම තත්ත්වය 2017 වර්ෂය සඳහා වූ වර්ධන සැලසුම් වහි මුල් කාල සීමාව තුළදී අවිනිශ්චිත තත්ත්වයට පත් කිරීමට ඉඩ සලසයි. සාමාන්‍ය පරිවර්තනයකට වහා වර්ධනයක් ඇති කර ගැනීම සඳහා කර්මාන්තය තුළින් ඇති කරන පරිශ්‍රම ඉතා බලවත් අවශ්‍යතාවයකි.

ව්‍යාපාර කාර්ය සාධනය

2016 වර්ෂයේ රක්ෂණ කර්මාන්තය තුළ පාලනය කරන ලද ආර්ථික පසුබිම සහ මුහුණ දෙන ලද වෙනස්කම් සැලකිල්ලට ගැනීමේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය සතුටුදායක ලෙස අගය කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් අභියෝගාත්මක පරිසරයක් තුළ ආදායම් දෙගුණයක් කර ගැනීමක් මෙන්ම 270% ක ශුද්ධ ලාභ වර්ධනයක් රඳවා ගන්නා ලදි. කරුණාකර කාර්ය සාධනයට අදාළ තොරතුරු සඳහා සම කළමනාකරණ අධ්‍යක්ෂවරුන්ගේ සමාලෝචනය බලන්න.

කෙසේ වුවද, මෙම ජයග්‍රහණයන් ලඝුකොට නොසලකමින්, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාප්තියේ පහළ මට්ටම් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සම්පත් සහ සන්නනාමය පිළිගැනීම සැලකිල්ලට ගැනීමේදී, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අනාගතයේදී වඩා යහපත් කාර්යක් කළ හැකි බව අප විශ්වාස කරන්නෙමු. වම නිසා, පසුගිය වෙළඳපොල මිල ගණන් වැඩි දියුණු කර ගැනීම ඉලක්ක ගත කරමින් වැඩි වශයෙන් මෙම හැකියාවන් සහ ඉතා ඉහළ තත්ත්වයට පත්වීම සඳහා වන මෙහෙයුම් වර්ධන අනුපාතයන් අවබෝධ කර ගැනීම සඳහා උපායමාර්ගිකව මැදිහත්වීම කෙරෙහි ඉදිරි වර්ෂ තුන තුළ අපගේ අවධානය යොමු කෙරෙනු ඇත.

සභාපතිවරයාගේ පණිවිඩය ඉතිරි කොටස.

පරිපාලිත සමාගම්වල දායකත්වය

රජයට අයත් ආයතනයක් වශයෙන්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන රජයේ ප්‍රතිපත්ති වලට යටත් වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රුපියල් බිලියන 151 ආයෝජන ප්‍රමාණයෙන්, ආසන්න වශයෙන් රුපියල් බිලියන 21 ක් පරිපාලිත සමාගම්වල කොටස් ආයෝජන මගින් නියෝජනය වේ. 2016 වර්ෂයේදී මෙම පරිපාලිත සමාගම් සාමුහිකව, මුළු ආයෝජන ආදායමට ලාභාංෂ වශයෙන් රුපියල් බිලියන 7.9 කින් දායක වූ අතර මුළු ආයෝජන ආදායමෙන් 46% කට වගකියන ලදි.

පරිපාලිත සමාගම් වන ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් (හිමිකාරිත්වය 99.9%), ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් (හිමිකාරිත්වය 100%) සහ කැනෝවින් හොටේල්ස් සහ ස්පාස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (හිමිකාරිත්වය 100%) වර්ෂයෙන් වර්ෂය වැඩි දියුණු වෙමින් ආදායම් සහ කොටස් මත ලාභය (ROES) යන දෙයාකාරයෙන්ම කැපීපෙනෙන කාර්ය සාධනයක් වාර්තා කර ඇත. 2015 වර්ෂයේදී 25% ක් වූ ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් හි කොටස් මත ලාභය (ROE) 2016 වර්ෂය වන විට විවිධ 27% කින් වැඩි වී ඇති අතර ලිට්රෝ ටර්මිනල් ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ්හි පිළිවෙලින් 11% සිට 24% දක්වා ඉහළ යන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට 54.6% ක හිමිකාරිත්වයක් ඇති ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී සමාගම ද ශක්තිමත් වසරක් වාර්තා කරනු ලැබූ අතර වසරින් වසර 17% සිට 16.63% දක්වා කොටස් මත ලාභය (ROE) ස්ථාපනය කරමින් ශුද්ධ ලාභයට රුපියල් මිලියන 972 කින් දායක වී ඇත.

මෙයින් පරිබාහිර වන්නේ, මෙහෙයුම් කටයුතු තවමත් සිදු නොවන එහෙත් ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින කැන්විල් හෝල්ඩිංස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ එහි පරිපාලිතය වන සිනෝලංකා හොටේල් ඇන්ඩ් ස්පා (ප්‍රයිවෙට්) ලිමිටඩ් හරහා ක්‍රියාත්මක කරනු ලැබූ ග්‍රෑන්ඩ් හයිටි ව්‍යාපෘතිය (ඨර්බා ෂහ්එව ඡරදවැජඒ) වේ. 2018 වර්ෂයේ 3 වන කාර්තුවේදී, වැඩ සම්පූර්ණ කිරීම සඳහා වන අවසන් දිනයට පෙර වැඩ නිම කිරීම සඳහා, හෝටලයේ ප්‍රධාන ව්‍යුහය සෑහෙන ප්‍රමාණයකට සම්පූර්ණ කර ඇති අතර කොන්ත්‍රාත්කරුවන් කණ්ඩායම් කීපයක් අදාළ ඇතුළත කොටස් වල ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් රුපියල් බිලියන 8.5 ක් සහ එහි පරිපාලිතයන් වන පිළිවෙලින් ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් හා සේවක අර්ථසාධක අරමුදලින් රුපියල් බිලියන 5.0 බැගින් මූලික කොටස් ආයෝජනයක් කළා වූ හොටෙල් ව්‍යාපෘතිය මගින්, සම්පූර්ණ කළ පසු කොළඹ නගරයේ ප්‍රමුඛ ස්ථානයක් වන බවට බලාපොරොත්තු තබාගත හැකි මෙම සැලැස්ම සම්පූර්ණ කිරීම සඳහා වන ණය ප්‍රාග්ධනය ගෙවිය යුතු පොළියට වඩා ලාභයක් ඉපයීම සඳහා උපයෝගි කරගනු ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ පරිපාලිත සමාගම් පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා කරුණාකර "පරිපාලිත සමාගම්වල කාර්ය සාධනය" යන ශීර්ෂය යටතේ වන පරිච්ඡේදය බලන්න.

ව්‍යාපාර තිරසාරභාවය

ෆිච් ශ්‍රේණිගත කිරීම් 2017 වර්ෂයේ ජනවාරි මාසයේදී ලංකා ආයතනය විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට "AA (lka)" ජාතික දීර්ඝ කාලීන ශ්‍රේණිගත කිරීම සහ "AA (lka)" ජාතික රක්ෂණ මූල්‍ය ශක්තිය (IFS) ශ්‍රේණිගත කිරීම ලබා දී ඇත. දේශීය රක්ෂණ ව්‍යාපාරය තුළ ශක්තිමත්ම රක්ෂකයා වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තත්ත්වය එම ශ්‍රේණිගත කිරීමෙන් පිළිඹිඹු වේ. 2016 වර්ෂයේදී දළ ලිඛිත වාරිකය (GWP) මගින් මනිනු ලැබූ පරිදි රටතුළ ජීවිත නොවන ව්‍යාපාර කටයුතු වලින් දෙවන ඉහළ වෙළඳපොල කොටස වන 20% සහ ජීවිත රක්ෂණ කටයුතුවල දෙවන ඉහළම කොටස් වන 19% ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් අත්කරගෙන සිටියි. රක්ෂණ අංශයේ මූල්‍ය වත්කම් වලින් තුනෙන් එකකට (1/3) වැඩි ප්‍රමාණයකට හිමිකම් කියන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වත්කම් ප්‍රමාණය 2016 වර්ෂය අවසාන වන විට රුපියල් බිලියන 177 කි.

ව්‍යාපාර තිරසාරභාවේ ප්‍රධාන දර්ශකයක් වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියාමන ප්‍රාග්ධන අනුපාත නියාමන උපරිම තත්ත්වයට වඩා ඉහළින් හොඳ තත්ත්වයක පවතින අතර දේශීය රක්ෂණ කර්මාන්තය තුළ ශක්තිමත්ම රක්ෂණ සමාගම් අතර සිටියි. එක් එක් රක්ෂණ ක්‍රම සඳහා අවශ්‍ය උපරිම ප්‍රමාණය වන 120% ට සාපේක්ෂව ජීවිත රක්ෂණ සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවේ අනුපාතය 2016 දෙසැම්බර් මස අගවන විට 427% වූ අතර සාමාන්‍ය රක්ෂණ සඳහා 186% විය.

ඊට අමතරව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය අනුමත කරන ලද ස්විස් රේ සහ මුනිච් රේ (Swiss Re and Munich Re) මෙහෙයවනු ලබන ජාත්‍යන්තර ප්‍රතිරක්ෂකයන් ගේ ශක්තිමත් ප්‍රතිරක්ෂණ ආවරණය මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට පිටුබලයක් ලැබේ. 2016 මැයි මස දී ඇතිවූ ගංවතුර තත්ත්වය නිසා හිමිකම්වල අතිශය ඉහළ යාමට මුහුණ දුන් අවස්ථාවේදී 2016 වර්ෂයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශේෂ පත්‍රය ආරක්ෂා කිරීමට මෙම පූර්ණ ප්‍රතිරක්ෂණාවරණය අබණ්ඩව කටයුතු කරන ලදි. නැගී එන වෙළඳපොළ තුළ රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ මොඩලයන් සඳහා කෙටි මාර්ග නොමැති බව යළි යළිත් ප්‍රකාශ කරන්නෙමු.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

2016 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සියලුම නීතිරීති සහ අනෙකුත් අදාළ නියෝගවලට සම්පූර්ණයෙන්ම යටත්ව කටයුතු කරන ලදි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අනුකූලවීමේ තත්ත්වය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා කරුණාකර "පාලනය" පිළිබඳ පරිච්ඡේදය බලන්න.

අනාගත සැලැස්ම

ස්වකීය ව්‍යාපාර කටයුතු ඉවත් කරගෙන කොළඹ කොටස් වෙළඳපොළ තුල ලැයිස්තු ගතවන ලෙසට සංයුක්ත රක්ෂකයන්ට නියම කරන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නියාමන වෙනස්කම් 2016 වර්ෂයේදී බලාත්මක කරන ලදි. කෙසේ වුවද, මූලික වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වෘත්තීය සමිතිවල විරෝධය නිසා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ලැයිස්තුගත නොකළ සංයුක්ත රක්ෂකයා වශයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක විය. පවත්නා තත්ත්වය තිබියදී, ඇතැම් විදේශයට අයත් සමාගම සමඟ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවත් ලැයිස්තු ගත කිරීමෙන් නිදහස් කරන බව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් අප වෙත දැනුම් දී ඇත. වෙන් කිරීමට අදාළව රජය විසින් ඉතා ඉක්මණින් අවසන් තීරණයක් ගැනීම අවශ්‍ය වේ.

ඉහත තත්වය තිබිය දීත් දේශීය රක්ෂණ කර්මාන්තයට සේවය ලබාදෙන අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුව විශිෂ්ඨ වර්ධන හැකියාවක් පවතින බව අපගේ විශ්වාසයයි. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මහා පරිමාන ආයෝජන ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් නව ජාතික සංවර්ධන ව්‍යාපෘති සමඟ එකට වර්තමානයේදී යළි නඟා සිටුවනු ලබයි. අධිවේගී මාර්ග, මෙගා පොලිස් ව්‍යාපෘති සහ කොළඹ වරාය නගරයේ මූල්‍ය මධ්‍යස්ථානය වැනි මහා පරිමාන ජාතික වැඩසටහන් මගින් බොහෝ අනුබල දෙන කර්මාන්ත ඇතිවීම මෙන්ම විවිධ ආර්ථික අංශ හරහා රක්ෂණ සැළසුම් කෙරෙහි විශාල ඉල්ලුමක් ජනනය කරනු ඇත.

මෙම දශකය අවසානයේදී සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ස්වකීය ප්‍රත්‍යක්ෂ සන්නාම කොටස් අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කරනු ලබන බව පෙනේ. මූල්‍ය වාර්ෂික සන්නාම ඇගයීම තුළ සාමාන්‍ය සහ ජීවිත රක්ෂණ සඳහා පිළිවෙලින් අංක 32 සහ අංක 35 වශයෙන් ශ්‍රේණිගත කරනු ලැබීමෙන් පෞද්ගලික අංශයේ ප්‍රමුඛපෙළේ රක්ෂකයන් දී දෙක අතර සිරකර තැබීමක් සිදු කරයි. එක සන්නාමයක් ලෙස සලකනු ලැබුවොත්, අපවෙත අංක 23 සන්නාම තත්ත්ව ලබා දෙමින් අපගේ සන්නාම වටිනාකම රුපියල් බිලියන 4.5 ට සමාන වනු ඇත. අපගේ උපදේශකවරුන්ට සහ අලෙවි බලකායට ඇති අභියෝගය වන්නේ රාජ්‍ය අංශය තුළ වඩාත්ම වටිනාම 4 වන ස්ථානය හිමි (විශාල බැංකු 3 කට පිටුපසින්) ආක්‍රමණශීලී ක්‍රියාකාරිත්වයක් සහ සූක්ෂම වැඩසටහන් මඟින් අනුබල දෙන මෙම ප්‍රබල සන්නාම කොටස් 2017 වර්ෂයේදී ශක්තිමත් ආදායම් වර්ධනයක් දක්වා පරිවර්තනය කිරීමයි.

මෙම අපේක්ෂිත නව අභියෝගාත්මක වර්ධනය සපුරා ගැනීම සඳහා පියවර ගෙන ඇත. ශාඛා ප්‍රමාණය කඩිනමින් ඉහළ නැංවීම සඳහා වන සැලසුම් ඇතුලුව 2018 වර්ෂයේ සිට 2020 දක්වා තුන් අවුරුදු ව්‍යාපාරික උපාය මාර්ගයක් සඳහා දළ සැලසුම් සකස් කිරීම ආරම්භ කර ඇත. නිශ්චිත ඉලක්කගත කණ්ඩායම් සඳහා නව, විශේෂිත රක්ෂණ සැලසුම් ඇති කිරීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී. ඉදිරි වර්ෂ තුන තුළදී, වේගවත් වර්ධන අනුපාතයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පාලනය කරන ලද ශාඛා පුළුල් කිරීම ප්‍රධාන හේතු වන ඇති බවට අපි විශ්වාස කරන්නෙමු.

වර්ෂය තුළදී මඟ පෙන්වීම් සහ සහයෝගය ලබාදීම වෙනුවෙන් අපගේ රේඛීය අමාත්‍යාංශය වන, රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයට සහ මුදල් අමාත්‍යාංශයට ස්තූතිය ප්‍රකාශ කරමින් අවසන් කිරීමට අපේක්ෂා කරමි. එසේම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වර්ධනය උදෙසා ස්වකීය දායකත්වය ලබාදුන් අපගේ පාරිභෝගිකයන්, සේවකයන් මෙන්ම උපදේශකවරුන්ට කෘතඥතාවය ඵලකරන අතර 2017 වර්ෂය සාර්ථක වසරක් වේවායි අපේක්ෂා කරමු.

හේමක ඩී.එස්. අමරසූරිය
සභාපති

2017 මැයි 25 වන දින

සම කළමනාකාර අධ්‍යක්ෂකතුමාගේ සමාලෝචනය



"සමාගමේ ශේෂය රුපියල් බිලියන 176.8 දක්වා ලඟා වීමට රුපියල් බිලියන 9.8 කින් වර්ධනය විය. ජීවිත රක්ෂණ අරමුදලේ අගය, රුපියල් බිලියන 87 දක්වා ඉහළ යාමට රුපියල් බිලියන 9.4 කින් වර්ධනය වූ අතර එය 2015 වර්ෂයේ සිට 12.2% ක වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ ප්‍රමාණය ද රුපියල් බිලියන 16.5 ක් දක්වා ලඟා වීමට රුපියල් බිලියන 1.6 ක වැඩි වීමක් සිදු වූ අතර එය 10.73% ක වැඩි වීමකි".

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2016 වර්ෂය සඳහා වන ව්‍යාපාරික කටයුතු වල කාර්ය සාධනය සහ 2017 සඳහා වූ සැලසුම් සතුටින් ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූල්‍ය වර්ධනය මූලික වශයෙන් රඳා පවතින්නේ නව රක්ෂණ ඉල්ලීම්, ආයෝජන ආදායම් සහ පවත්නා ප්‍රතිපත්ති වල නවතාවය මත වේ. රටේ සුවිශාල ණය ගෙවීමේ අවශ්‍යතා සමඟ රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ආර්ථික කටයුතු පහත වැටීම නිසා රක්ෂණ සැලසුම් සඳහා රට තුළ නව ඉල්ලීම් ජනනය වීම 2016 වර්ෂය තුළදී ඉතා හෙමින් ඉදිරියට යන තත්ත්වයක පැවතුණි.

ඉහළ යන තරඟකාරිත්වය මගින්ද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතුවල වර්ධනය හකුළුවා ඇත. කෙසේ වුවද, කොටස් වෙළඳපොලේ පහළ යාමක් පැවතියද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ආයෝජන ප්‍රතිලාභ ඇති කරගෙන ඇති අතර ඉහළ වාරික තත්ත්වයක් පැවතියද දැනට සිටින පාරිභෝගිකයන් රඳවා තබා ගැනීමට ද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකි විය.

මෙහෙයුම් පරිසරය

ඉදි කිරීම සේවා සැපයීම් සහ වෙළඳ කටයුතු වැනි මහා පරිමාන ඉල්ලුමක් ඇති රක්ෂණ මෙහෙය වන්නා වූ රටතුළ ආර්ථික අංශ

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

2016 වර්ෂය තුළදී උදාසීනව පැවතුණි. රජය සහ පෞද්ගලික අංශය යන දෙඅංශයේ මහා පරිමාන යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට කරන ලද ආයෝජන ක්‍රීය තත්ත්වයේ පැවති අතර ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ වාරිකයට අයත්වන ප්‍රවාහනය, නෞකා ගමනාගමනය, ආනයන අපනයන වෙළඳාම හා සේවා කටයුතු පහත වැටීමට ද මෙම තත්ත්වය දායක වී ඇත. පහළ මට්ටමේ ආර්ථික ක්‍රියාකාරකම් ද නව ව්‍යාපෘති තුළ ආයෝජන අවස්ථා අඩුකරනු ලැබ ඇති අතර එය ණය මූල්‍යකරණයට බාධාවක් වී ඇත. මේ අතර, 2016 වර්ෂයේ දෙවෙනි කාර්තුව තුළ දී සෞඛ්‍ය, ආරක්ෂක සේවා වැනි ඇතැම් සේවාවන් මත එකතු කළ අග මත බදු (වැට්) පැනවීම සහ වැට් අනුපාත ඉහළ දැමීම රක්ෂණ කටයුතු සඳහා වන ඉල්ලුම හීනවීම අඛණ්ඩව සිදු විය. රුපියලේ අගය අඩුවීම නිසා වාහන ආනයනය සහ වෙළඳපොලේ නැවත විකිණීම අඩුවී ගෙනයාම, වාහන සඳහා වන ආනයන බදු සංශෝධන මෙන්ම වාහන ලීසිං කිරීමේ කටයුතුවලට සිදු කරන ලද වෙනස් කිරීම් රක්ෂණ ඉල්ලුමේ පහළ යාමට තවත් හේතුවක් විය. එකී කරුණු සමඟ, මේ සියලුම බාහිර සාධක සමස්ථ රක්ෂණ කර්මාන්තයේ වර්ධන අනුපාතය ස්වකීය වර්ධන වීමේ හැකියාවෙන් පහළ මට්ටම දක්වා මන්දගාමී තත්ත්වයට පත්විය.

පහළ වර්ධක අනුපාතයක් තිබියදීත් කර්මාන්තය තුළ තරඟකාරිත්වය, වෙන්කර තැබීමේ නියෝග බලාත්මක කිරීම නිසා, සීඝ්‍රයෙන් ඉහළ යන ලදි. සංයුක්ත රක්ෂකයන් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් වශයෙන් අංශවලට කණ්ඩනය වීම තුළින් තරඟකරුවන්ගේ ඉහළයාම පෙන්නුම් කර ඇත. වෙන්වීමේ තවත් ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට බලනොපාන ලද, පරිපාලන පිරිවැය දෙගුණ වීම නිසා රක්ෂණ කර්මාන්තය තුළ පිරිවැය ව්‍යුහයන්ගේ ඉහළ යාමක් සිදු වී ඇත.

තවත් වැදගත් වර්ධනය වීමක් වූයේ තදබල කාලගුණ විපර්යාසයන්ය. 2016 වර්ෂයේදී කර්මාන්තයේ පහළම තත්ත්වයට පීඩනය ඇතිවීමෙන් රක්ෂණ හිමිකම් නිෂ්ප්‍රයෝජනය කරන ලද ගංවතුර සහ නාය යාම්වලට රටට මුහුණ දීමට සිදුවිය. සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ස්වාභාවික ව්‍යසන සඳහා පමණක් රුපියල් මිලියන 600 ට වඩා වැඩි මුදලක් ගෙවන ලදි. කෙසේ වුවද, ශේණිගත කරන ලද ප්‍රතිරක්ෂණ සමාගම් සමඟ පරිපූර්ණ ප්‍රතිරක්ෂණ ආවරණය නිසා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පහළ තත්ත්වයට එය බල නොපාන ලදි.

කර්මාන්තයේ මිණුම් ප්‍රමිතියට සාපේක්ෂව කාර්ය සාධනය

කර්මාන්තයේ ප්‍රධාන දර්ශකයන්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කාර්යසාධනය මඟින් ප්‍රදර්ශනයකරනු ලැබ ඇති පරිදි, ස්වකීය තරඟකරුවන්ට සාපේක්ෂව 2016 වර්ෂය තුළ දී සමස්ථයක් වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යහපත් ලෙස කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, 2016 වර්ෂයේදී රක්ෂණ අංශයේ මුළු වත්කම් 10.9% කින් වර්ධනය වී ඇති බවට සහ එහි අගය රුපියල් බිලියන 503.1 බව තක්සේරු කරනු ලැබ ඇත. සංසන්දනාත්මකව, රක්ෂණ අංශය තුළ ක්‍රියාත්මක වන තනි විශාලතම වත්කම් දරන්නා වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පත් කරමින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 177 දක්වා 6% කින් වර්ධනය විය.

2016 වර්ෂය අවසන් වනවිට කර්මාන්තයේ දළ ලිඛිත වාරිකවල මුළු වටිනාකම රුපියල් බිලියන 140 වූ අතර පසුගිය වසරට සාපේක්ෂව 16% ක වර්ධනයකි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මුළු දළ ලිඛිත වාරික බිලියන 28 දක්වා වැඩිවූ අතර එය 13% ක වර්ධනයකි. ප්‍රධාන වශයෙන් සාමාන්‍ය රක්ෂණ අංශයේ වාරික ආදායම් විශේෂයෙන් සාමාන්‍ය රක්ෂණ වාරික වලින් 66% පමණ වග කියන්නා වූ මෝටර් වාහන රක්ෂණය, ඉහළ වර්ධනය මඟින් කර්මාන්තයේ දළ ලිඛිත වාරික ඉහළ නංවන ලදි.

රක්ෂණ කර්මාන්තයේ ආයෝජන ආදායම 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී රුපියල් බිලියන 40.7 දක්වා 30. 4% වැඩි විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වසරින් වසර ආයෝජන ආදායමේ 82% ක වර්ධනයක් වාර්තා කරනු ලැබූ අතර 2016 වර්ෂය අවසාන වනවිට සමාගමේ මුළු ආයෝජන ආදාම රුපියල් බිලියන 17.27 දක්වා ලඟා විය.

වසරින් වසර බදු පෙර කර්මාන්තයේ ලාභය 67.4% කින් ඉහළ ගිය අතර 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 186.07% ක බදු පෙර ලාභයක් වාර්තා කරන ලදි.

2016 වර්ෂය අවසන් වනවිට, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අංශවල කර්මාන්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය පිළිවෙලින් 317% සහ 192% විය. සංසන්දනාත්මක වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ජීවිත සහන මාස රක්ෂණ සඳහා අවම නියාමන මට්ටමට වඩා ඉහළ වූ ප්‍රාග්ධන ප්‍රමාණයක් අනුපාතය පිළිවෙලින් 427% සහ 186% පවත්වාගෙන ගොස් ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ROA සහ ROE, කර්මාන්තයේ සාමාන්‍ය පිළිවෙලින් ජීවිත 2.9% සහ ජීවිත නොවන 7.3% සහ ජීවිත 25% සහ ජීවිත නොවන 14.5% සාපේක්ෂව, 2016 වර්ෂයේදී 7% සහ 20.24% විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රතිරක්ෂණ පවරා දුන් අනුපාතය, ජීවිත නොවන 15.7% වූ කර්මාන්තයේ ප්‍රතිරක්ෂණ මට්ටමට සාපේක්ෂව 2016 වර්ෂයේදී 10% විය.

සම කළමනාකාර අධ්‍යක්ෂකතුමාගේ සමාලෝචනය ඉතිරි කොටස.

ඉහත දක්වා ඇති සන්සංදනය කිරීම තුළින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ස්ථාවර සහ ශක්තිය පෙන්නුම් කරන අතර එමගින් ජාතික රක්ෂකයා වශයෙන් රටේ සමස්ථ ආර්ථික ස්ථාවරභාවයට ද දායකත්වය ලබාදෙන බව විශ්වාස කරමි.

කාර්යසාධනය

2017 වර්ෂය සඳහා වන සියළුම ප්‍රධාන මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකි බව ඉතා සතුටින් ප්‍රකාශ කරමි. වැඩිදුර විස්තර සඳහා කරුණාකර මූල්‍ය සමාලෝචනය සහ ආයෝජන සමාලෝචනය බලන්න.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, ශාඛා 117 කින් හා සේවා මධ්‍යස්ථාන 15 කින් යුත් පවත්නා ගත ජාලයට නව ශාඛා හෝ සේවා ස්ථාන එකතු නොකරන ලදි. ප්‍රමාණාත්මක වර්ධනය සාක්ෂාත් කර ගන්නා ලද්දේ විකුණුම් සහ අළෙවිය තුළිනි. රටතුළ විශාලතම ජාලය වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පළපුරුදු සහ වෘත්තීය නියෝජිත ජාලය විසින් විකුණුම් කටයුතු මෙහෙයවන ලදි.

සමාගමේ ශේෂ පත්‍රය රුපියල් බිලියන 176.8 දක්වා බිලියන 9.8 කින් වර්ධනය විය. ජීවිත අරමුදලේ වටිනාකම රුපියල් බිලියන 87 දක්වා රුපියල් බිලියන 9.4 කින් ඉහළ ගිය අතර එය 2015 වර්ෂයේ සිට 12.2% ක වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ ප්‍රමාණය ද රුපියල් බිලියන 16.5 දක්වා රුපියල් බිලියන 1.6 ක් වැඩිවීමකි. එනම් 10.73% කින් වැඩිවිය.

රුපියල් බිලියන 151 කට වඩා වැඩි ආයෝජන ප්‍රමාණයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුව පවතින අතර එයින් ආසන්න වශයෙන් රුපියල් බිලියන 104 ක් ජීවිත රක්ෂණ ආයෝජන ප්‍රමාණය වේ. ප්‍රධාන වශයෙන් පරිපාලිත සමාගම් වන ලිට්රෝ ගෑස් ලංකා සහ ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා ලිමිටඩ් මගින් ලාභාංෂ ගෙවීම නිසා රුපියල් බිලියන 9.3 දක්වා ඉහළ ගිය ආදායමක් සහිතව වර්ෂය තුළ එක් වරක් පමණක් ඉපයුම් වන සාමාන්‍ය රක්ෂණ ප්‍රමාණයෙන් ලද ආයෝජන ආදායම විශාල ලෙස පෙන්නුම් කෙරිණි. ජීවිත රක්ෂණ ප්‍රමාණය මගින් රුපියල් බිලියන 7.9 ක ආයෝජන ආදායමක් උත්පාදනය කරන ලදි.

ජීවිත සහ සාමාන්‍ය මෙන්ම ආයෝජන ආදායමේ ඨඋජ වල එකතුව වන මුළු ආදායම රුපියල් බිලියන 42.1 දක්වා 35% කින් වැඩිවිය.

මේ අතර මුළු මෙහෙයුම් පිරිවැය වසරින් වසර රුපියල් බිලියන 8.6 දක්වා 32% කින් ඉහළ යන ලදි.

වර්ෂය තුළ දී සමාගම විසින් රුපියල් බිලියන 14 ක රක්ෂණ හිමිකම් ගෙවනු ලැබූ අතර ප්‍රසාද දීමනා වශයෙන් ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්ට රුපියල් බිලිය 6.2 ක් බෙදාහරිමින් රක්ෂණ කර්මාන්තය තුළ ඉහළම ජීවිත රක්ෂණ ප්‍රසාද දීමනා ලබා දෙන ලදි.

ජීවිත රක්ෂණ වලින් රුපියල් බිලියන 4.5 ක් සහ සාමාන්‍ය රක්ෂණ වලින් රුපියල් මිලියන 9.2 ක් සහිතව රුපියල් බිලියන 13.7 දක්වා බදුවලට පෙර රක්ෂණ සංස්ථාවේ මුළු මෙහෙයුම් ලාභය 186% කින් වැඩිවිය.

2016 වර්ෂය අවසානයේදී බදුවලට පසු මුළු ලාභය බිලියන 12.7 දක්වා වැඩිවූ අතර එයින් රුපියල් බිලියන 3.8 ක් ජීවිත රක්ෂණ මගින් ද රුපියල් බිලියන 8.9 ක් සාමාන්‍ය රක්ෂණ මගින් ද දායක වී ඇත.

සේවකයින්

2016 වර්ෂය අවසාන වන විට සියලුම ස්ථිර සේවක සංඛ්‍යාව වන සේවකයන් 2432 වෙනුවෙන් ප්‍රමාණවත් වැටුප් වර්ධක සහිත තුන් වසරක සාමුහික ගිවිසුම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2016 වර්ෂයේ දී නැවත අළුත් කරන ලදි. මෙය ශ්‍රී ලංකාව තුළ වෙනත් කිසිම රක්ෂණ සමාගමකට නොදෙවෙනි වූ ප්‍රතිලාභ රාශියකි. මෙම වෙනස්කම් නිසා, කළමනාකරණ පිරිවැය වාර්ෂිකව 25% කින් ඉහළ යනු ඇති බවට තක්සේරු කරමි. ඊට අමතරව, සියළුම කාර්ය මණ්ඩල සේවකයන් සහ අලෙවිකරණයේ සියලුම දෙනා වෙනුවෙන් පුහුණු කිරීම සහ වැඩි දියුණු කටයුතු සඳහා අප විසින් රුපියල් මිලියන 25 පමණ ආයෝජනය කර ඇත.

කාර්යසාධනය පාදක කරගත් සංස්කෘතියක් ස්ථාපනය කිරීම සඳහා, 2017 වර්ෂයේදී ක්‍රියාත්මක වීමට නියමිත සියලුම ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ කාර්ය මණ්ඩල සේවකයන් උදෙසා ඉලක්ක සහිත KPIs ද අප විසින් 2016 වර්ෂය තුළ දී වැඩි දියුණු කර ඇත. සංස්ථාව විසින් සපයන් ලබන ප්‍රතිලාභ KPIs මාර්ගෝපදේශය සහිතව දෙගුණ වී, 2017 වර්ෂයේදී සේවක ඵලදායිතාවය ඉහළ නංවනු ඇති බවට අපේක්ෂා කරමි.

2017 වර්ෂය සඳහා සැලසුම්

රක්ෂණ සමාගම් විසංගමනය වීමෙන් පසු, රක්ෂණ වෙළඳපොළ ඉතා ජනබහුල සහ අතිශයින් තරඟකාරී තත්ත්වයට පත්වී ඇත. වෙළඳපොළ තුල හිමි කොටස් ප්‍රමාණය පවත්වාගෙන යාමට සහ වර්ධන වේගය රඳවා තබා ගැනීමට සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට පැහැදිලි වර්ධන උපායමාර්ගයක් අවශ්‍ය වේ.

එම නිසා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකරණයේ මැදිහත්වීම සහිතව, 2018 සිට 2020 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වර්ධනයට මඟ පෙන්වීම සඳහා තුන් වසරක ආයතනික සැලැස්මක් සකස් කිරීම සඳහා දත්ත එකතු කිරීමේ ක්‍රියාවලියක් 2016 වර්ෂයේදී ආරම්භ කරන ලදි. 2017 වර්ෂය තුළ

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

මෙම උපාය මාර්ගික සැලැස්මේ කටයුතු අවසන් කර ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නෙමු.

මේ අතර සුවිශේෂී පාරිභෝගික කණ්ඩායම් උදෙසා රක්ෂණ ලබාදීමේ ජාලය සීඝ්‍රයෙන් පුළුල් කිරීම මගින් සහ පාරිභෝගිකකරණය කරන ලද, නව විශේෂ ලාභදායී රක්ෂණ සැලසුම් මාලාවක් හඳුන්වා දීම මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2017 වර්ෂයේදී වෙළඳපොල ප්‍රවේශවීමේ උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කරනු ඇත. 2017 මූල්‍ය වර්ෂය තුළ දී, රක්ෂණ පිරිනැමීමේ සියලුම වාර්ග ශක්තිමත් කරමින් දැනට පවත්නා ශාඛා අළුත්වැඩියා කිරීම සහ උසස් තත්ත්වයට පත් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වැඩ සටහන්, අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතරතුරේ, ශාඛා 117 වන දැනට පවත්නා ශාඛා ජාලයට ශාඛා 40 ක් එකතු කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී. රක්ෂණ සැලසුම් පිළිබඳ වඩා හොඳින් අධීක්ෂණය කිරීම සහ රක්ෂණ සැලසුම් ලබා දීමේ සේවාව සඳහා පහසුකම් සැලසීම සිදු කරන ගමන්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පාරිභෝගිකයන්ගේ පැමිණීම, ශාඛා ජාලය පුළුල් කිරීම මහත් සැලකිය යුතු ලෙස ඉහළ නංවනු ඇති බව අපගේ විශ්වාසයයි.

නව ආදායම් මාර්ග උත්පාදනය කරනු ලබන නව රක්ෂණ සැලසුම් මගින් 2017 වර්ෂය තුළ ව්‍යාපාර කටයුතු වර්ධනයට රුකුලක් වනු ඇත. කුවෙට් රාජ්‍ය පාලනය කරන පවුලට අයත් සමාගමක් වන, ගල්ෆ් ඉන්ෂුවරන්ස් සහ ප්‍රතිරක්ෂණ සමාගම සමඟ හවුලේ සංක්‍රමික සේවකයන් සඳහා, කුවෙට් රාජ්‍ය තුළ නියමු රක්ෂණ සැලැස්මක් 2016 වර්ෂයේදී අප විසින් ආරම්භ කරන ලදි. හදිසි අනතුරු, මරණය, ආබාධිත තත්ත්වයට පත්වීම, නෛතික කටයුතු සඳහා වන පිරිවැය සහ රටින් පිටුවහල් කිරීම වැනි අවස්ථාවකදී ශ්‍රී ලාංකික සංක්‍රමික සේවකයන් උදෙසා මෙම රක්ෂණ ක්‍රමය මගින් රක්ෂණාවරණයක් සපයනු ලබයි. නියමු ව්‍යාපෘතියක් වශයෙන් කුවේටය තුළ එකී ව්‍යාපෘතියට යහපත් පිළිගැනීමක් ලැබුණු බැවින්, 2017 වර්ෂය තුළ දී සියලුම මැද පෙරදිග රටවල් තුළ මෙම වැඩ සටහන ව්‍යාප්ත කිරීම සඳහා සැලසුම් සකස් කරමින් පවතී.

රජයේ මඟ පෙන්වීම යටතේ, රටේ ගොවිතැන් කටයුතු සිදුකරන ප්‍රජාවන්, ගුරුවරුන් සහ පාසැල් ළමුන් සඳහා විශේෂයෙන් සකස් කරන ලද රක්ෂණ සැලසුම් (Packages) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මේ වන විට සකස් කරමින් පවතී. 2017 වර්ෂයේදී මෙම නව රක්ෂණ ඔප්පු හඳුන්වා දීමට බලාපොරොත්තු වන්නෙමු. ශ්‍රී ලංකාවට සංචාරය සඳහා පැමිණෙන්නන්, මරණයකට, ආබාධිත තත්ත්වයට පත්වීම හෝ හදිසි සෞඛ්‍ය අවශ්‍යතාවයකදී සුරක්ෂිත බවට තහවුරු කිරීම සඳහා රට තුළට එන සංචාරකයන් සඳහා වන රක්ෂණ ඔප්පු සැලසුම් ක්‍රියාමාර්ග තුළ ඇති තවත් නව රක්ෂණ සැලසුමක් වේ. කර්මාන්තයේ හඳුනාගත් කණ්ඩායම් සඳහා, ජීවිත සහ සාමාන්‍ය කාණ්ඩ යටතේ සමූහ රක්ෂණ සැළසුම් ද අප විසින් සකස් කරමින් පවතී. මෙම නව සැලසුම් මගින් රටේ රක්ෂණ වෙළඳපොළ සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වෙළඳපොළ ප්‍රමාණය අනපේක්ෂිත ලෙස පුළුල් කරනු ඇති බව විශ්වාස කරමි.

අනාගතයේදී රක්ෂණ කර්මාන්තය තුළ තරඟකාරී ලාභදායක තත්ත්වයන් උත්පාදනය කිරීමේදී තාක්ෂණය ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ඇති බව විශ්වාස කරමි. එමනිසා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙනුවෙන් වෘත්තීමය, තාක්ෂණික ආධාරක පද්ධතියක් ලබා ගැනීම උපායමාර්ගිකව වැදගත් වේ. සැලසුම් කිරීම, පරිපාලනය සහ මෙහෙයුම් කාර්යයන් සඳහා සහයෝගය දැක්වීමට නවීන පද්ධතියක් රුපියල් මිලියන 120 ආයෝජනය කර ඇත. කෙසේ වුවද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා ඉතා පරිපූර්ණ තාක්ෂණික පිළියමක් සැලසුම් කරමින් සිටින අතර 2017 වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අඛණ්ඩව වර්ධනයක් ලබා ගන්නා බවට නිසැකවම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයට සහ මුදල් අමාත්‍යාංශයට, වර්ෂය තුළදී ලබා දුන් සහයෝගය සහ මඟ පෙන්වීම වෙනුවෙන් මාගේ ස්තූතිය පුද කරමි. එසේම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සියලුම කාර්ය මණ්ඩලයට සහ අපගේ අලෙවි බලකායට, අඛණ්ඩ කැපවීම හා වෙහෙසී වැඩ කිරීම වෙනුවෙන් මාගේ ස්තූතිය පිරිනමන අතර අපගේ සියලුම පාරිභෝගික බවතුන්ට ස්වකීය අඛණ්ඩ ලැදියාව සහ දායකත්වය වෙනුවෙන් නිහතමානී කෘතඥතාවය එල කරමි. නව මූල්‍ය වර්ෂය තුළ වඩා හොඳ සේවාවක් ලබා දීමට බලාපොරොත්තු වෙමි.



ටී.එම්.ආර්. බන්ස ජයා
සම කළමනාකාර අධ්‍යක්ෂ

2017 මැයි මස 25 වන දින


මූල්‍ය සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අගය එකතු කරන ලද ප්‍රකාශය

අගය එකතු කිරීමේ ප්‍රකාශය මගින් කාර්ය මණ්ඩල සේවකයන්, අතරමැදියන්, රජය, ජීවිත රක්ෂණ ඔප්පු හිමියන් මෙන්ම ප්‍රසාරණය සහ වර්ධනය අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අගය ජනනය වීම බෙදා හරිනු ලැබ ඇත්තේ කෙසේ ද යන්න අගය එකතු කරන ලද ප්‍රකාශය මගින් පෙන්නුම් කෙරේ.

	2016 රු. මිලියන	2015 රු. මිලියන	2014 රු. මිලියන	2013 රු. මිලියන	2012 රු. මිලියන
ශුද්ධ ඉපයූ වාරික	24,013	20,393	17,805	17,805	16,768
ආයෝජන සහ අනෙකුත් ආදායම්	18,094	10,763	11,497	10,176	8,875
	42,107	31,156	29,302	27,981	25,643
අඩුකළා					
ශුද්ධ හිමිකම් හා ප්‍රතිලාභ	14,477	12,933	11,939	9,804	10,283
බාහිර සේවා සඳහා පිරිවැය	2,838	1,544	3,527	2,735	2,005
අගය එකතු කිරීම	24,792	16,679	13,836	15,442	13,355
එකතුකළ අගය බෙදා හැරීම					
කාර්යමණ්ඩල සේවකයන්					
වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ	3,270	3,062	2,335	2,007	1,957
අතරමැදියන් සඳහා					
පිරිවැය අත්කර ගැනීම	2,195	1,587	1,613	1,554	1,608
රජය සඳහා					
ආදායම් බදු	1,050	1,381	1,116	1,700	1,627
ජීවිත රක්ෂණ ඔප්පු හිමියන් සඳහා					
ජීවිත රක්ෂණ අරමුදලේ ඉහළයාම	5,198	6,840	5,376	5,109	3,733
කොටස් හිමියා					
ගෙවන ලද ලාභාංෂ	10,011	2,003	1,002	1,200	-
ප්‍රසාරණය හා වර්ධනය					
අවප්‍රමාණය වීම වශයෙන් රඳවා තබා ගැනීම	338	368	138	418	193
සංචිත වශයෙන් රඳවා ගැනීම	2,730	1,436	2,255	3,454	4,235
	24,792	**16,679**	**13,836**	**15,442**	**13,353**

ආදායම බෙදීම 2016



කාර්ය මණ්ඩල සේවකයන්	14%
අතරමැදියන්	9%
රජය	4%
ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්	21%
ප්‍රසාරණය හා වර්ධනය	11%
කොටස් හිමියන්	41%

ආදායම බෙදීම 2015



කාර්ය මණ්ඩල සේවකයන්	19%
අතරමැදියන්	10%
රජය	8%
ජීවිත රක්ෂණ ඔප්පු හිමියන්	42%
ප්‍රසාරණය හා වර්ධනය	9%
කොටස් හිමියන්	12%

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

2016 වර්ෂය තුළ, රුපියල් බිලියන 87.35 ක ඉහළම ජීවිත රක්ෂණ අරමුදල (2015 වර්ෂයේ රුපියල් බිලියන 77.85) සහිතව කොටස් හිමියන්ගේ අරමුදල රුපියල් බිලියන 62.9 (2015 වර්ෂයේදී රුපියල් බිලියන 63.67) දක්වා පැමිණෙමින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වත්කම් ප්‍රමාණය බිලියන 176.8 (රුපියල් බිලියන 166.94 - 2015) දක්වා වැඩි වී ඇත.

2016 වර්ෂය තුළ, පසු ගිය වසරේ රුපියල් බිලියන 31.15 ට සාපේක්ෂව මුළු ආදායම රුපියල් බිලියන 42.11 ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සම්පූර්ණ කර ගන්නා ලදි. පසුගිය වසර තුළ වාර්තා කරන ලද රුපියල් බිලියන 24.52 ක් වූ දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව සංයුක්ත දළ ලිඛිත වාරිකය රුපියල් බිලියන 27.61 වේ.

මෙහෙයුම් හා පරිපාලන වියදම් රුපියල් බිලියන 4.97 සිට රුපියල් බිලියන 6.44 දක්වා ඉහළ යන ලදි. කෙසේ වුවද, 2015 වර්ෂයේ රුපියල් බිලියන 4.82 කට සාපේක්ෂව 2016 වර්ෂයේදී, රුපියල් බිලියන 13.79 දක්වා ලඟවූ, බදු පෙර ලාභය තුළ රුපියල් බිලියන 8.97 ක පැහැදිලි වැඩිවීමක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වාර්තා කරන ලදි.

2015 වර්ෂයේ රුපියල් බිලියන 3.4 ට සාපේක්ෂව 2016 වර්ෂයේදී බදු වලට පසු වාර්තාගත වූ සංයුක්ත ශුද්ධ ලාභය රුපියල් බිලියන 12.7 කි.

නුබුන්වත් අනුපාතය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, 2015 සහ 2016 මූල්‍ය වර්ෂ තුළ අවශ්‍ය නුබුන්වත් සීමා/ අවදානම් පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය පවත්වා ගෙන ගොස් ඇත. ඒ අනුව, 2016 වර්ෂය සඳහා, ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් 427% ක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් පවත්වාගෙන ඇති අතර සාමාන්‍ය රක්ෂණ කටයුතු මගින් 186% ක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් වාර්තා කරන ලදි. 402% ක ජීවිත රක්ෂණ ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් සහ 213% ක සාමාන්‍ය රක්ෂණ ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් 2015 වර්ෂය තුළදී වාර්තා කරන ලදි.


ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ඒකාබද්ධ ව්‍යාපාරික කටයුතුවල කාර්ය සාධනය

සමාගමේ ඒකාබද්ධ දළ ලිඛිත වාරිකය, 2012 වර්ෂයට සාපේක්ෂව 37% වර්ධනයක් වාර්තා කරමින්, පසුගිය වර්ෂ පහක කාලය තුළ රුපියල් මිලියන 20,173 සිට රුපියල් මිලියන 27,614 දක්වා වැඩිවී ඇත. 2016 වර්ෂය තුළ ආයෝජන සහ අනෙකුත්, ආදායම් වල වට්නාකම පසුගිය වසරේ රුපියල් මිලියන 10,763 ට සාපේක්ෂව, රුපියල් මිලියන 18,094 වන අතර එය 68.11% ක වැඩි වීමකි. 2016 වර්ෂයේදී බදු පසු ලාභය තුළ රුපියල් මිලියන 12,741 ක් සමාගම විසින් වාර්තා කර ඇත.


	2016 රු. 000	2015 රු. 000	2014 රු. 000	2013 රු. 000	2012 රු. 000
ආදායම	42,107,761	31,156,766	29,301,980	27,980,852	25,644,316
දළ ලිඛිත වාරිකය	27,614,433	24,520,012	20,665,985	21,350,869	20,172,623
ශුද්ධ ඉපයූ වාරිකය	24,013,294	20,393,474	17,804,905	17,805,056	16,768,442
ලාභ, අලාභ සහ වියදම්	(21,870,191)	(21,360,285)	(18,928,978)	(16,467,961)	(15,625,259)
ආයෝජන සහ අනෙකුත් වියදම්	18,094,467	10,763,292	11,497,075	10,175,796	8,875,874
පොළී වියදම්	(13)	(58)	(35)	(138)	(223)
මෙහෙයුම් සහ පරිපාලන වියදම්	(6,446,588)	(4,975,647)	(5,999,828)	(5,158,022)	(4,155,575)
බදු පෙර ලාභය	13,790,968	4,820,776	4,373,139	6,354,869	5,863,255
බදු අයකිරීම්	(1,049,651)	(1,381,420)	(1,116,126)	(1,700,039)	(1,627,413)
බදු පසු ලාභය	12,741,317	3,439,356	3,257,013	4,655,174	4,235,842

මූල්‍ය සමාලෝචනය
ඉතිරි කොටස.

ඒකාබද්ධ දළ ලිඛිත වාරිකය



බදු වලට පසු ඒකාබද්ධ ලාභය



සංයුක්ත බදු ගෙවීම්

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2016 වර්ෂය තුළ බදු වශයෙන් රුපියල් බිලියන 2.878 (රුපියල් මිලියන 4,190 - 2015) ශ්‍රී ලංකා රජය වෙත දායක කර ඇත. මේ බදු පහත පරිදිය.

	2016 රු. 000	2015 රු. 000	2014 රු. 000	2013 රු. 000	2012 රු. 000
එකතුකළ අගය මත බද්ද	1,410,186	1,205,546	1,061,272	1,186,288	1,121,183
ජාතිය ගොඩ නැගීමේ බද්ද	337,820	62,108	252,955	267,011	258,914
මාර්ග ආරක්ෂණ අරමුදල	10,736	2,557	9,425	9,751	10,095
ආර්ථික සේවා ගාස්තු	53,817	-	-	-	-
මුද්දර ගාස්තු	16,006	3,087	11,487	8,186	8,175
ආදායම් බදු	1,049,650	1,381,420	1,116,126	1,700,039	1,627,413
ඉහළ ලාභ බද්ද	-	1,415,421	-	-	-
එකතුව	**2,878,215**	**4,190,660**	**2,451,265**	**3,171,275**	**3,025,780**

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

කාර්ය සාධන සමාලෝචනය - සාමාන්‍ය රක්ෂණය

2016 වර්ෂය තුළ සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කාර්ය සාධනය සහ අනාගත දැක්ම


පසුගිය වසරේ 20.49% ට සාපේක්ෂවූ සාමාන්‍ය රක්ෂණ වෙළඳපොල තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වෙළඳපොල කොටස 2016 වර්ෂය අවසාන වනවිට 20.85% ක් විය. මිලයනය සහ විචක්ෂණශීලීව රක්ෂණ කටයුතුවල නිරත වීම කෙරෙහි වර්ධනීය පීඩනයක් සිදු කරන ලද සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ තුළ තියුණු තරඟයක් 2016 මූල්‍ය වර්ෂය තුළ දී පෙන්නුම් කරනු ලැබ ඇත. එසේ තිබිය දීත්, පසුගිය වසරට සාපේක්ෂව මෝටර් වාහන ව්‍යාපාර කටයුතුවලදී 16% ක වර්ධනයක් හා මෝටර් වාහන නොවන වර්ගයේ කටයුතුවලදී ආසන්න වශයෙන් 5% ක වර්ධනයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වාර්තා කරනු ලැබ ඇත. සාමාන්‍ය රක්ෂණ කටයුතු වල 2015 වර්ෂයේදී 11.89% ක් වූ වර්ධනය 2016 වර්ෂය තුළ දී රුපියල් බිලියන 15.7 වාරික ප්‍රමාණයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වාර්තා කරන ලදි.

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කාර්ය සාධනය


සාමාන්‍ය රක්ෂණ කටයුතුවල දළ ලිඛිත වාරික ප්‍රමාණය පසුගිය වසර පහක කාලය තුළ රුපියල් මිලියන 12,803 සිට රුපියල් මිලියන 15,721 දක්වා වැඩිවී ඇති අතර එය 2012 වර්ෂයට සාපේක්ෂව 22.8% ක වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ කටයුතු මගින් පිළිවෙලින් 2016 සහ 2015 වර්ෂ වලදී ආයෝජන සහ වෙනත් ආදායම රු. මිලියන 9.322 සහ රු. මිලියන 2,473 වාර්තා කරන ලදි. සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා බදු පසු පවතින වාර්ෂික ලාභය රුපියල් මිලියන 8,926 කි.

	2016 රු. 000	2015 රු. 000	2014 රු. 000	2013 රු. 000	2012 රු. 000
දළ ලිඛිත වාරිකය	15,720,793	14,049,933	12,544,828	12,953,151	12,803,491
ශුද්ධ ඉපයූ වාරික	12,333,957	10,086,240	9,820,149	9,504,974	9,487,217
ශුද්ධ හිමිකම් දැරීම	(8,605,127)	(6,628,963)	(6,205,796)	(4,934,075)	(6,194,011)
මෙහෙයුම් හා පරිපාලන වියදම්	(3,815,992)	(2,877,500)	(3,977,357)	(3,351,580)	(2,528,520)
ආයෝජන සහ අනෙකුත් ආදායම්	9,322,419	2,472,764	2,224,732	2,516,798	2,064,835
පොළී වියදම	(3)	(1)	(14)	(51)	(110)
බදු පෙර ලාභය	9,235,252	3,052,539	1,861,713	3,736,068	2,829,411
බදුකරණය	(308,911)	(538,488)	(217,101)	(803,033)	(900,971)
බදු වලට පසු ලාභය	8,926,341	2,514,051	1,644,613	2,933,034	1,928,440

දළ ලිඛිත වාරිකය - සාමාන්‍ය රක්ෂණ කටයුතු



බදු පසු ලාභය - සාමාන්‍ය රක්ෂණ කටයුතු




මූල්‍ය සමාලෝචනය
ඉතිරි කොටස.

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල ස්ථාවරභාවය

R11 පනතේ 26(1) වගන්තිය අනුව, ජීවිත සහ සාමාන්‍ය යන දෙඅංශයේ ව්‍යාපාරික කටයුතු සඳහා යහපත් නුබුන්වත් අවදානම් පදනම් කර ගත් ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් රක්ෂකයන් විසින් පවත්වා ගෙන යාම අවශ්‍ය වේ. පහත දක්වා ඇති පරිදි පසුගිය වසර 5 ක කාලය තුළදී සාමාන්‍ය රක්ෂණ ආවරණ සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් යහපත් නුබුන්වත් සීමාවන්/අවදානම් පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාත පවත්වාගෙන යනු ලැබ ඇත.

	2016 රු. 000	2015 රු. 000	2014 රු. 000	2013 රු. 000	2012 රු. 000
ශුද්ධ වත්කම් අගය	46,609,083	44,581,028	45,697,972	38,909,641	30,748,097
නුබුන්වත් අනුපාතය	-	3.93	3.80	4.30	3.25
ප්‍රාග්ධන ප්‍රමාණවත් බව අනුපාතය	186%	213%	-	-	-

ශුද්ධ වත්කම් අගය - සාමාන්‍ය රක්ෂණය



සාමාන්‍ය රක්ෂණ කටයුතුවල අනුමත වත්කම්

	2016 රු. මිලියන	2015 රු. මිලියන	2014 රු. මිලියන	2013 රු. මිලියන	2012 රු. මිලියන
තාක්ෂණික සංචිත සඳහා අනුමත වත්කම්	21,417	23,708	16,808	22,760	20,720
තාක්ෂණික සංචිත අගයන්	14,641	13,581	11,929	11,881	12,570
අතිරික්ත තාක්ෂණික සංචිතවල අනුමත වත්කම්	6,776	10,127	4,879	10,879	8,150

2017 වර්ෂය සඳහා සැලසුම්

හැකියාවක් ඇති වාහන මිලදී ගන්නන් හෝ ආකර්ෂණය යන පහළ තත්ත්වයට පත් කරන පවත්නා ක්‍රීසිං ක්‍රියා මාර්ග නිසා මෝටර් වාහන රක්ෂණ කටයුතු වලට අභියෝගාත්මක වසරකට මුහුණ දීමට සිදුවනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පවත්නා ව්‍යාපාර කටයුතුවල වෙළඳපොළ කොටස උදෙසා සියලු රක්ෂකයන් තරඟකාරීව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිල තරඟය ඉතා තියුණු තත්ත්වයට පත්විය හැකිය. ඊට ප්‍රතිචාර වශයෙන්, ලාභදායි බව සමථයකට පත්කර ගැනීමකින් තොරව නව පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගැනීම සහ දැනට සිටින පාරිභෝගිකයන් රඳවා තබා ගැනීමට අප දරනු ලබන ප්‍රයත්නයේ, කොටසක් වශයෙන් සේවා ප්‍රමිතිය උසස් තත්ත්වයට පත් කිරීම සඳහා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ස්වකීය අභ්‍යන්තර ක්‍රියාවලීන් වැඩි දියුණු කරමින් සිටියි.

මෝටර් රථ නොවන ව්‍යාපාරික කටයුතු යම්තාක් දුරට සැලකිල්ලට ගැනීමේදී ඍණිගත කරන ලද රක්ෂකයන් ගේ සහයෝගය ඉහළ වටිනාකම් ඇති ගිණුම් සඳහා යොදාගනු ඇත. ලිඛිත සිල්ලර වෙළඳ කටයුතු කෙරෙහි අතිරේක අවධානයක් යොමු කරනු ඇති අතර 2017 වර්ෂය තුළදී දීපව්‍යාප්තව නව ශාඛා කීපයක් විවෘත කිරීම තුළින් මේ සඳහා පහසුකම් සලසනු ඇත.

සමස්ථයක් වශයෙන්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2017 වර්ෂය සඳහා සුවිශේෂී ඉහළ වර්ධන සීමාවක් ඉලක්කගත කරමින් සිටියි. මිළ කෙරෙහි ඇති තරඟකාරීත්වය පහළ දැමීම සඳහා සහ වටිනාකම් චිකතු කරන ලද සේවාවන් කෙරෙහි වඩාත් අවධානය යොමු කිරීම සඳහා නව ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ උපායමාර්ගික සම්බන්ධතා සහ සේවා තත්ත්වය වැඩි දියුණු කරන්නාවූ කටයුතු ක්‍රියාමාර්ග ගත කර ඇත. 2017 වර්ෂය තුළ දී යහපත් සැබෑ තත්ත්වය කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර ලාභදායීතාවය කෙරෙහි මෙහෙය වීම උදෙසා සාමාන්‍ය රක්ෂණ කටයුතුවල සංකලනයක් නිර්නය කරනු ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

කාර්ය සාධන සමාලෝචනය - ජීවිත රක්ෂණ

2016 වර්ෂයේ ජීවිත රක්ෂණ කටයුතුවල කාර්ය සාධනය සහ අනාගත දැක්ම

2016 වර්ෂය තුළදී, ජීවිත රක්ෂණ කටයුතුවල දළ ලිඛිත වාරික රු. මිලියන 10,470 සිට රුපියල් මිලියන 11,894 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2016 වර්ෂයේ සිට 13.5% වර්ධනයකි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, 2015 වර්ෂයේදී රු. මිලියන 77,858 සිට රු. මිලියන 87,357 දක්වා පවත්නා වර්ෂයේදී කර්මාන්තය තුළ ඉහළම ජීවිත රක්ෂණ අරමුදල වාර්තා කරන ලදි. 2016 වර්ෂයේ ජීවිත රක්ෂණ අරමුදලේ වැඩිවූ අගය කලින් වසරට සාපේක්ෂව 12.2% කි.


වසර 5 ක කාලය තුළ ජීවිත රක්ෂණ කටයුතුවල කාර්ය සාධනය

ජීවිත රක්ෂණවල දළ ලිඛිත වාරික, 2012 වර්ෂයට සාපේක්ෂව පසුගිය වසර පහක කාල සීමාව තුළ රුපියල් මිලියන 7,369 සිට රුපියල් මිලියන 11,893 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 61.4% ක වර්ධනයකි. ජීවිත රක්ෂණ කටයුතු මගින් පිළිවෙලින් 2016 සහ 2015 වර්ෂවලදී ආයෝජන සහ අනෙකුත් ආදායම් රුපියල් මිලියන 8,772 සහ රු. මිලියන 8,290 වාර්තා ගත කර ඇත.


	2016 රු. 000	2015 රු. 000	2014 රු. 000	2013 රු. 000	2012 රු. 000
දළ ලිඛිත වාරිකය	11,893,640	10,470,079	8,121,159	8,397,718	7,369,029
ශුද්ධ ලිඛිත වාරිකය	11,679,336	10,307,235	7,984,758	8,300,082	7,281,225
ආයෝජන හා අනෙකුත් ආදායම්	8,772,049	8,290,528	9,272,341	7,659,011	6,811,040
හිමිකම් දැරීම	(5,871,667)	(6,304,648)	(5,733,524)	(4,870,410)	(4,089,231)
කොමිස් වියදම්	(1,560,526)	(1,240,955)	(1,127,919)	(1,053,299)	(1,088,644)
කළමනාකරණ වියදම්	(3,265,087)	(2,443,685)	(2,507,813)	(2,307,020)	(2,147,076)
බදුපෙර ජීවිත රක්ෂණ අරමුදලේ ඉහළ යාම	9,754,105	8,608,479	7,887,842	7,728,364	6,767,314
බදුකරණය	(740,739)	(842,932)	(899,025)	(897,006)	(726,442)
ජීවිත රක්ෂණ අරමුදලේ ඉහළයාම	9,013,366	7,765,547	6,988,816	6,831,689	6,040,872

රක්ෂණ ඔප්පු හිමියන්ට ආරෝපිත කළ හැකි ලාභය ඇතුලුව බදුකරණයට පෙර සහ පසු ලාභය ගණනය කරන ලදි.

දළ ලිඛිත වාරිකය - ජීවිත රක්ෂණ



ලාභදායී භාවය - ජීවිත රක්ෂණ



මූල්‍ය සමාලෝචනය
ඉතිරි කොටස.

ජීවිත රක්ෂණ කටයුතුවල ස්ථාවරභාවය


ජීවිත රක්ෂණ කටයුතු මගින්, 2016 වර්ෂයේදී 427% ක් අවදානම් පාදක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් සහ 2015 වර්ෂය තුළදී 402% ක ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතයක් වාර්තා කරන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, 2015 වර්ෂයේ රු. මිලියන 77,858 සාපේක්ෂව 2016 වර්ෂයේදී රක්ෂණ කර්මාන්තයේ ඉහළම ජීවිත රක්ෂණ අරමුදල වන රුපියල් මිලියන 87,357 ක මුදල වාර්තා කරන ලදි.

	2016 රු. 000	2015 රු. 000	2014 රු. 000	2013 රු. 000	2012 රු. 000
ජීවිත අරමුදල	87,357,385	77,858,383	74,706,065	66,511,606	60,084,899
ශුද්ධ වත්කම් අගය	16,425,367	19,203,590	18,625,842	14,373,045	17,547,244
නුබුන්වත් අනුපාතය	-	11.56	13.22	11.48	10.14
ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය	427%	402%	-	-	-

ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවල අනුමත කරන ලද වත්කම්

ජීවිත රක්ෂණ අරමුදලේ ඉහළ යාම



2017 වර්ෂය සඳහා සැලසුම්

සැලසුම්ගත ශාඛා ව්‍යාප්තිය මගින්, පාරිභෝගිකයන් ගේ ප්‍රවේශවීමේ හැකියාම ඉහළ නංවනු ඇති අතර දැනට සිටින සහ හැකියාවන් ඇති පාරිභෝගිකයන් උදෙසා වන පාරිභෝගික සේවා උසස් තත්ත්වයට පත් කරනු ඇත. 2017 වර්ෂය තුළදී සමාගමේ වෙළඳ පොළ ප්‍රවේශය ශක්තිමත් කිරීම සඳහා මෙමගින් සමාගමට හැකියාව ලබාදෙනු ඇත.

නවීකරණය කරන ලද ජීවිත රක්ෂණය ප්‍රමුඛ කරගත් පද්ධතිය තුළින් සමස්ථ, පාරිභෝගිකයන්ට වඩා හොඳ අත්දැකීමක් හා වටිනාකම් ලබාදීම සඳහා තරඟකාරිත්වය සහ පිරිවැය කාර්යක්ෂමතා ඉහළ නංවන්නාවූ සුවිශේෂී ඵලදායිතාවයක් සහ අගය එකතු කිරීමක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ආයෝජන සමාලෝචනය

ආයෝජන උපාය මාර්ගය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන උපාය මාර්ගය, සුරක්ෂිතතාවය, ආදායම සහ වත්කම් වර්ධනය අතර ප්‍රසස්ථ සමතුලිතතාවයක් අත්පත්කර ගැනීම සඳහා විශේෂයෙන් සැලසුම් කරනු ලබයි. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අදාල රෙගුලාසිවලට අනුකූල වෙමින් විචක්ෂණ ආයෝජන කළමනාකරණ මූලිකාංග තුළින්, අරමුදලේ වගකීම් සපුරාලීම සඳහා උපායමාර්ගය ඉලක්ක ගත කරනු ලබයි.


ආයෝජන කමිටුව

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන ප්‍රමාණය කළමනාකරණය කිරීම, උපායමාර්ගික වත්කම් වෙන් කිරීම සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම, වත්කම් හා බැරකම් සථලදායී ලෙස ගැලපීම සහ උපායශීලී ආයෝජන අවස්ථා ප්‍රයෝජනයට ගැනීම ඇතුලුව, වගකීමේ පරාශයක් ආයෝජන කමිටුව සතුවේ. CFA ආයතනයේ වත්කම් කළමනාකරුවන්ගේ නීති මාලාවට අනුකූලව මෙම කමිටුව කටයුතු කරයි.


වත්කම් බෙදා හැරීම

ජීවිත අරමුදල:

ජීවිත අරමුදල/අරමුදලේ සංයුතිය




ආයෝජනය කළ හැකි වත්කම්වල වර්ධනය




සාමාන්‍ය අරමුදල:

සාමාන්‍ය අරමුදල අරමුදලේ සංයුතිය



ආයෝජනය කළ හැකි වත්කම්වල වර්ධනය



වත්කම් - වගකීම් ගැලපුම

ජීවිත අරමුදල:

සාපේක්ෂව වඩා අඩු වර්ධනයක් සහිත ස්ථාවර ආදායම් සුරැකුම් වෙළඳපොළ පසුබිමක් තුළ, ජීවිත අරමුදලේ කල් පිරීමේ ව්‍යුහය ගැලපීම අභියෝගාත්මක කාර්යයකි. කෙසේ වුවද, වර්ෂය තුළ දී නිකුත් කරන ලද බදුවලින් නිදහස් ලැයිස්තුගත කරන ලද සැලකිය යුතු ණයකර ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකට මෙම අවදානම අවමකර ගැනීමට උපකාරී විය. ප්‍රදාන කරන ලද බදු ඉවත් කිරීම් ප්‍රතිලාභයේ ඵල ලබා ගැනීම සඳහා ආයෝජකයන් ඉහත ඉක්මන් වූ නිසා බොහෝ නිකුත් කිරීම් වලට අතිශයින් ඉහළ දායකත්වයක්

ආයෝජන සමාලෝචනය
ඉතිරි කොටස.

දෙන ලදි. සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වසර 3 සිට 10 දක්වා කල් පිරීම් පරාශයක් සහිතව ලැයිස්තුගත ණයකර වල රුපියල් බිලියන 5.5 ක් ආයෝජනය කරන ලදි.

මෙම මාර්ගය හරහා අරමුදල් තරකර ගැනීමට බොහෝ වෙළඳ සමාගම් තීරණය කිරීමත් සමඟ, ඉදිරි වර්ෂය තුළදී, වැඩි වශයෙන් ලැයිස්තුගත ණයකර නිකුත් කරනු ලැබීමේ ඉහළ හැකියාවක් පවතී.

තවද, වසර 19 ක් දක්වා දීර්ඝවන කල්පිරීම් සහිතව භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ ආයෝජන වර්ෂය තුළදී රුපියල් බිලියන 11.0 විය. 2017 වර්ෂය තුළදී දීර්ඝකාලීන බැඳුම්කරවල ආයෝජනය කිරීමට මෙන්ම ජීවිත අරමුදලේ වත්කම් - වගකීම් නොගැලපීම අඩු කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තවදුරටත් අපේක්ෂා කරයි.

සාමාන්‍ය අරමුදල

ජීවිත අරමුදලේ වත්කම් මෙන් නොව, සාමාන්‍ය රක්ෂණ අරමුදලේ බැඳීම් ස්වභාවයෙන්ම කෙටිකාලීන වන බැවින් අරමුදලේ ප්‍රධාන කොටස් කෙටිකාලීන වත්කම්වල ආයෝජනය කරන ලදි.


ආයෝජන කාර්ය සාධනය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින්, නුවමනා අවදානම් මඟ හරිමින්, විචක්ෂණශීලී සහ සක්‍රීය ආයෝජන කළමනාකරණ යාන්ත්‍රණ යටතේ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ අරමුදල් ද්විත්වය උදෙසා 2016 වර්ෂය තුළදී යහපත් ප්‍රතිලාභ ලඟ තබාගන්නා ලදි. පොලී අනුපාතය පහත මට්ටමක පවතින වටපිටාවක් තුළ මෙය පැසසිය යුතු කාර්ය සාධනයකි.

වර්ෂය තුළදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මුළු ආයෝජන ආදායම් වන රුපියල් බිලියන 17.3 ක් වාර්තා කරන ලදි.

ජීවිත අරමුදල:


ආයෝජන ආදායම



2016 වර්ෂයේදී. රුපියල් බිලියන 7.95 ක යහපත් ආයෝජන ආදායමක් ජීවිත අරමුදල විසින් වාර්තා කරනු ලැබූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 4.7% ක වර්ධනයකි.

සාමාන්‍ය අරමුදල:

ආයෝජන ආදායම



2016 වර්ෂයේදී, සාමාන්‍ය අරමුදල විසින් රුපියල් බිලියන 8.72 ක ආයෝජන ආදායම් වාර්තා කරනු ලැබූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 380.3% සුවිසාල වර්ධනයකි. කෙසේ වුවද, ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් සහ ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවේට්) ලිමිටඩ් වෙතින් ලැබුණු රුපියල් මිලියන 6,750 ක අති විශේෂ ලාභාංෂ ආදායම මෙයට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ආයෝජන සාරාංශය

සමාගම	2016 රු. 000	2015 රු. 000	2014 රු. 000	2013 රු. 000	2012 රු. 000
පිරිවැයේ දී					
ලැයිස්තුගත පරිපාලක සමාගම්	2,925,567	2,925,567	2,925,567	2,925,567	2,925,567
ලැයිස්තුගත නොකරන ලද පරිපාලක සමාගම්	18,160,337	18,160,337	18,160,337	14,660,337	13,790,250
ශුද්ධ වත්කම් අගයේදී					
ආශ්‍රිත සමාගම්	138,448	128,090	122,425	105,727	71,697
විකිණීම සඳහා තබා ඇති					
ලැයිස්තුගත කොටස්	30,914,016	31,894,168	35,711,339	24,798,653	22,423,654
ලැයිස්තුගත නොකළ කොටස්	47,972	20,754	20,832	18,753	18,884
ඒකක භාර	964,320	1,043,587	1,146,236	1,426,408	1,437,209
ලැයිස්තුගත ණයකර	19,566,031	15,228,277	11,880,406	7,190,339	3,424,049
භාණ්ඩාගාර බිල්පත්	-	-	-	483,700	-
භාණ්ඩාගාර බැඳුම්කර	4,062,844	5,119,315	4,387,187	5,418,642	11,144,843
සාධාරණ අගය තුළින් ලාභ හෝ අලාභ					
ලැයිස්තුගත කොටස්	5,320,606	6,756,655	5,538,348	5,956,726	10,953,886
කල් පිරීමට තබා ඇති					
භාණ්ඩාගාර බිල්පත්	-	488,795	487,576	-	969,775
භාණ්ඩාගාර බැඳුම්කර	49,313,553	38,475,744	25,589,291	19,324,293	14,402,918
ණය සහ අයකර ගැනීම්					
ලැයිස්තුගත නොකළ ණයකර	500,534	541,717	1,367,205	1,890,781	2,274,245
වාරික තැන්පතු	12,336,280	17,309,842	27,945,442	22,864,910	16,290,231
සංවර්ධන බැඳුම්කර	7,158,558	6,815,995	2,428,326	5,254,857	5,106,038
වෙළඳ පත්‍ර	-	-	-	-	206,807
භාර සහතික	-	-	-	37,481	60,767
සංචිත රෙපෝස් (Repos)	1,035,996	2,629,107	5,130,628	12,530,569	7,852,673
එකතුව	**152,445,063**	**147,537,950**	**142,841,145**	**124,887,745**	**113,353,493**

ආයෝජන අවදානම් කළමනාකරණය

ආයෝජන අවදානම යනු, නිරපේක්ෂක පද අර්ථයෙන්, ආයෝජන ප්‍රතිලාභවලට අනුව ආයෝජන ප්‍රමාණය තුළ යම් අලාභයක් හට ගැනීමේ අවදානම හෝ සාපේක්ෂ පද අර්ථයෙන්, නිර්දේශ මිනුමක් හෝ විකල්ප ආයෝජන ප්‍රමාණයට වඩා විශාල අලාභ දැන ගැනීමේ අවදානම හෝ එකී ප්‍රමාණයට වඩා අඩුවෙන් ලාභ ඉපයීම වේ.

වත්කම් ප්‍රතිලාභවල ඉහළ අස්ථිරතාවය, වෙළඳපොළ පිළිබඳ හැඟීම් සහ අදහස් තුළ ඉහළ සහ බන්ධනය සහ පුළුල් විසාරණය නිසා පහත හෙලනු ලැබූ විවිධාංගිකරණ ප්‍රතිලාභ විදහා දක්වනු ලබන්නා වූ පවත්නා ව්‍යාකූල වෙළඳපොළ තුළ ආයෝජන අවදානම් කළමනාකරණය ප්‍රබල වැදගත්කමකින් යුක්ත වේ.

ආයෝජන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේදී බලපාන අවදානම් ක්ෂණිකව හඳුනා ගැනීම, මැනීමකට ලක් කිරීම, කළමනාකරණය, වාර්තා කිරීම සහ අධීක්ෂණය කිරීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අවදානම් කළමනාකරණයේ අරමුණ වේ. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අදාළ රක්ෂණ රෙගුලාසි සංදර්භය තුළ විචක්ෂණ අවදානම් කළමනාකරණ මූලිකාංග පදනම් කරගෙන අරමුදලේ වගකීම් සපුරාලීම සඳහා වත්කම් වර්ධන මෙන්ම ආදායම අතර යෝග්‍ය සමතුලිතාවයක් පවත්වාගෙන යාම සඳහා අවදානම් තත්ත්වයක් ගැනීම, මඟහරවා ගැනීම, සරල කිරීම සහ යෝග්‍ය ලෙස සකස් කිරීම මෙම අරමුණට ඇතුළත් වේ.

පොළී අනුපාත අවදානම


අවදානම් රහිත පොළී අනුපාත ඵලදා චක්‍රය තුළ ණය පැහිරියාමේ මට්ටම හෝ අස්ථිරතාවයෙන් ඇතිවන වෙනස්කම් නිසා වත්කම් හා වගකීම් අගයන්නේ සංවේදිතාවය ණය පැතුරුම් අවදානම පැහැදිලි කරනු ලබන අතර ඵලදා චක්‍රවල ස්වරූපය තුළ ඇති වෙනස්කම් ඇතුලුව, පොළී අනුපාතයේ ඇතිවන්නා වූ වෙනස්කම් වල ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන අලාභ අවදානම් පොළී අනුපාත අවදානම වේ.

එක් එක් කල් පිරීමේ ප්‍රමාණයන් සහ අවදානම් සීමාවන් සහිත එකතුවූ තත්ත්වයන්ට අනුකූලවීම මත පොළී අනුපාත අවදානම පාලනය කරනු ලබයි.


වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, ස්වකීය ස්ථාවර තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) සහ ස්ථාවර ණය පහසුකම් අනුපාතය (SLFR) 50 වෙනි පදනම් ස්ථානය මඟින් පිළිවෙලින් 7.00% සහ 8.50% දක්වා දෙවරක් වැඩි කරන ලදි.

ඒ අනුව, භාරණ්ඩාගාර බිල්පත් අනුපාතය සැප්තැම්බර් මාසයේදී හෙමින් පහත වැටීම ආරම්භ කිරීම පෙර අගෝස්තු මාසය අවසානය වන තුරුම ඉහළ යාමේ ප්‍රවනතාවයක් පැවතුණි. කෙසේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය පහසුකම සහ වෙනත් විදේශ මුදල් රට තුළට ගලා ඒමත් සමඟ විනිමය අනුපාතය මත වූ පීඩනය පහසු වනු ඇති බවට අපේක්ෂා කරනු ලැබූ අතර පොළී අනුපාත ස්ථාවර වන බවට අපේක්ෂා කරන ලදි.

1 අවුරුදු භාණ්ඩාගාර බිල්පත් අනුපාතය



ලක්ෂ්‍යයෙන් ලක්ෂ්‍යයට සහ වාර්ෂික සාමාන්‍ය තොරතුරු (%)



පිළිගත හැකි මට්ටමේ ආදායම් උපයන දීර්ඝකාලීන ස්ථාවර ආදායම් පත්‍ර අඩුකම සහ අවදානම මඟින් වත්කම් බැරකම් කාලසීමාව තුළ ජීවිත අරමුදලට නොගැලපීගෙන ගෙනවිත් ඇත. කෙසේ වුවද, මෙම තත්ත්වය විශ්ලේෂණය කර, ආකර්ෂණීය ලාභ උපයන්නාවූත්, නොගැලපීම් වන කාල සීමාවන් තුළ සමීප ව අධීක්ෂණය කරමින් ආදායම් මත පොළියට ඇති පීඩනය ලිහිල් කරමින් ඇතැම් දීර්ඝකාලීන සාධනපත්‍රවල ආයෝජනය කිරීම මඟින් ස්ථාවර ආදායම් ප්‍රාග්ධනයේ කාල සීමාව කම්ටුව විසින් කල් ඇතිව දීර්ඝ කරන ලදි.

තවද, මෙම සියලුම අංශ ආවරණය කරමින්, පරිපූර්ණ වත්කම් - බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ඇති කිරීමට සමාගම විසින් දැනටමත් මූලික පියවර ගෙන ඇත.


ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

කල් පිරෙන ආකෘති
ජීවිත රක්ෂණ අරමුදල



< 1 අවුරුදු	17.73%
1 - 2 අවුරුදු	24.74%
2 - 5 අවුරුදු	14.93%
5 - 10 අවුරුදු	19.99%
> 10 අවුරුදු	22.62%

කල් පිරෙන ආකෘති
සාමාන්‍ය අරමුදල



< 1 අවුරුදු	35.21%
1 - 2 අවුරුදු	35.88%
2 - 5 අවුරුදු	28.90%

වෙළඳපොල අවදානම

කොටස් මිල ගණන් වල අස්ථිරතාවය නිසා කොටස් ආයෝජනවලට ඇති අවදානම වෙළඳපොළ අවදානම වේ.


විවිධ අංශ සහ සමාගම්වල කොටස් ආයෝජනය විවිධාංගිකරණය කිරීම මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙළඳපොළ අවදානම අවම කරනු ලබයි.දේශීය සහ විදේශීය රටවල් ඉදිරියේ පැවති ආර්ථික තත්ත්වයට මුහුණ දීමේ ප්‍රතිඵලයක් වශයෙන් කොටස් වෙළඳපොලේ වාර්ෂික කඩා වැටීම 9.66% දක්වා දීර්ඝ විය.කෙසේ වුවද, තෝරාගත් ප්‍රධාන සමාගම්වල මිල ගණන් ආකර්ෂණය වන බැවින් එක් අවුරුදු කාල සීමාවන් තුළ දී කොටස් මිල ගණන් ඉහළයාම සම්බන්ධ අපේක්ෂාවන් පවතී. කොටස්වල ආයෝජනය කිරීම සඳහා විදේශීය ආයෝජකයන් ආකර්ෂණය කරනු ලබන මුදල් අව ප්‍රමාණය වීම මඟින් මෙම තත්ත්වය තවදුරටත් තහවුරු කරනු ඇත.

මෙම සමාගම්වලට දේශීය/විදේශීය ආයෝජන ගලා ආ බැවින් මූලික වශයෙන් ශක්තිමත් ආයෝජන, විශේෂයෙන් විශ්වාස ජනිත ආයෝජන බාධාවකින් තොරව පැවතුනි.

සියලු කොටස්වල මිල දර්ශකයේ සංචලනය 2016 මූල්‍ය වර්ෂය




අංශ වශයෙන් බෙදීයාම - ලැයිස්තුගත කොටස්
ජීවිත අරමුදල



Financials	76.08%
Consumer Discretionary	6.58%
Industrials	6.52%
Health Care	5.90%
Telecomunication Services	2.66%
Materials	1.31%
Consumer Staples	0.58%
Real Estate	0.28%
Energy	0.00%
Information Technology	0.00%

** Including The Lanka Hospitals Corporation PLC which is a Subsidiary of SLIC*

ආංශික වශයෙන් බෙදීයාම - ලැයිස්තුගත කොටස්
සාමාන්‍ය අරමුදල



Financials	83.02%
Health Care	10.84%
Industrials	4.44%
Materials	1.08%
Telecomunication Services	0.51%
Consumer Discretionary	0.11%
Energy	0.00%

** ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ද ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී ඇතුලුව*

ආයෝජන අවදානම් කළමනාකරණය ඉතිරි කොටස.

ණය අවදානම සහ සංකේන්ද්‍රකරණ අවදානම

ණය අවදානම යනු ගණුදෙනුකරුවන් ස්වකීය මූල්‍ය බැඳීම් ඉටු කිරීමට අපොහොසත්වීම නිසා ඇතිවන පාඩුව හෝ විය හැකි පාඩුවයි.

අවදානමේ ගුණාත්මය, කර්මාන්තය, කල් පිරීම සහ පෘතුල නිරාවරණයට අනුව සංකේන්ද්‍රණය වීම සීමා කරමින් ආයෝජන ප්‍රමාණය සමබර කිරීමේ අරමුණින් වික් වික් ණයකරුවන්ගේ මට්ටමින් සහ ආයෝජන ප්‍රමාණයේ මට්ටමින් ණය අවදානම අධීක්ෂණය සහ කළමනාකරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් කේවල නිකුත්කරුවන්ගේ සහ නිශ්චිත වත්කම් සමූහය මගින් මෙන්ම ද්‍රවශීලතා සාධනපත්‍ර ඔස්සේ සිදු කරන ආයෝජනවල සංකේන්ද්‍රකරණය වීම සීමා කිරීමට ස්වකීය සීමා පනවා ඇත.

- බලයලත් වාණිජ බැංකු සහ බලයලත් විශේෂිත බැංකු හැර වාරික තැන්පතු වලින් කිසිදු ආයෝජනයක් සිදු කර නොමැත.
- සංගමික ණයකර සහ වාණිජ පත්‍රවල සියලුම ආයෝජනයන් සඳහා පිළිගත් ණය ශ්‍රේණි ගතකරන ආයතනයක් මගින් ආයතනය සහ සාධන පත්‍ර යන දෙකම සඳහා වන ආයෝජන මට්ටමේ ණය ශ්‍රේණිගත කිරීමක් අපේක්ෂා කෙරේ.
- සබැඳි සමාගම්වල තිබූ ණය ආයෝජනයක් සිදු කර නොමැත.
- ණය සුරැකුමක යම් ආයෝජනයක් සිදු කිරීමට ප්‍රථම, සවිස්තරාත්මක ණය විශ්ලේෂණයක් අභ්‍යන්තරිකව සිදු කරනු ලැබේ.

ද්‍රවශීලතා අවදානම

ගෙවිය යුතු අවස්ථාවේ ස්වකීය බැඳීම් සපුරාලීම සඳහා හෝ එසේම නියමිත පරිදි පියවීමට අතිරික්ත පිරිවැයක් දැරීමට සිදුවන අවස්ථාවේදී සමාගමට ප්‍රමාණවත් මුදල් නොමැතිවීමේ අවදානමකට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මුහුණ දීම ද්‍රවශීලතා අවදානම වේ.

ජීවිත රක්ෂණ අරමුදල

සම්ප්‍රදායිකව, මෙම අරමුදලට අවම ද්‍රවශීලතාවයක් අවශ්‍ය වේ. වාරික ආදායමෙන් සහ වෙනත් මාර්ගවලින් වාර්ෂිකව මුදල් ඇතුලට ගලා වීම මුදල් පිටතට ගලා යෑම ඉක්මවා ඇත. ව්‍යාපාර වර්ධනයේ පරිමාව, වගකීම්වල දිගුකාලීන ස්වභාවය, වත්කම් කල් පිරීමේදී නැවත ආයෝජනය කිරීම සහ වෙනත් ආකාරයේ මූලධන ගෙවීම් යනාදිය මෙමගින් පිළිබිඹු වේ.

කෙසේ වුවද, ඉදිරි වර්ෂ කීපය තුළ අරමුදලේ ප්‍රතිපත්ති කල් පිරීමේ චක්‍රයේ නව අදියරක් නියෝජනය කරන සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ පරිමාවකින් යුතු රක්ෂණ හා ඔප්පු කල් පිරීම සහ මුදල් පිටතට ගලා යාම අපේක්ෂා කෙරේ. රක්ෂණ ඔප්පු කල් පිරීම්වලට සමගාමීව මෙම අපේක්ෂිත විශේෂ මුදල් පිටතට ගලා යාම ගැලපීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර භාවිතා කරනු ලැබිය හැකිය.

රක්ෂණ ඔප්පුවලට අදාළ බැඳීම්, බදු සඳහා බැඳීම් සහ ආයෝජන අවස්ථා සාමූහික සපුරාලීම සඳහා කෙටිකාලීන වෙන් කිරීම් තුළ රුපියල් මිලියන 850 කට වැඩි ප්‍රමාණයක ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් සුරැකුම්පත් අන්තර්ගත කර ඇත.

සාමාන්‍ය රක්ෂණ අරමුදල

මුදල් ඉවතට ගලා යාමේ අවිනිශ්චිතතාවය හේතුවෙන්, ද්‍රවශීලතාවය සාමාන්‍ය රක්ෂණ අරමුදලට වැදගත් ප්‍රතිෂ්ඨාවක් ලෙස පවතී. හදිසි ද්‍රවශීලතා සංචිතයක් වශයෙන් කෙටිකාලීන සුරැකුම්පත් ප්‍රමාණයක් පවත්වාගෙන යාම අරමුදලට වැදගත්වේ.

එසේම, අරමුදල විසින්, වාරික මූල්‍ය ප්‍රවාහ අවශ්‍යතා (යෝග්‍ය පරිදි) වත්කම් කල් පිරීම ගලපා ගනිමින් විවිධ කාල පරාශවල දී කල් පිරෙන උපලේඛණයක් සහිතව පහසුවෙන් අලෙවිකළ හැකි භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයක්ද පවත්වාගෙන යනු ලබයි.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම් යනු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පුද්ගලයන්, ක්‍රියාවලීන් සහ පද්ධති ආශ්‍රිත අවදානම වේ.

සියලුම මෙහෙයුම් අවදානම් වුවද, භාණ්ඩාගාර වත්කම් කළමනාකරණ මෘදුකාංග (SAP) මොඩියුලය ක්‍රියාත්මක කිරීමෙන් මෙහෙයුම් අවදානම් ඉවත් කෙරිණි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

මෙහෙයුම් සමාලෝචනය

2016 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ උපායමාර්ගික ආයතනික අරමුණ වූයේ, ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ කාණ්ඩ දෙඅංශයේම වෙළඳපොළ ප්‍රමුඛයා වීමයි.

වෙනස් වෙමින් පවතින තරඟකාරිත්වය ඉහළ නංවාලීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් උපායමාර්ගික තීරණ විශාල ප්‍රමාණයකට ප්‍රතිචාර දක්වන ලදි. ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ යන දෙඅංශයේම අංක 1 තත්ත්වය ලබා ගැනීම සඳහා වෙළඳපොළ කොටස් අත්පත්කර ගැනීම එහි අරමුණ වේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජාලය

2016 වර්ෂය අවසානවන විට, දිවයින පුරා විහිදී ගිය ශාඛා 117 කින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශාඛා ජාලය සමන්විත විය. සමාලෝචන වර්ෂය තුළ නව ශාඛා විවෘත නොකරන ලදි. කෙසේ වුවද, රට තුළ සියලුම ප්‍රධාන උපාය මාර්ගික ස්ථාන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වේ. කරුණාකර වාර්තා කරන දිනට ශාඛා පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුව අඩංගු 236 දිට 245 දක්වා වූ ශාඛා ලැයිස්තුව බලන්න.

ශාඛා ජාලයට අමතරව, සේවා මධ්‍යස්ථාන 15, මෝටර් වාහන රක්ෂණ හිමිකම් මධ්‍යස්ථානය සඳහා වෙන් කරන ලද මහනුවර පිහිටි ශාඛාව, 2600 ක් වන සක්‍රීය නියෝජිත බලකාය අලෙවි විධායක සහ බැංකු රක්ෂණ නිලධාරීන් 235 දෙනෙකු මෙන්ම තැරැව්කරුවන් 56 දෙනෙකු ගෙන් 2016.12.31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශාඛා ජාලය සමන්විත වේ.

තුන් අවුරුදු ආයතනික උපාය මාර්ගය

වර්ධන උපාය මාර්ගයේ අංගවලට, තොරතුරු සන්නිවේදන තාක්ෂණ පිළියම් තුළ ආයෝජනය, ශාඛා ජාලයේ පුළුල්වීම හරහා වෙළඳපොළ ප්‍රවේශය, නව විශේෂිත රක්ෂණ සැලසුම් වැඩි දියුණු කිරීම හා හඳුන්වා දීම සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකරණ සහ සේවක මණ්ඩලය සඳහා වැඩි දියුණු කරන ලද කාර්ය සාධන දර්ශකයන් ඇතුළත් වේ.

තත්ත්ව සහතික කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තත්ත්ව ප්‍රතිපත්තිය

එක් එක් දෙපාර්තමේන්තු සහ ශාඛාවලට ප්‍රදර්ශනය කරමින් පවතින තත්ත්ව ප්‍රතිපත්තිය තුළ සමාගමේ ප්‍රතිපත්තිය පැහැදිලිව පිළිබිඹු කෙරේ. තත්ත්ව ප්‍රතිපත්ති රාමුව තුළ ස්වකීය කටයුතු කාර්ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන බවට ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් සහතික කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ (ඕඩ) සහතික ලත් ආයතනයක් බව ආඩම්බරයෙන් නිවේදනය කරයි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2009 වර්ෂයේදී අයිවිස්ඕ සහතිකය ලබාගත් අතර සෑම වසර තුනකට වරක්ම එය අළුත් කරයි. දැනට පවත්නා සහතිකය 2017 නොවැම්බර් මාසය දක්වා වළංගු වන අතර ඉන් අනතුරුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අයිවිස්ඕ 9001:2015 නවතම ප්‍රකාශනය වෙනස් වනු ඇත.

මෙම සහතිකය මගින්, ජීවිත සහ ජීවිත නොවන ප්‍රතිරක්ෂණ, හිමිකම් ගෙවීම සහ ප්‍රධාන කාර්යාලය සහ එහි ශාඛාවල සහය සේවා ආවරණය කරයි. සියලුම දෙපාර්තමේන්තුවලට ආයතනික අරමුණක් සමඟ එකට ගමන් කරන තමන්ට අයත් අරමුණු තිබේ.

පාරිභෝගික රැකවරණ, අයිවිස්ඕ පද්ධතිය තුළ මෙහෙයවනු ලබයි. පාරිභෝගික චෝදනා ලේඛනගත කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලයේ සියලුම දෙපාර්තමේන්තු වලින් සහ ශාඛාවලදී ඒ සම්බන්ධයෙන් ඵලදායී පියවර ගනු ලබයි. ප්‍රතිචාරය ලබා ගැනීම සඳහා පාරිභෝගිකයා සෑහීමකට පත්වීමේ සමීක්ෂණයක් සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අභ්‍යන්තර ජාලය තුළ කාර්ය මණ්ඩලය උදෙසා සියලුම ක්‍රියාපටිපාටි මාර්ගෝපදේශ සහ ආකෘති ලබා දී ඇත.

මෙහෙයුම් සමාලෝචනය
ඉතිරි කොටස.

සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් සමාලෝචනය - 2016

මෝටර් වාහන සහ මෝටර් වාහන නොවන ප්‍රධාන උපාය මාර්ග ික ව්‍යාපාර කටයුතු ඒකක දෙකකින් සාමාන්‍ය රක්ෂණ කාණ්ඩය සමන්විත වේ. මෙම කාණ්ඩ දෙකම විවිධ ලක්ෂණයන්ගෙන් යුක්ත වේ. එම නිසා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ, සාමාන්‍ය රක්ෂණ උපාය මාර්ගික සැළසුම මෝටර් වාහන සහ මෝටර් වාහන නොවන යන කාණ්ඩ දෙකටම වෙන් වෙන්ව අවධානය යොමු කරනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සාමාන්‍ය රක්ෂණ අලෙවි උපාය මාර්ගය

2016 සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සමස්ථ සාමාන්‍ය රක්ෂණ අලෙවි උපාය මාර්ගය පහත සඳහන් ප්‍රධාන උපාය මාර්ගික මාර්ග කෙරේ අවධානය යොමු කරමින් වැඩි දියුණු කර ඇත.

- තරඟකාරී උපාය මාර්ගය
- වර්ධන උපාය මාර්ගය
- අලෙවිකරණ සන්නිවේදන උපාය මාර්ගය
- නවෝත්පාදන උපාය මාර්ගය

"මෝටර් ෆ්ලස්" සන්නාමය 2009 දී නැවත එළි දැක්වීමේ පශ්චාත් යථාර්තකරණයෙන් පසු "ජාතික මෝටර් රක්ෂණ සන්නාමය" වශයෙන් ස්ථාපනය කරන ලදි.

මෝටර් නොවන වාහන සඳහා ලිහිල් රේගුලාසි සහ ප්‍රබල තරඟකාරිත්වයක් සහිතව ආයතනික රක්ෂණ සැලසුම් කළමනාකරණය, පවත්නා අලෙවි කොන්දේසි යටතේ තව දුරටත් තරඟකාරිත්වයට ප්‍රමාණවත් නොවේ. එම නිසා තවදුරටත් ආයතනික ව්‍යාපාරික කටයුතු වැඩි දියුණු කරමින් ඊලඟ වසර 3 ක කාල පරිච්ඡේදය තුළදී සිල්ලර වෙළඳපොළ දියුණු කිරීම සඳහා මූලික අවධානය යොමු කරනු ඇත.

පුහුණු කිරීම සහ සංවර්ධනය

සාමාන්‍ය රක්ෂණය උදෙසා සාර්ථක අලෙවිකරණ හැකියාවන් සඳහා හා ඉහළ මට්ටමේ පුහුණු කිරීමේ සහ රාජකාරී චර්යා ධර්ම වලින් යුතු දැනුම ඉහළ නැංවීම තුලින් විශ්වාසය ගොඩ නැඟීම ප්‍රධාන කටයුත්තකි. ඉතා හොඳින් ව්‍යුහගත කරන ලද පුහුණු හා සංවර්ධන ආකෘතීන් මෙම අවධානය යොමු කරන ලද අංශ තුළ අඛණ්ඩව යාවත්කාලීන කිරීම සහිතව නිර්මාණය කර සහ ඔපමට්ටම් කර ඇත. තවද, සාමාන්‍ය රක්ෂණ පුහුණු කිරීමේ කණ්ඩායම විසින් වර්ෂය තුලදී අභිප්‍රේරණය කිරීමේ වැඩසටහන් ඇතුළුව නායකත්වය අලෙවි කළමනාකරණ සංවර්ධනය කෙරෙහිද අවධානය යොමු කරනු ඇත.

ප්‍රතිරක්ෂණ

මූල්‍යමය වශයෙන් අස්ථාවර ප්‍රතිරක්ෂකයන්ට, හිමිකම් අයකර ගැනීමේදී තමන් සමඟ කටයුතු කරන රක්ෂකයන් කෙරෙහි විශාල සෘණාත්මක බලපෑමක් ඇති කළ හැක. එම නිසා ගෝලීය වශයෙන් ඉහළම ස්ථානයක් දරන්නා වූ ගිවිසුම්ගත ප්‍රමුඛයන් වන ඉහළ මූල්‍ය ශ්‍රේණිගත කිරීම සහිත ප්‍රතිරක්ෂකයන් සමඟ අපගේ ප්‍රතිරක්ෂණ කටයුතුවල අපි නිරත වී සිටින්නෙමු.

පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීම

පාරිභෝගිකයාට වඩා යහපත් සහ ඉතා ඉක්මණින් සේවය ලබා දීම සඳහා හදිසි අනතුරු හානි පරීක්ෂා කරනු ලබන මෝටර් වාහන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරීන්ට සහ ඔවුන්ගේ සෞඛ්‍ය හිමිකම් සම්බන්ධීකාරකවරුන්ට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සුසුකි යතුරු පැදි 132 ක් පිරිනමන ලදි.

වෙළඳපොළ පාදක ප්‍රවේශය

සමාගමේ සන්නාම ගත කිරීමේ මූලික කටයුතු 2016 වසර තුළත් ඉහළ තත්ත්වයේ පවතින බවට, තතහවුරු කිරීම සඳහා පැහැදලි අලෙවිකරන උපායමාර්ග භාවිතා කරන ලදි. ශක්තිමත් ව්‍යාපාරික කටයුතු ඉදිරියට ගෙන යෑමට හේතුවූ එවැනි බොහෝ පියවර සහිතව ඉතා පැහැදිලි ආකාරයට විශාල වෙළඳපොළකට ප්‍රවේශ වීම සඳහා එම උපාය මාර්ගවලින් සමාගමට විවිධ මූලික පියවරයන් ගැනීමට ඉඩ සලසන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අලෙවි කණ්ඩායම් අතර ඉහළ ඉලක්ක සපුරාගත් ඉහළම ජයග්‍රහයකයන්ට ගෞරව දැක්වීම සඳහා ජූලි මාසයේදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද 2016 ස්ටාර් ත්‍යාග ප්‍රදානෝත්සවය එවැනි ක්‍රියාමාර්ග වලින් එකකි. 2015 වර්ෂය තුළදී ස්වකීය අලෙවි කණ්ඩායමේ විශිෂ්ඨ සහ කැපී පෙනෙන කාර්ය සාධනය හඳුනා ගැනීම සහ ගෞරව දැක්වීමට මෙම වාර්ෂික උත්සවය සංවිධානය කරන ලදි. දෙන ලද අලෙවි ඉලක්ක සහ ප්‍රමිතීන් සාක්සාත් කිරීම පදනම් කරගෙන ස්වකීය විශිෂ්ඨ අලෙවි කාර්ය සාධන උදෙසා කණ්ඩායම් කායකයන් 426 දෙනෙකු මෙම උත්සවයේදී ගෞරවයට පාත්‍ර විය.

ජනතාව අතර සන්නාමය පිළිබඳ දැනුවත් කිරීම ඉහළ නැංවීම සඳහා රටපුරා ප්‍රවර්ධන කටයුතු ද සංවිධානය කරන ලදි. එකී ඇතැම් කටයුතු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ උත්සවවලට පමණක් සීමාවූ වූ අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ස්වයංක්‍රියව සහභාගි වූ අනෙක් පාර්ශවයන් විසින් සංවිධානය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

කරන ලද ඇතැම් උත්සව ද තිබිණි. එහි දී ස්වකීය සන්නාමය ප්‍රදර්ශනය කෙරිනි. ඉදිකිරීම් ක්ෂේත්‍රය විසින් සංවිධානය කරන ලද සහ මැයි මාසයේදී බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද Build SL 2016 ඉදි කිරීම් ප්‍රදර්ශනය එවැනි උත්සවවලින් එකකි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ස්වකීය අලෙවිකරණ කටයුතු නව මට්ටමකට ගෙන ඒමට ශක්තිමත් නියෝජනයක් සළකුණු කිරීමට කළමනාකරණය කරනු ලැබූ අනෙකුත් අංශ වනුයේ ක්‍රීඩා සහ සංස්කෘතික උත්සවයි. අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා රගර් පුට්බෝල් සමාජය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා සුපර් 7 - 2016 ජාත්‍යන්තර රග්බි තරඟාවලිය, ඔක්තෝම්බර් මාසයේදී පවත්වන ලද රේසින් ඩ්‍රයිවර්සන් සහ රයිඩර්ස් ලංකා සංගමය සමග ශ්‍රී ලංකා යුධ හමුදාවේ කමාන්ඩර් රෙජිමේන්තුව විසින් සංවිධානය කරන ලද කොමාන්ඩෝ අභියෝගතා සුපර් ක්‍රොස් මෝටර් රථ තරඟය සහ තවත් ආගමික සහ විනෝදාශ්වාද උත්සව වලට අනුග්‍රහතාවය ලබා දෙමින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සම්බන්ධ වී ඇත.

කොළඹ, ගම්පහ සහ මහනුවර තුළ සහ අවට ඉන්ධන පිරවුම්හල් ස්ථානවල සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල පවත්වන ලද නොමිලේ ඉන්ධන ප්‍රවර්ධනය සඳහා විශාල ප්‍රතිචාරයක් තිබිණි. එක් එක් දිනවලදී නිර්මාණය කරන ලද ඉන්ධන මධ්‍යස්ථානවලට ධාවනය වන මෝටර් රථ පදවන්නන් අතරින් එක් එක් වැඩසටහන තුළින් ජයග්‍රහයකයන් 10 දෙනකු තෝරා ගනු ලැබූ අතර, ඔවුන්ට රු. 5000/- ක් වටිනා ඉන්ධන නොමිලේ ලැබුණි.

රක්ෂණ සංස්ථාවේ පණිවිඩය සෑම තැනකම පැතිරවීම සඳහා වසර තුළ දී සමාගම විසින් පවත්වන ලද සන්නාම සක්‍රිය කිරීමේ වැඩසටහන් අතර ව්‍යාපාර කටයුතු පිළිබඳ පාර්භෝගික සංගම්ද විය. මෙම සංසඳ සඳහා අනුග්‍රහකත්වය දැක්වූ සමහර ප්‍රදේශ වූයේ කොළඹ 1 සහ 3 මධ්‍යම 1 සහ 2 මීගමුව සහ මාතර වේ.

සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාස වලදී 'Hela' ඇඳුම් කර්මාන්ත ශාලා වලදී රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් සහ ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර, ප්‍රාදේශීය මට්ටමෙන් පාක්ෂිකභාව තෑග (Loyalty Rewards) තෑග පිරි නැමීමේ කොළඹ, මහනුවර සහ අනුරාධපුරයේදීද සක්‍රිය වැටසටහන් පවත්වන ලදි.

ලෝකය පුරා අලෙවි අංශය තුළ ඇතිවූ නවීන ප්‍රවණතාවලට අනුව කටයුතු කරමින් අලෙවිකරණ මෙවලමක් වශයෙන් ඩිජිටල් මාධ්‍යය භාවිතා කිරීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ආරම්භ කරන ලදි. සමාජීය මාධ්‍යය සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමේ හැකියාවන් ගෙන් සන්නද්ධ වීම සඳහා සංස්ථාව විසින් මුහුණු පොත සහ ටුවිටර් හිණුම් භාවිතා කරනු ලබයි. වැඩි දියුණු කරන ලද වෙබ් අඩවිය මගින් හා මුද්‍රිත සහ විද්‍යුත් යන දෙඅංශයේ ප්‍රධාන මාධ්‍ය ධාරාව කෙරෙහි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අවධානය යොමු කිරීම මගින් මෙම පරිශ්‍රමය සඳහා අතිරේක වශයෙන් අවශ්‍ය සහයෝගය ලබා දී ඇත.

2017 වර්ෂය සඳහා බොහෝ අලෙවිකරණ කටයුතු සැලසුම් කරනු ලැබ ඇති අතර "සිලෝන් මෝටර් ෂෝ 2017" ඒවායින් එකකි. කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 2017 ජනවාරි මස දී පවත්වන ලද සිලෝන් කැලැසික් මෝටර් රථ සංගමය සහ ලංකා මෝටර් රථ වෙළෙන්දන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද ප්‍රිමියර් මෝටර් ධාවන තරඟය හතරවන වරටත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෝටර් ෆ්ලස් නිලනාම හවුල්කරු විය.

මිනිමුතු දායාද ඩිරම් කලෙක්ෂන්



මිනිමුතු දායාද ළමා රක්ෂණ සැලැස්ම එළිදැක්වීම සනිටුහන් කිරීම සඳහා 2016.02.14 වන දින සිට 2016.03.31 වන දින දක්වා මිණිමුතු දායාද ඩිරම් කලෙක්ෂන් තරඟයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පවත්වන ලදි. මෙම තරඟය මගින්, ස්වකීය අනාගත බලාපොරොත්තු පදනම් කරගත් ළමයින්ගේ නිර්මාන 5000 කට වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්නා ලදි. දෙමාපියෙකු හෝ භාරකරුවෙකු කැටුව රාත්‍රී හතරක් සහ දින හතකින් යුතු පැකේජයක් සහිත සිංගප්පූරුවේ යුනිවර්සල් ස්ටුඩියෝස් (ඔබසඩැරීක් චිමාසද) නැරඹීම සඳහා ජයග්‍රහකයන් 10 දෙනකුට අවස්ථාව හිමි විය.

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

මෙහෙයුම් සමාලෝචනය
ඉතිරි කොටස.

කමාන්ඩෝ අභියෝගයට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශක්තිය



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අලෙවි අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි නිරෝෂනී පෙතියාගොඩ විසින්, කොමාන්ඩෝ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරි බ්‍රිගේඩියර් රැලප් නුගේරා වෙත අනුග්‍රාහක චෙක්පත පිළිගැන්වීම.

ඔක්තෝම්බර් මාසයේදී පවත්වන ලද ජවසම්පන්න කොමාන්ඩෝ අභියෝගතා සුපර්ක්‍රොස් මෝටර් රථ තරඟයේ විකම රක්ෂණ හවුල්කරු සහ අනුග්‍රාහකයා වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෝටර් ප්ලස් අංශය ඉදිරි පියවරක් තබන ලදි.

ශ්‍රී ලංකා මෝටර් රථ තරඟ රියදුරන්ගේ හා පදවන්නන්ගේ සංගමය සමග ශ්‍රී ලංකාවේ යුදෙ හමුදාවේ කමාන්ඩෝ රෙජිමේන්තුව විසින් සංවිධානය කරන ලද "කොමාන්ටෝ භටයන් සමඟ ධාවනය" යන තේමාව යටතේ විනාඩියක් උද්ධාමයට පත්වීමේ තරඟය ("Thrill - a - minute" event) පවත්වන ලදි.

ප්‍රථම වරට අද්විතීය ආකෘතියක් යටතේ මෙය සංවිධානය කරනු ලැබූ අතර අදියර දෙකක් යටතේ එය පැවැත්විණි. ඉතා විනෝදජනක සහ සැහැල්ලු තරඟයක් වශයෙන් වනු ඇති බවට අපේක්ෂා කරනු ලැබූ චාරිකා කණ්ඩායම විසින් ඔක්තෝබර් 3 වන දින ආරම්භ කරන මෙම තරඟය ධාවන තරඟ තුනකින් පළමු අදියර සමන්විත වේ. පළාත් හතරක් එනම් බස්නාහිර, මධ්‍යම, නැගෙනහිර සහ ඌව හරහා ස්වකීය ගමන පුළුල් කරමින් සහ වෙනස්වන භූගෝලීය සහ දේශගුණික තත්ත්වයට ආවරණය වෙමින් චාරිකා කණ්ඩායම කි.මී. 560 වැඩි ප්‍රමාණයක් ආවරණය කරන ලදි.

දෙවන අදියර ඔක්තෝම්බර් 9 වන දින ක්‍රියාත්මක වූ අතර යතුරු පැදි සහ මෝටර් රථ සඳහා වන සුපර්ක්‍රොස් තරඟ අභියෝග යෙන් සමන්විත විය. ඌව කුඩාඔය පිහිටි දිවයිනේ ඇති දිගම සහ වේගමත්ම තරඟ ධාවනය පත ලෙස සලකනු ලබන්නා වූ කොමාන්ඩෝ රෙජිමේන්තුවේ පුහුණු පාසලේ කි.මී. 1.68 වූ තරඟ ධාවන පතයේදී මෙම තරගය පවත්වන ලදි. මෙම ධාවන පතය ජාත්‍යන්තර මට්ටමට සංවර්ධනය කර ඇත. සුපර්ක්‍රොස් තරඟය, මෝටර් රථ 12 ක් සහ යතුරු පැදි 10 කට වැඩි ප්‍රමාණයක තරගකරුවන්ගෙන් සමන්විත වූ අතර රියදුරන් සහ පදවන්නන් 100 කට වැඩි ප්‍රමාණයකගේ සහභාගිත්වය දක්නට ලැබුණි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෝටර් ප්ලස් මෝටර් රථ තරඟ සඳහා අනුග්‍රහය දක්වන අවස්ථාවලදී නිරන්තරයෙන්ම ඉදිරියෙන්ම සිටියි. ප්‍රධාන මෝටර් රක්ෂණ සපයන්නා වශයෙන්, එවැනි තරඟවලට ස්වකීය මැදිහත්වීම තුළින් එම තරඟවලට මෙන්ම සහභාගිවන්නන්ටද විශාල කීර්තියක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සුපර් සෙවන්ස් රගර් තරඟවලින් හවුල්කරු වීම



මේ සඳහා වන අනුග්‍රහක පැකේජය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සම කළමණාකාර කීත් බර්නාඩ් විසින් විදුලි සංදේශන සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා ඉදිරියේ ශ්‍රී ලංකා රග්බි පුට්බෝල් සංගමයේ සභාපති අසංග සෙනවිරත්න මහතාට භාරදෙන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා සුපර් සෙවන්ස් 2016 ජාත්‍යන්තර රගර් තරඟාවලියේ නිල රක්ෂණ හවුල්කරු වශයෙන් සාර්ථක ප්‍රගතියක් ලඟා කරගෙන ඇත. මෙම තරඟාවලිය ශ්‍රී ලංකා රගර් පාපන්දු සංගමය විසින් සංවිධානය කරනු ලැබූ අතර එය අදියර දෙකක් යටතේ පවත්වන ලදි. තරඟාවලියේ පළමු අදියර කොළඹ රේස්කෝස් ක්‍රීඩා පිටියේදී අගෝස්තු 5 සහ 6 වලදී පවත්වනු ලැබූ අතර දෙවෙනි කොටස එම ස්ථානයේදීම අගෝස්තු මස 12 සහ 13 යන දින වලදී පවත්වන ලදි.

හවුල්කාරිත්වය අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෝටර් වාහන ප්ලස් අංශය මඟින්, හදිසි අනතුරු ආවරණය සහ රෝහල්/ශල්‍ය කර්ම ප්‍රතිලාභ සහ ප්‍රතිපාදන සහිතව රුපියල් දස ලක්ෂයක මුදලකින් පූර්ණ සාමාජිකත්වය සහිත කණ්ඩායමේ එක් එක් ක්‍රීඩකයන් ආවරණය කරයි. පාසැල් කණ්ඩායම් සාමාජිකයන් ද රක්ෂණ ආවරණය ලබති. මෙය දේශීය ක්‍රීඩා ප්‍රවර්ධනය කිරීම සහ නඟා සිටුවීම සඳහා වන ස්වකීය ගමනේ රජයේ රක්ෂණ දැවැන්තයා විසින් ගෙන ඇති තවත් පියවරකි.


මෙහෙයුම් සමාලෝචනය
ඉතිරි කොටස.

ජීවිත රක්ෂණ මෙහෙයුම් සමාලෝචනය 2016

2016 වර්ෂයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තුළ අසමසම ජීවිත රක්ෂණ ප්‍රසාද දීමනා වාර්තා කරයි.

දේශීය රක්ෂණ කර්මාන්තය තුළ සියලු වැදගත් සන්ධිස්ථානයන් බිඳ හෙලමින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වසරකට පෙර ප්‍රකාශයට පත් කරන ලද ස්වකීය වාර්තාගත රුපියල් බිලියන 5.4 අභිබවා යමින් 2016 වර්ෂය තුළ රුපියල් බිලියන 6.2 ක ජීවිත රක්ෂණ ප්‍රසාද දීමනාවක් තහවුරු කර ප්‍රකාශ කරන ලදි. 2006 වර්ෂයේ සිට ජීවිත රක්ෂණ ප්‍රසාද දීමනා වශයෙන් සම්පූර්ණයෙන් රුපියල් බිලියන 35 කට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් තහවුරු කර ප්‍රකාශයට පත්කර ඇත. ඥානාන්විත ආයෝජන කළමනාකරණය තුළින් ස්වකීය රක්ෂණ ඔප්පු හිමිකරුවන් ආරක්ෂා කරමින් ඉහළම ප්‍රතිලාභ ලබාදීම සඳහා සංස්ථාවේ කැපවීම පිළිබඳව මෙය ප්‍රමාණවත් සාක්ෂියකි.

මූල්‍ය වර්ෂයේ ප්‍රසාද දීමනා



නව නිෂ්පාදන (සැලසුම්)

ළමයින්ගේ ආරක්ෂාව ඉහළ නැංවීමේ අරමුණින් 2016 වර්ෂයේදී නව ළමා රක්ෂණ සැලසුමක් හඳුන්වා දෙන ලදි. මිනිමුතු දායාද යනුවෙන් හඳුන්වනු ලබන, මෙම සැලැස්ම, ළමයින්ගේ අධ්‍යාපන සහ වෘත්තීය විභාග ආශ්‍රිත අධික වියදම්වලට ආධාර කිරීම සඳහා වන අද්විතීය අරමුදලක් වේ. මෙම රක්ෂණ ඔප්පුව මගින් ළමයා වෙනුවෙන් රෝහල් ගතවීමක් වන අවස්ථාවක දී මෙන්ම, ළමයාගේ දෙමාපියන් හෝ භාරකරුවෙක් වන රක්ෂණ ඔප්පු හිමියාට සිදුවන හදිසි අනතුරක් හෝ අසනීප තත්ත්වයක් නිසා හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය සහ පූර්ණ ස්ථිර ආබාධිත තත්ත්වයට පත්වීමේ ප්‍රතිලාභය සහිත ස්වාභාවික සෞඛ්‍ය ආවරණයක් පිරි නමයි. කල් පිරීමේ දිනයෙන් ආරම්භ වී අනුග ාමී වර්ෂ 5කට වඩා වාර්ෂික වාරික 5 කින් කල් පිරීමේ ගෙවීම් ක්‍රියාත්මක වේ. වාරික ගෙවීම් කරන හෝ කල් පිරීමේ ගෙවීම් සිදුකරන කාල පරිච්ඡේදය තුළ දෙමාපියෙක්/භාරකරුවෙකු මරණයට හෝ ආබාධිත තත්ත්වයට පත්වීමේදී ගෙවමින් පවතින වාරික ගෙවීම් තවදුරටත් ගෙවනු ඇත.

අලෙවි බලකාය සක්‍රිය කිරීම

වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා ජීවිත අලෙවි බලකාය යලි පුනර්ජීවනය කරන ලද අතර 2016 මූල්‍ය වර්ෂය තුළදී ප්‍රාදේශීය මට්ටමින් ව්‍යුහගත අලෙවි ප්‍රවර්ධන පුහුණු කිරීමේ ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි.මෙම ජාතික අලෙවි ව්‍යාපෘති සහ ඉහත රේඛීය කටයුතු වලට අමතරව මෙම කටයුතු සිදු කරන ලදි.

අලෙවි කටයුතු පුහුණු කිරීම් හා වැඩි දියුණු කිරීම්

ස්වකීය නිෂ්පාදනය, ස්පර්ෂණීය ස්වභාවයෙන් පවතින අනෙකුත් කර්මාන්තවලට සාපේක්ෂව රක්ෂණ ඔප්පු සැළසුම්, ප්‍රතිලාභ සහ තාක්ෂණික කටයුතු පිළිබඳව ගැඹුරු දැනුමක් සහිතව ඉහල මට්ටමේ කුසලතා සහ අභිප්‍රේරණ, රක්ෂණ කර්මාන්තයේ අලෙවි බලකායට අවශ්‍ය වේ. නිෂ්පාදනය ලබා දීම එය මිලදී ගන්නා කාල සීමාව තුළදී සිදු නොවන බැවින්, පාරිභෝගිකයින් පෙළඹවීමේ හැකියාව දියුණු කළ යුතු ප්‍රධාන කුසලතාවයකි. නිපුණතා සංවර්ධනය තාක්ෂණික හැකියාව වර්ධනය, කණ්ඩායම් නායකත්ව වර්ධනය සහ අලෙවි කළමනාකරණ කුසලතා වර්ධනයෙන් යුත් අඛණ්ඩ යාවත්කාලීන කිරීම් සහිත 2017 වර්ෂය සඳහා හොඳින් ව්‍යුහගත කරන ලද පුහුණු කිරීම් සහ සංවර්ධන ආකෘතින් නිර්මාණය කර ක්‍රියාවට නංවා ඇත. නියෝජිතයන්ගේ සිට ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමණාකරුවන් දක්වා අලෙවි ධූරාවලිය හරහා සියළුම මට්ටම්වලට දැනුම ලබාදෙන පාඨමාලා සමූහයක් මෙයට අන්තර්ගත වේ.

කාර්ය සාධන ක්‍රියාකාරකම්

2016 වර්ෂයේ මුල් භාගයේදී නව ව්‍යාපාරික කටයුතු වලින් කර්මාන්තය තුළ ඉහළම මූල්‍ය වර්ෂයේ වර්ධනයක් වාර්තා කිරීම සඳහා වසරේ මුල් භාගයට පණ ගැන්වීම සඳහා හොඳම වාර්ෂික අලෙවි ප්‍රවර්ධනය වූ ජීවිත අලෙවි බලකාය සඳහා ජීවිත රක්ෂණ සංසද තරඟය උපකාර විය. තවද වර්ෂය තුළදී ඵලදායිතාව සඳහා වූ ත්‍යාග සහ ජය ශ්‍රී ප්ලස් (Jaya Sri Plus) තුළින් තරඟ දියත් කරනු ලැබූ අතර, ක්‍රියාකාරී සහ ඵලදායී ශ්‍රමික පිරිස්/කණ්ඩායම් නායක මෙහෙයුම, ඉහළ ව්‍යාපාරික ප්‍රවර්තක ශක්තිය තබා ගැනීමට සහ 2016 දෙවන භාගයට යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට උපකාරී විය.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

රක්ෂණ ඔප්පු යළි නඟා සිටුවීමේ විශේෂ ව්‍යාපාරය

ලෝකය පුරා ජීවිත රක්ෂණ කර්මාන්තය තුළ ක්‍රියාවට නංවන සක්‍රීය තත්ත්වය යටතේ, ජීවිත රක්ෂණ ඔප්පු පවත්වාගෙන යාම සඳහා අපගේ පාරිභෝගිකයන් අඛණ්ඩව දිරිමත් කරනු ලබයි. 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත අංශය විසින් විශේෂ යළි නඟා සිටීමේ ව්‍යාපාරයක් නැවත දියත් කරනු ලැබූ අතර, ක්‍රියාත්මක අකර්මණ්‍ය රක්ෂණ ඔප්පු සාර්ථකව නැවත සක්‍රිය කරනු ලදි. 2017 වර්ෂය තුළදීද මෙම යළි නඟා සිටුවීමේ තත්ත්වයට පත් කිරීමේ වැඩ සටහන හඳුන්වා දීමට අපි බලාපොරොත්තු වන්නෙමු. පසුගිය මාස 36 ක කාලය තුළ දී ක්‍රියාත්මක නොවෙමින් පැවතුනා වූ ස්වකීය රක්ෂණ ඔප්පු සක්‍රීය කිරීමට ඉඩ සලසන්නා වූ පාරිභෝගිකයන් සඳහා ඉහළ ප්‍රසාද දීමනා සහිත මෙම විශේෂ රක්ෂණ ඔප්පු යථා තත්ත්වයට පත් කිරීමේ වැඩ සටහන එක් එක් කාලවල ක්‍රියාත්මක වන කාර්යක් වනු ඇත.

විකල්ප බෙදා හැරීම

බැංකු රක්ෂණ (ජීවිත)

ජීවිත රක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකු රක්ෂණය නිලධාරීන් 23 දෙනෙකු ගෙන් යුත්, ශාඛා සහිතව ලංකා බැංකුව සමඟ ප්‍රධාන ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. 2016 වර්ෂයේ පළවෙනි කාර්තුවේදී ජ්‍යෙෂ්ඨ කළමණාකරු - බැංකු රක්ෂණ - ජීවිත, පත් කරනු ලැබූ අතර, මෙම බැංකු රක්ෂණ මාර්ගයේ අලෙවි සේවක සංඛ්‍යාව ශක්තිමත් කිරීම සඳහා නව බැංකු රක්ෂණ අලෙවි නිලධාරීන් බඳවා ගැනීම ක්‍රියාවට නංවා ඇත. ශ්‍රම බලකාය වැඩි දියුණු කිරීම් සහිත නව බැංකු සමඟ අලෙවි සීමාවන් වැඩි දියුණු කිරීම සඳහා සැළසුම් සකස් කරනු ලබන අතර, ව්‍යාපාරික කටයුතු වැඩි දියුණු කරමින් සහ එක මාර්ගයක් මත රඳා පැවතීමේ අවධානම අවම කරමින්, සාම්ප්‍රදායික නොවන ප්‍රවේශ වීමේ ක්‍රියාකාරකම් මෙම බැංකු විසින් ඇතුලත් කරනු ඇත.

කණ්ඩායම් ජීවිත

රක්ෂණය සඳහා වන ප්‍රවේශ මාර්ග සංවර්ධනය කෙරෙහි තව දුරටත් අවධානය යොමු කරමින් කණ්ඩායම් ජීවිත ව්‍යාපාරික කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා කණ්ඩායම් සහ තොග අලෙවි ඒකකය ස්ථාපිත කරන ලදි. විශ්‍රාම වෙළඳපොළ, වැඩබිම් වෙළඳපොළ මගින් 2016 වර්ෂය තුලදී බිලියන 1.5 ක් සහිතව 25% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදි. එසේම විශ්‍රාම සැළසුම් කිරීම සහ අනෙකුත් අදාළ සැළසුම් සඳහා රජයේ මෙන්ම සංස්ථා අංශයේ ආයතනවල අංශ තුළ ඇති හැකියාව ඉදිරියට කරගෙන යාමට හඳුනා ගන්නා ලදි.

ශාඛා ජාලය හරහා අලෙවිකරණ ප්‍රවේශය ශක්තිමත් කිරීම

2016 වර්ෂය තුළදී මේ සඳහා අඛණ්ඩව අවධානය යොමු කරන ලදි. නව ශාඛා 20 ක් හරහා 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවා ස්ථාන ශාඛා 160 ක් දක්වා ඉහළ නැංවීම පවත්නා වර්ෂයේ ප්‍රධාන අරමුණක් වනු ඇත. එසේම කර්මාන්තයේ සංවර්ධනයට සමගාමීව පවත්නා ශාඛා ඉහළ තත්ත්වයට පත් කල යුතු අතර, පෙනුම වැඩි කර ගැනීම, අළුත් වැඩියා කිරීම සහ පහසුකම් වැඩි දියුණු කිරීම ඇතුලුව ශාඛා අඛණ්ඩව භෞතිකව සංවර්ධනය කරනු ලබයි. වර්ෂය තුළදී ඇතැම් ශාඛා උපායමාර්ගිකව ඉතා වාසි සහගත නව ස්ථානවලට මාරු කරන ලදි. ව්‍යාපාර කටයුතු වර්ධනය කිරීම සඳහා ධනාත්මකව දායක වීම මෙම කටයුතු වලින් අපේක්ෂා කෙරේ.

අලෙවිකරණ උපායමාර්ග

ජාතික රක්ෂකයා වශයෙන් සියළුදෙනා වෙනුවෙන් ලබාගත හැකි නම්‍යශීලි දැරිය හැකි ජීවිත රක්ෂණයක් පිරි නැමීමට සියළුම ප්‍රයත්නයන් සිදු කරන්නෙමු. මේ සම්බන්ධයෙන් ඉහත දැක්ම ඉටු කිරීම සඳහා අලෙවිය සහ විකුණුම් ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. විද්‍යුත්, මුද්‍රිත සහ අනෙකුත් අදාල නැගීවින මාධ්‍ය තුල ප්‍රචාරණය කිරීම තුලින් පමණක් පාරිභෝගිකයා තරමක් දුරට ජීවිත රක්ෂණ අලෙවි කිරීම කෙරෙහි තල්ලු කිරීමක් කළ හැකිය. අපගේ විකුණුම් කණ්ඩායම අභිප්‍රේරණය කිරීම සඳහා වැඩි දියුණු කරන ලද විකුණුම් ප්‍රවර්ධන සැළසුම් ඉලක්කගත කරමින් ඉදිරියට තල්ලු කිරීමේ උපායමාර්ගික අපේක්ෂාවල සිට අලෙවිකරණ වාර්ගික වැඩ සටහන් දින දර්ශනය බොහෝ වැදගත් වැඩසටහන් වලින් සමන්විත වේ. ඇතැම් ප්‍රධාන වැඩසටහන් පහත දක්වා ඇත.

- ජීවිත සන්සදය, හයමාසික තරඟය
- ශ්‍රම බලකාය සක්‍රිය කිරීම සහ ඵලදායීතා සංවර්ධනය ධෛර්යමත් කිරීමේ වාරික සැළසුම්
- වසර අවසානයේදී ශාඛා මට්ටමේ දළ ලිඛිත වාරික තරඟය
- ඩොලර් මිලියන වටමේස වැඩසටහන
- වාර්ෂික තෑග්ග ප්‍රදානය

පරිපාලිත සමාගම්වල කාර්ය සාධනය

ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පී.එල්.සී.

ලංකා හොස්පිටල්ස් සමූහය විසින් 2016 සහ 2017 වර්ෂය තුළදී ස්වකීය ඉහලම ලාභය වන රු. මිලියන 972 ක් සහ 16% ක ශේෂ පත්‍ර වර්ධනයක් වාර්තා කරන ලදී. රුපියල් බිලියන 14.5 ක් වූ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සමාගමේ ශුද්ධ අගය වන රුපියල් බිලියන 5.8 ඉක්මවන ලදී. කොටසක නෛසර්ගික වටිනාකම ඉහළ මට්ටමේ පාරිභෝගික සංතෘප්තිය පවත්නා නිපුණතා සහ විශේෂඥ ඥානය මෙන්ම ඔප්පු කරන ලද කාර්ය සාධන වලට පහසුකම් සලසන්නාවූ ආරක්ෂණ පිළිබඳ ගෝලීය පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වීම, ව්‍යුහයන්, පද්ධති සහ ක්‍රියාවලින් වැනි මූල්‍යමය නොවන වත්කම් මත පදනම් වූ ස්වකීය හැකියාව පිළිඹිඹු කරයි.

වර්ෂය තුළදී ලාභාංශ ආකාරයට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලංකා හොස්පිටල්ස් පී.එල්.සී විසින් රුපියල් මිලියන 220 ක් දායක කර ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 33% ක වර්ධනයකි.

මෙම රෝහල උපරිම ධාරිතාවයකින් ක්‍රියාත්මක වන අතර එය පුළුල් කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලබයි. රට තුළ හා විදේශවල ව්‍යාප්ත කිරීමේදී නව තාක්ෂණය සහ පුද්ගල වර්ධනය සඳහා සම්පත් වෙන් කරනු ඇත. සේවාවල විෂයපථය පුළුල් කිරීමද මෙයට ඇතුලත් වේ.

ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ්

2016 - 2017 මූල්‍ය වර්ෂය තුලදී ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් හි මුළු එල් පී ජී අලෙවිය රුපියල් මිලියන 24, 890 දක්වා 4.21% කින් ඉහළ යන ලදී.

2016 - 2017 වර්ෂ තුළදී රුපියල් මිලියන 4,847 ක බදු පෙර ලාභයක් සහ රුපියල් මිලියන 3,433 ක බදු පසු ලාභයක් ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් විසින් වාර්තා කරනු ලැබ ඇත.

සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආකාරයෙන් රුපියල් මිලියන 5,178 ක් ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ලබාදී ඇති අතර, එය 1,826% කි.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් 2016 - 17 වර්ෂය තුළ දී පෙර වසරට සාපේක්ෂව 39.3% වර්ධනයකින් යුත් රුපියල් මිලියන 1,780 බදු පෙර ලාභයක් සහ 44.2% වර්ධන පෙන්නුම් කරන ලද රුපියල් මිලියන 1,560 බදු පසු ලාභයක් වාර්තා කරනු ලැබ ඇත.

ලිට්රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම විසින් ලාභාංශ ආකාරයෙන් රුපියල් මිලියන 2,499 ක මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලබාදුන් අතර පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ එය 3.837% වර්ධනයකි.

කැනොවින් හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

දකුණ අධිවේගී මාර්ගයේ වැලිපැන්නෙහි 44 සැතපුම් කණුව ස්ථානයේ දෙපැත්තටම පිහිටා ඇති කැනොවින් ආකේඩ්, කැනොවින් හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් මෙහෙයවනු ලබයි. මෙම පරිශ්‍රය හෝජනාගාර, සුපර් මාර්කට්, බැංකු යන්ත්‍ර, රෙදි පිළි ආයතන, ප්‍රථමාධාර සහ වාහන නවතා තබන ස්ථානවලින් සමන්විත වේ.

මෙම කැනොවින් ආකේඩ් සාප්පුව 2016 -17 මූල්‍ය වර්ෂය තුළ රුපියල් මිලියන 81 ක ආදායම් උත්පාදනය කරනු ලැබූ අතර පසුගිය වසරේ රුපියල් මිලියන 77 කට ආදායමට සාපේක්ෂව 5.12% ක වර්ධනයකි. කැනෝවින් හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි පසුගිය වසරේ රුපියල් මිලියන 19 ක් වූ බදු පෙර ලාභය මේ වසරේ රුපියල් මිලියන 12 ක් විය. පසුගිය මූල්‍ය වර්ෂයේ දී සමාගමේ බදු පසු ලාභය වූ රුපියල් මිලියන 19 ට සාපේක්ෂව පවත්නා වර්ෂයේ රුපියල් මිලියන 12 ක් විය.

කැනෝවින් හොටේල්ස් ඇන්ඩ් ස්පාස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් ලාභාංෂ වශයෙන් රුපියල් මිලියන 15 ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ලබා දී ඇත.

කැන්විල් හොටේල්ස් (ප්‍රවෙට්) ලිමිටඩ්

දැනට ඉදි කරමින් පවතින ග්‍රෑන්ඩ් හයිට් කලම්බෝ හෝටලය කැන්විල් හෝල්ඩින්ස් (ප්‍රවෙට්) ලිමිටඩ් සතුවේ. මහල් 47 ක් දක්වා පැතිරෙන ප්‍රදේශය ඉදිවෙන වර්ග අඩි මිලියන 1.1 කින් සමන්විත මෙම දේපලෙහි වටිනාකම ඇ.ඩො.මිලියන 240 කි. තවත් මුළු කාමර සංඛ්‍යාව 220 කින් සමන්විත, වන අතර වැඩි පහසුකම් සහ ඉඩ සහිත කාමර පෙළ 61කින් සහ සේවා දෙපාර්තමේන්තු 100 (එකේ සිට තුන දක්වා වූ පරාශයක නිදන කාමර) සහිතව කාමර 453 ක් එම හෝටලය ට අයත්වනු ඇත. එබැවින්, කෙටිකාලීනව හා දිගුකාලීනව රැඳී සිටින වෙළඳ අංශ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙන ග්‍රෑන්ඩ් හයිට් කලම්බෝ ශ්‍රී ලංකාව තුළ එකම තරු පහේ හෝටලය වනු ඇත. 43/44 මහල්වල පිහිටුවනු ලබන හෝජනාගාර තුන ඇතුලුරැඊව හෝජනාගාර 10 ක් මෙම සුබෝපභෝගී හෝටලයට අයත්වනු ඇත. ප්‍රමුඛ පෙළේ ඇමරිකානු සත්කාර දක්වන සමාගමක් වන හයිට් හොටේල්ස් සංස්ථාව මගින් මෙම හෝටලය පාලනය කරනු ඇත.

පවත්නා මූල්‍ය වර්ෂය තුළදී මෙම හෝටලයේ මුඛ්‍ය ආකෘතිය මුළුමනින්ම අවසන් කරනු ලැබූ අතර දී ඇති අවසන් දිනය වන 2018 තුන්වන කාර්තුවේ දී ඉදි කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත් කණ්ඩායම් කීපයක් එකවර අභ්‍යන්තර ප්‍රදේශවල වැඩ කරමින් සිටිති.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවක කණ්ඩායම

අපගේ මානව සම්පත

ශ්‍රී ලංකා රක්ෂණ අංශය වැඩි වශයෙන් ඉතා තරඟකාරී තත්ත්වයට පත්වෙමින් පවතින අතර පාරිභෝගිකයන් විසින් මුදලට ඉහළ වටිනාකම් ඉල්ලා සිටිති. රක්ෂණ සැලසුම් තුළින් පමණක් නොව වෘත්තීමය හා කාර්යක්ෂම සේවාවන් තුළින් ජනතාවගේ රක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ජාතික රක්ෂකයා වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කැප වී සිටියි.

පවත්නා මූල්‍ය වර්ෂය තුළ අපගේ සේවාවන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සහ සමාගමේ සමස්ථ තරඟකාරිත්වය උසස් තත්ත්වයට පත් කිරීම සඳහා අපගේ මානව සම්පත පුහුණු කිරීම සහ ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අඛණ්ඩව සිදු කරන ලදි. දේශීය රක්ෂණ කර්මාන්තය තුළ අපගේ මානව සම්පත් පදනම වඩා හොඳම සම්පත් වලින් එකක් බව ආඩම්බරයෙන් සඳහන් කරරුන්නෙමු. තාක්ෂණික හා අධ්‍යාපනික යන දෙඅංශයෙන්ම සුදුසුකම් ලැබූ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවක සංඛ්‍යාවක් මගින් අපගේ කණ්ඩායම මෙහෙයවනු ලබන අතර සේවාවේ වෘත්තිය තත්ත්වය සහ ගුණාත්මකබව පවත්වා ගෙන යාම සඳහා අපගේ සියලුරුම සේවකයන් විධිමත් හා අඛණ්ඩ පුහුණු කිරීම් මෙන්ම කුසලතා සංවර්ධනය සඳහා යොමු කරනු ලබයි.

සාමූහික ගිවිසුම 2016 - 2019

2016 - 2019 සාමූහික ගිවිසුම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ස්වකීය සාමාජිකත්වය තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විධාය හා විධායක නොවූ කාණ්ඩ වල කාර්ය මණ්ඩලය නියෝජනය කරන්නා වූත්, ඉහත කී ගිවිසුමට අත්සන් කොට අනුමැතිය දක්වනු ලැබුවාවූත් සේවක සංගම් අතර 2017.01.11 වන දින අත්සන් තබන ලදි.

එම සාමූහික ගිවිසුම 2016.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලාත්මකවූ අතර තමන් අයත්වන වෘත්තිය සමිතිය සාමූහික ගිවිසුමට අත්සන් තැබූ පාර්ශ්වය වූවත් නොවූවත්, එය නොසලකා ඉහත කාණ්ඩ යටතට ගැනෙන සියලුරුම සේවකයන්ට සංශෝධිත ප්‍රතිලාභ විශාල ලෙස ලබාදීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකරණයේ අභිප්‍රාය වේ. සාමූහික ගිවිසුම යටතේ වන නව ප්‍රතිලාභ සේවකයන් විසින් පිළිගැනීමේ පදනම මත සමාගම තුළ කාර්මික සාමය සුරක්ෂිත කරන්නාවූ තම රැකියාවේ නියමයන් හා කොන්දේසි වලට අනුකූලව කටයුතු කිරීමට සේවකයන් බැඳී සිටින නව ගිවිසුම්වල නියමයන් ඔවුන් විසින් පිළිගෙන ඇති බවට සලකනු ඇත.

වැඩ කිරීමේ පරිචයන්

රැකියා විස්තර දැනට පවත්නා ප්‍රතිපත්ති, පරිචයන්, දැනට පවත්නා හා නව ප්‍රතිපත්ති හඳුන්වා දීම නිසා සමාගම විසින් වරින් වර වෙනස් කරනු ලැබිය හැකි වන්නාවූ පරිචයන් හෝ යහපාලන පරිචයන්ට අනුකූල වෙමින් සමාගමේ අවශ්‍යතාවයන් සරිලන පරිදි පවතින ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, පරිචයන්, රැකියා විස්තර, ප්‍රධාන කාර්ය සාධක දර්ශක (සහ කාර්ය සාධන ඇගයීම් ඇතුලුරුව) සේවකයන්ගේ රැකියා ගිවිසුම්වල නිශ්චිත නියමකර ඇත්තාවූ එකී කරුණු සමාගමේ පරිචයන් විය යුතු බවට සේවකයා සහ වෘත්තීය සමිති එකඟ වන්නේය.

කාර්යමණ්ඩල සුභසාධනය

සහනදායී මිල ගණන් වලට ගෘහ උපාංග සහ සහනදායී මිල ගණන්වලට සමාගම විසින් පවත්වානෙ යනු ලබන නිවාඩු නිකේතන වැනි ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාපිත නොවන සුභසාධන යෝජනා ක්‍රම ඇතුළත් ඔවුනගේ අභිප්‍රෙරණ මට්ටම ඉහළ තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා අප විසින් අපගේ සේවකයන්ට සුබසාධන පහසුකම් රැසක් සපයනු ලබයි. ව්‍යවස්ථාපිත සුභසාධන යෝජනාක්‍රම වලට, සේවක භාරකාර අරමුදල සේවක අර්ථසාධක අරමුදලට නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම පාරිතෝෂික ගෙවීම් සහ ප්‍රසූත නිවාඩු ඇතුළත් වේ. අනෙකුත් ව්‍යවස්ථාපිත නොවන සුභසාධන යෝජනා ක්‍රමවලට, ක්‍රීඩා සහ ව්‍යායාම කිරීමේ පහසුකම්, ආපනශාලා පහසුකම්, සේවා ස්ථානය තුළ වෛද්‍ය මධ්‍යස්ථානයේ පහසුකම්, වෛද්‍ය යෝජනා ක්‍රම, විශේෂ වැදගත් අදියර සැලකිල්ලට ගෙන සහනදායී මිල ගණන් යටතේ රක්ෂණය කිරීම සහ විවිධ සංගම් හරහා සුභසාධනය; එනම්, සකසුරුවම් සංගමය, ක්‍රීඩා සංගමය සහ පුස්තකාල සංගමය යනාදිය ඇතුළත් වේ.

සේවක විස්තර

කොන්ත්‍රාත් වර්ගය අනුව සේවක සංඛ්‍යාව

රැකියාවේ වර්ගය	2016	2015	2014
ස්ථිර කාර්ය මණ්ඩලය	2,308	2,177	2,163
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය	124	107	186
එකතුව	**2,432**	**2,284**	**2,349**

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවක කණ්ඩායම ඉතිරි කොටස.

ශ්‍රේණිය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව රැකියාව

	සංඛ්‍යාව			සංයුතිය %	
	ස්ත්‍රී	පුරුෂ	එකතුව	ස්ත්‍රී	පුරුෂ
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	14	54	68	20.6	79.4
කළමනාකරුවන	34	114	148	23.0	77.0
සහකාර කළමනාකරුවන්	42	99	141	29.8	70.2
විධායක	363	192	555	65.4	34.6
අධි ශේණි*	34	1	35	97.1	2.9
අධි ශේණි** (කුසලතා ඇති)		6	6	0.0	100.0
ලිපිකරු	649	449	1098	59.1	40.9
තාක්ෂණික නිලධාරි ශේණි		169	169	0.0	100.0
ලිපිකරු නොවන ශේණි	24	138	162	14.8	85.2
සුළු ශේණි	2	48	50	4.0	96.0
එකතුව	**1162**	**1270**	**2432**	**47.8**	**52.2**

**විධායක ශේණි වලට සමාන්තර වන්නාවූ ලිපිකරු තනතුරුවල සිට උසස්වීම් ලැබූ සේවකයන් මෙයින් නියෝජනය කරයි.*

***ලිපිකරු ශේණිවලට සමාන්තරව පවතින්නා වූ ලිපිකරු නොවන ශේණිවලින් ඉහළ මට්ටමට ලගා වූ සේවකයන් මෙයින් නියෝජනය කරයි.*

වයස් විශ්ලේෂණය

වයස් කාණ්ඩය	ස්ත්‍රී	පුරුෂ	එකතුව
අවුරුදු 18-25	81	73	154
අවුරුදු 26-35	337	408	745
අවුරුදු 36-45	252	428	680
අවුරුදු 46-55	393	278	671
අවුරුදු 55 සහ ඊට වැඩි	99	83	182
එකතුව	**1162**	**1270**	**2432**

ප්‍රදේශය අනුව සේවක සංඛ්‍යාව

ප්‍රදේශය	සේවක	
	සංඛ්‍යාව	%
අනුරාධපුරය	94	3.9
බදුල්ල	67	2.8
මධ්‍යම - i	92	3.8
මධ්‍යම - ii	51	2.1
කොළඹ - i	90	3.7
කොළඹ - ii	62	2.5
කොළඹ - iii	83	3.4
කොළඹ - iv	12	0.5
නැගෙනහිර	40	1.6
ගාල්ල	70	2.9
ගම්පහ	61	2.5
හම්බන්තොට	11	0.5
යාපනය	40	1.6
කලුතර	61	2.5
කුරුණෑගල	105	4.3
මාතර	89	3.7
මීගමුව	95	3.9
රත්නපුර	72	3.0
ප්‍රධාන කාර්යාලය	1237	50.8
එකතුව	**2432**	**100.0**

පුහුණුව

පවත්නා වර්ෂය තුළදී, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සේවස්ථ, දේශීය හා විදේශීය යන දෙයාකාරයෙන්ම සේවකයන් පුහුණු කිරීම සඳහා රුපියල් මිලියන 8.7 ක් ආයෝජනය කරන ලදි. ව්‍යාපාර කටයුතු රඳවා තබා ගැනීම හා වර්ධනය කිරීමට වැදගත් වන්නා වූ ඊළඟ මට්ටමේ කනිෂ්ඨ කළමනාකරුවන් දියුණු කිරීමට වැදගත් අවධානයක් යොමු කෙරේ. මීට අදාළව, කණිෂ්ඨ කළමනාකරුවන්ගේ කුසලතා සහ ප්‍රවීනතාවය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රමුඛ පෙලේ අධ්‍යාපන ආයතන සමඟ හවුලේ පසුගිය මූල්‍ය වර්ෂය තුලදී කළමනාකරණ සංවර්ධන වැඩ සටහන් මාලාවක් හඳුන්වා දෙන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

පුහුණු කිරීම සහ සංවර්ධන තුළ ආයෝජනය

වර්ගය	2016 (රු.)	2015 (රු.)
සේවස්ථ පුහුණුව	707,255	2,344,749
බාහිර පුහුණුවීම්	40,125	1,041,044
සමුළු	423,743	281,696
විදේශ පුහුණුවීම්	5,094,421	18,787,230
රක්ෂණ සහ වෘත්තීය අධ්‍යාපනය	2,474,365	1,296,918
වෘත්තීය සාමාජිකත්ව	1,102,642	842,616

පුහුණු වැඩසටහන්

	2016	2015
වැඩසටහන් සංඛ්‍යාව	93	95
පැය ගණන	1,151	1,459

සේවයට හඳුන්වා දීමේ වැඩසටහන්

	2016	2015
වැඩසටහන් සංඛ්‍යාව	2	0
පැය ගණන	15.5	0

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මිලියන් ඩොලර් වට මේසයට සහභාගි වෙයි.

MDRT®

Sri Lanka Insurance
Like a father - Like a mother

කැනඩාවේ වැන්කවෝර් හිදී ජූනි මස 12 සිට 15 දක්වා පවත්වන ලද ඉහල පෙළේ මිලියන් ඩොලර් රවුම් ටේබල් වාර්ෂික සමුළුව 2016 සඳහා තම ඉහළම ජීවිත රක්ෂණ අලෙවියක් සිදු කරන ලද ජයග්‍රහයකයන් 42 දෙනකු සුදුසුකම් ලබන අවස්ථාවේදී නැවත වරක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ධජය ජාත්‍යන්තර කරලිය තුළ ඉහළින්ම ලෙළ දුනි. මෙම ප්‍රමුඛ පෙළේ මූල්‍ය කර්මාන්ත වැඩ සටහනේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නියෝජනය කිරීම විශාල සුවිශේෂී අවස්ථාවකි. මිලියන් ඩොලර් රවුම් ටේබල් සඳහා පිළිග ැනීම ජීවිත රක්ෂණය සහ මූල්‍ය කර්මාන්තයේ අනෙකුත් අංශ තුළ විශිෂ්ඨයන්ගේ විශිෂ්ඨයන් සඳහා කැප කරන ලද වරප්‍රසාදයකි. සාමාජිකයන්ට සුවිශේෂී වෘත්තීය දැනුමක් අතිශය ආචාරධර්මීය කල් ක්‍රියාවෙන් සේවාවක් සතුවන බවට ජනතාවට ලබාදෙන සහතිකයකි. මෙම ඉහල පෙලේ සමුළුව සඳහා සුදුසුකම් ලැබීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ උපදේශකවරුන්ට රුපියල් මිලියන 4.8 කට වැඩි වාර්ක ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වූ අතර මිලියන 14.4 ක් සහ මිලියන 28.8 ක ඉලක්ක පසු කරනු ලැබූ රක්ෂණ උපදේශකවරුන් පිළිවෙලින් කෝට් ඔෆ් ද ටේබල් සහ ටොප් ඔෆ් ද ටේබල් සාමාජිකත්වයට සුදුසුකම් ලැබීය. රටවල් 71 ක සංවිධාන 470 කට වඩා නියෝජනය කරමින් වෘත්තිකයෝ 43,000 කට වැඩි ප්‍රමාණයක් මිලියන් ඩොලර් රවුම් ටේබල් හි සාමාජිකයෝ වෙති.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවක කණ්ඩායම ඉතිරි කොටස.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තරු සම්මාන - 2016



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විකුණුම් කණ්ඩායම් අතරින් ඉහළම ජයග්‍රාහකයන්ට ගෞරව දැක්වීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තරු සම්මාන 2016 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විකුණුම් කණ්ඩායමේ විශිෂ්ඨ සහ කැපී පෙනෙන කාර්ය සාධනය හඳුනාගැනීම හා ගෞරව දැක්වීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සංවිධානය කරන ලද තරු සම්මාන වාර්ෂික වැඩ සටහනකි. 2015 දී ස්වකීය අලෙවි කාර්ය සාධනය වෙනුවෙන් මෙම වැඩ සටහනේදී ඔවුන්ව පිළිගැනීමකට ලක්කර සම්මාන ප්‍රදානය කරනලදි. ස්වකීය විශිෂ්ඨ කාර්ය සාධනය උදෙසා සම්මාන පිරි නැමුණු රක්ෂණ නිලධාරීන් 426 වන හොඳම රක්ෂණ විකුණුම්කරුවන් සහ කණ්ඩායම් නායකයන් තරු සම්මාන උළෙල තුලින් දැකගත හැකි විය. දෙන ලද ඉලක්ක සහ ප්‍රමිති අත්පත් කර ගැනීම පදනම්කරගෙන ඔවුන්ට එම සම්මාන පිරිනමන ලදි. පළමු සහ දෙවන ස්ථාන ලබා ගත් ජයග්‍රාහකයන්ට සම්මාන පිරිනැමුණ අතර ස්වකීය සගයන්ගේ ජයග්‍රහණවලට ප්‍රශංසා කිරීමට ඔවුන් රැඳී සිටින ලදි.

හොඳම කලාප අලෙවි කළමණාකරුවන්, අලෙවි කළමණාකරුවන්, කණ්ඩායම් නායකයන් හා උපදේශකවරුන් ස්වකීය අදාල ව්‍යාපාරික කාණ්ඩ එනම් ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ කටයුතු යටතේ සහතිකපත් සහ මුදල්ත්‍යාග වලින් ඇගයීමට ලක්විය. ඊට අමතරව මෙම කාණ්ඩ යටතේ විශිෂ්ඨයන්ගේ විශිෂ්ඨයන්ට සම්මාන හා සමරු තිලිණයක් ලැබුණි.

ජයග්‍රාහකයින්ගේ සංගමය ප්ලැටිනම් ස්ටාර් සමාජය, පැලැටිනම් සමාජයේ සාමාජිකයන් විසින් මෙම වැඩ සටහනට සුභාශිංසන චික් කළ අතර, 2016 ජූනි මාසයේදී කැනඩාවේ වැන්කූවර්හිදී පවත්වන ලද ජාත්‍යාන්තර මිලියන් ඩොලර් රවුම් ටේබල් සමුළුවට සහභාගි වූ ආයතනයේ සාමාජිකයන් 42 දෙදෙනාටද මෙම උත්සවයේදී සම්මාන පිරිනමන ලදි. මෙම ගෞරවනීය උත්සවයේදී සම්මාන ලැබූ අනෙකුත් ජයග්‍රාහකයන් වූයේ ආයතන ව්‍යාපාරික සංවර්ධන අංශය තාක්ෂණික අලෙවි අලෙවි අංශය සහ මූල්‍ය ව්‍යාපාරික සංවර්ධන අංශයේ සාමාජිකයන්ය. මෙම වැඩසටහනේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ ගරු රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය කබීර් හසීම් මැතිතුමා වන අතර රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු වීරාන් වික්‍රමරත්න සහ අමාත්‍යාංශ ලේකම්, රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා විශේෂ ආරාධිතයන් ලෙස මෙයට සහභාගි විය.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති අමරසූරිය මහතා ප්‍රමුඛ අධ්‍යක්ෂක මණ්ඩලය ආයතන කළමනාකරණය, අලෙවි උපදේශකවරුන් සහ සේවකයන් මේ අවස්ථාවට සහභාගි විය. දිවයින පුරා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සාමාජිකයන් 1600 කට වැඩි ප්‍රමාණයක් මෙම වැඩසටහනට පැමිණෙන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

සමායතනික සමාජ වගකීම

වාර්ෂිකව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් බොහෝ පරාර්ථකාමී වැඩසටහන් සඳහා දායකත්වය සපයන අතර, බොහෝ ව්‍යාපෘතිද පවත්වාගෙන යයි. මෙම ක්‍රියාකාරකම් වලින් කීපයක් පහත විශේෂයෙන් දක්වා ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සුභ පැතුම් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ තුන්වන ශිෂ්‍යත්ව පිරි නැමීමේ උත්සවය නෙලුම්පොකුණ රඟහලේදී නොවැම්බර් මස පවත්වන ලද අතර එහිදී දිස්ත්‍රික්ක 25 කින් තෝරාගත් ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව 307 ක් පිරිනමන ලදි.

අධ්‍යාපනිකව යහපත් පරම්පරාවක් පෝෂණය කිරීම සඳහා වූ පරිශ්‍රමයකින් 2013 ජූනි මාසයේදී මෙම අද්විතීය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය දියත් කරන ලදි. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේදී ඉහළම ලකුණු ලබා ගත් 4 දෙනෙකුටත් අ.පො.ස සාමාන්‍ය පෙළ විභාග යේදී දිස්ත්‍රික් මට්ටමින් ඉහළම ලකුණු ලබාගත් ශිෂ්‍යයන් හතර දෙනෙකුට ජීව විද්‍යා, ගණිතය, වාණිජ සහ කලා ධාරාවෙන් ඉහළම ලකුණු ලබාගත් ශිෂ්‍යයන්ගෙන් 25 දෙනෙකුගෙන් සමන්විත අ.පො.ස උසස් පෙළ විභාගයේදී ඉහළම ලකුණු ලබාගත් ශිෂ්‍යයන් 100 දෙනෙකුට මූල්‍යමය ශිෂ්‍යත්ව පිරි නමන ලදි. පහ වසර ශිෂ්‍යාධාරය එක් ශිෂ්‍යයෙකුට රුපියල් 20,000 බැගින් වන අතර සාමාන්‍ය පෙළ ශිෂ්‍යාධාරය එක් ශිෂ්‍යයෙකුට රු. 40,000 ක් ද උසස් පෙළ සමත් සිසුන් සඳහා එක් ශිෂ්‍යයෙකුට රු. 50,000 බැගින් පරිත්‍යාග කරන ලදි.

ශිෂ්‍යයන්ගේ දෙමාපියන් හෝ භාරකරු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත රක්ෂණ ඔප්පු හිමියෙක් නම්, ළමයා විසින් ඊළඟ ජාතික මට්ටමේ විභාගයට පෙනී සිටින තුරු වාර්ෂික ගෙවීමක් වශයෙන් ප්‍රතිලාභය අඛණ්ඩ කාල පරිච්ඡේදයක් පිරිනමනු ඇත. සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් විසින් ශිෂ්‍යත්වය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සුභපැතුම් ශිෂ්‍යයන් සඳහා ඉල්ලුම් කළ යුතුය.

රුපියල් මිලියන 18 ඉක්මවන්නා වූ මුළු ශිෂ්‍යත්ව වටිනාකමකින් යුතු, සැම වසරකම ශිෂ්‍යයන් 300 දෙනෙකුට ආධාර ලබා දෙන්නා වූ රක්ෂණ කර්මාන්තය තුළ ඇති එවැනි යෝජනා ක්‍රම වලින් ඉහළම ප්‍රතිලාභ ලබාදෙන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය මෙම යෝජනා ක්‍රමයයි.

පරිත්‍යාග කිරීමට අමතන්න



2016 නොවැම්බර් 1 වන දින ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් දියත් කරන ලද ඇමතුමක් ලබා දී පරිත්‍යාග කිරීමේ ව්‍යාපාරය, එය අවසන් කිරීමට නියමිතව තිබූ නොවැම්බර් 30 වන දිනට කළින් සති දෙකක් වැනි කෙටි කාල පරාශයක් තුළ ප්‍රතිචාර නොදැක්වූ දුරකථන ඇමතුම් 500,000 කට වැඩි ප්‍රතිශතයක් ආකර්ෂණය කර ගනිමින් අද්විතීය ලෙස සාර්ථකත්වයට පත්විය. මහරගම පිහිටි පිළිකා ආයතනයට ලබා දීම සඳහා CRAT යන්ත්‍රය(CRAT - Continuous Renal Replacement Therapy) මිළදී ගැනීමට මුදල් සපයා දීම සඳහා වන ව්‍යාපෘතියට ජනතාව සම්බන්ධ කර ගැනීම උදෙසා ඇමතුමක් ලබාදී පරිත්‍යාග කිරීමේ ව්‍යාපෘතියී මගින් ප්‍රතිචාර නොදැක්වූ දුරකථන ඇමතුමක් යන නව යාන්ත්‍රණය භාවිතා කරන ලදි. දුරකථන අංක 1357 මගින් ජනතාවට ප්‍රතිචාර නොදැක්වූනු ලබන දුරකථන ඇමතුමක් ලබා දීමට හැකිවූ අතර එවැනි සෑම ප්‍රතිචාර නොදැක්වූ දුරකථන ඇමතුමක් සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මහරගම පිළිකා රෝහලට රුපියල් 10 ක් පරිත්‍යාග කරන ලදි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පසුගිය වසරේදී නොවැම්බර් මස දී හඳුන්වා දෙන ලද ව්‍යාපාරයට ආධාර කිරීම සඳහා පළමු දුරකථන ඇමතුම මගින් පිළිකා රෝහල වෙත රුපියල් මිලියන 3.5 ක් පරිත්‍යාග කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ඉඩ ප්‍රස්ථා සලසමින් ප්‍රතිචාර නොදක්වනු ලබන දුරකථන ඇමතුම් 350,000 පමණ ආකර්ෂණය කර ගන්නා ලදි. එහි සාර්ථකත්වය මගින් දෙවන අදියරේදී එය තවදුරටත් ප්‍රතිචාර නොදක්වනු ලබන දුරකථන ඇමතුම් 500,000 දක්වා පුළුල් කිරීමට අනුබල දෙනලදි.

පළමු අදියරේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් රුපියල් 775,000 වටිනා CPAP යන්ත්‍රයක් රුපියල් මිලියන 1.8 වටිනා Prosthetic Limbs සහ පිළිකා රෝගීන්ට ඉතාමත් අවශ්‍ය ඖෂධ පරිත්‍යාග කරනලදි. CPAP යන්ත්‍රය මගින් පීඩාවට පත් පිළිකා රෝගීන්ට නිදා ගන්නා අතරතුර ආශ්වාස ප්‍රාස්වාශ කිරීමට පහසු කරවයි. පිළිකා රෝහලට එවැනි උපකරණයක් මීට පෙර තිබී නොමැත.

සමායතනික සමාජ වගකීම ඉතිරි කොටස.

වෛද්‍යවරුන් හඳුනාගත් පරිදි පිළිකා රෝහලේ ඉතා වැදගත් අවශ්‍යතාවලින් එකක් වනුයේ, අසාධ්‍ය පිළිකා රෝගීනට ස්වකීය වකුගඩුවල ක්‍රියාකාරිත්වයට ආධාර වන්නාවූ (CRRT - Cantinuous Reneel Replacement Therapy) යන්ත්‍රයයි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ව්‍යාපාරයට පරිත්‍යාග කිරීම සඳහා වන දෙවන දුරකථන ඇමතුම CRRT යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම සඳහා අරමුදල් රැස් කිරීමට කැපකරන ලදි.

පරිස්සමෙන් ගිහින් එන්න ව්‍යාපෘතිය



ශ්‍රී ලංකා රජයේ අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් " පරිස්සමෙන් ගිහින් එන්න" මාර්ග ආරක්ෂක වැඩ සටහන දියත් කිරීමේ අවස්ථාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සම කළමනාකරණ අධ්‍යක්ෂක කිත් බර්නාඩ් මහතා ද මේ අවස්ථාවට සහභාගි වී සිටී.

2015 වසරේදී ශ්‍රී ලංකාව තුළ මාර්ග අනතුරු හේතුවෙන් සිදුවූ මරණ සංඛ්‍යාව 2,722 දක්වා ඉහළ ගිය අතර එයින් 814 ක් පාපැදිකරුවන්ද, 777ක් පදිකයන්ද 486 ක් ත්‍රීරෝද රථයේ ගමන් කරන ලද මගීන්ද විය. සෑම දිනකම මාර්ග අනතුරු නිසා පුද්ගලයන් 08 දෙනෙකු මරණයට පත්වේ. සෑම වසරකම හදිසි අනතුරු 40,000 කට වැඩි ප්‍රමාණයක් පොලිසියට වාර්තා වන අතර, බොහෝ අනතුරු වාර්තා නොවේ. මාර්ග හදිසි අනතුරු මරණ සංඛ්‍යාව වාර්ෂිකව 300 කින් පමණ වැඩි වීමක් තිබේ.

"පරිස්සමින් ගිහින් එන්න" වැඩ සටහන් ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වය යටතේ කොළඹ නිදහස් චතුරස්‍රයේදී දෙසැම්බර් පළවන දින ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ "මෝටර් ප්ලස්" බැනරය යටතේ දියත් කරන ලදි. එම වැඩ සටහන එම අවස්ථාවේදී ම කොළඹ හා ගම්පහ නගරවලදී ද දියත් කරන ලදි. මෙම වැඩ සටහනේ අරමුණ වූයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජනතාව දැනුවත් කිරීමයි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා පොලීසිය සමඟ ඒකාබද්ධ වී මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි.

රියදුරන් සඳහා සෞඛ්‍ය කඳවුරු, බස් රියදුරන් සහ කොන්දොස්තරවරුන් සඳහා වැඩමුළු, පාසැල්තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ සහ දැන්වීම් පුවරු එකී සංකල්පය විදහා දක්වමින් වීදි නාට්‍යය ඇතුළුව මාර්ග සළකුණු, පාර මාරුවීම් සහ මාර්ග ආරක්ෂක කව මෙම වැඩ සටහනට ඇතුලත් වේ.

මෝටර් රක්ෂණ සැපයීමේ ප්‍රමුඛයා වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෝටර් ප්ලස් අංශය මාර්ග ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේදී නිරන්තරයෙන්ම ඉදිරියෙන් සිටී. රක්ෂණ වෙළඳපොළ ඉහළ පරිපූර්ණ මෝටර් රක්ෂණ විසදුම් ලබාදෙන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මෝටර් ප්ලස් මගින්, දීපව්‍යාප්ත ආවරණය, පැය 24 පුරා සේවය, කැමති රක්ෂණ සැලසුම් තෝරා ගැනීමේ ලිහිල් බව, ප්‍රමාදයකින් තොරව තුන්වන පාර්ශව හිමිකම් ගෙවීම් සහ කැපවූ සහ පූර්වගාමී පාර්හෝගික සේවා කණ්ඩායම් වැනි රක්ෂණ ඔප්පු හිමියන්ට විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් පිරි නමයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

සංස්කෘතික උත්සව පෝෂණය කිරීම



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සම කළමනාකරණ අධ්‍යක්ෂවරුන් වන ටී.එම්.ආර්.බන්ස ජයා මහතා සහ කිත් බර්නාර්ඩ් මහතා මෙන්ම අනෙකුත් නිලධාරීන් අනුරාධපුරයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා වෙළඳ කුටිය තුළ බෞද්ධ, හින්දු හෝ වෙනත් ආගමක් හෝ වේවා දිවයිනේ සංස්කෘතික උරුමයන් ප්‍රවර්ධනය කිරීමේ හා නඟා සිටුවීමේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නිරන්තරයෙන්ම ඉදිරියෙන්ම සිටියි.

ජූනි මාසය තුළදී අනුරාධපුරයේදී පොසොන් පෝය නිමිති කරගෙන පවත්වන ලද උත්සවවලදී ස්වකීය මැදිහත් වීම සමඟ මෙම අංශය තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කටයුතු ආරම්භ විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ප්‍රාදේශීය සභාව සහ පොලිසියේ සහයෝගයෙන් අතරමංවූ හෝ ස්වකීය පවුල් හෝ කණ්ඩායම් වලින් වෙන්වූ වන්දනාකරුවන්ට ස්වකීය කණ්ඩායම් සමඟ නැවත එකතු වීමට සහයෝගය දැක්වීම සඳහා සේවා සපයන ලදි. අනුරාධපුරයේ පොසොන් උත්සව වලට අදාළව වැදගත් ආගමික ස්ථානවල, උදා : අටමස්ථානය සිට, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වසර 30 කට වැඩි කාලයක් තිස්සේ මෙම සේවාව සපයමින් සිටියි.

ජූලි මාසය තුළදී රුහුණු මහා කතරගම දේවාලය, දෙවිනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලවල ඇසළ පෙරහැර වලදීද, මෙය අනුගමනය කරන ලදි. මෙම උත්සව සඳහා රටේ බෞද්ධ සහ හින්දු ප්‍රජාවන් සහභාගි වෙති. දන්තධාතූන් වහන්සේ වැඩ සිටින මහනුවර බෞද්ධයන්ගේ පූජනීය දන්තධාතූන් වහන්සේ සහ දළදා මාළිගය ට ගෞරව දැක්වීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන මහනුවර ඇසළ පෙරහැරෙන් උත්සව සමය අවසන් වේ. ලෝකයේ උත්කෘෂ්ඨ පෙරහැරවලින් එකක් වන මෙම පෙරහැර සුප්‍රසිද්ධ එකක් වන අතර, එමඟින් ලෝකය පුරා නරඹන්නන් ආකර්ෂණය කර ගනියි.

අනුග්‍රහකයෙක් වශයෙන් කටයුතු කිරීමට අමතරව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කාර්යය භාරයට පෙරහැරට සහභාගිවන සියළුම තැනැත්තන්, නිලධාරීන් සහ සියළුම නරඹන්නන් පෙරහැර භූමියේ සිටින සියළුම දෙනාට රු. 50,000 ක් වටිනා පෞද්ගලික හදිසි අනතුරු ආවරණයක් පිරිනැමීම ඇතුලත් වේ. "ඉර හඳ පවතින තුරු" රක්ෂණ සැළසුම යටතේ දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මෙම සේවාව ලබා දී ඇත.


මෙම වැඩසටහන් වලදී, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියෝජනය, එම වැඩසටහන්වලට සහභාගිවන අයගේ සාර්ථකත්වයට දායකවීම පමණක් නොව දිවයිනේ විවිධ ප්‍රජාවන්ගේ සාම්ප්‍රදායික පූජා විධි, සංස්කෘතික සිරිත් සහ උරුමයන් බොහෝ අනාගත පරම්පරාවන්ගේ ආශ්වාදය උදෙසා සුරක්ෂිතව පවතින බවට ද තහවුරු කරයි.

පාලනය සහ අභ්‍යන්තර පාලනය

සමායතන පාලනය

අප ආයතනයේ සමායතන පාලන රාමුව මඟින් ආයතනයේ දිගුකාලීන අරමුණු ලඟා කර ගැනීමේදී මෙන්ම ආයතනයට අනුබද්ධිත පාර්ශවකරකුවන්ගේ විශ්වාසය තහවුරු කිරීම හා ධනාත්මක ආයෝජන ප්‍රවාහයන් තහවුරු කර ගැනීමේදී ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසයි. මෙයට අමතරව, සමායතන පාලන රාමුව මඟින් දිගුකාලීන ආයෝජන ප්‍රතිපත්තති, නුබුන්වත් අවදානම් හා ප්‍රාරක්ෂණ අවදානම් විචක්ෂණශීලීව අධ්‍යයනය කර යහපත් මට්ටමක පවත්වාගෙන යාමට සහාය වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව විසින් ඒකාබද්ධව 2013 දී නිකුත් කරන ලද සාංගමික යහපැවැත්ම උදෙසා වන ප්‍රශස්ථ භාවිතයන් පිළිබඳ සංග්‍රහය මඟින් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත මාර්ගෝපදේශකත්වය සපයනු ලබයි.

සමායතන රාමුව මඟින් ස්ථානය කරන ලද අධ්‍යක්ෂක මණ්ඩලය, කොටස්කරුවන් හා අනෙකුත් පාර්ශව අතර පවතින මූලික සම්බන්ධතාවය පහත දක්වා ඇති වගුවෙන් නිරූපනය කරයි.



අධ්‍යක්ෂක මණ්ඩලය

ආයතනයේ සමස්ත භාරකාරිත්වයට අධ්‍යක්ෂක මණ්ඩලය වගකියන අතර සෘජුව හා මාණ්ඩලික අනු කමිටු හරහා වක්‍රව දිගුකාලීන වටිනාකම් කොටස්කරුවනට් ලබා දීමට කටයුතු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයට අධීක්ෂණ කටයුතු සැළසුම් කිරීම හා තීරණ ගැනීමේ කටයුතු පහසු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනු කමිටු පිහිටුවා ඇත. ඒවා නම් විගණන අනුකූලතා කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව, ආයෝජන කමිටුව සහ මානව සම්පත් කමිටුවයි. මෙම අනු කමිටු පාලනය වනුයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්ති, ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ග මඟින් වන අතර එම කමිටු සාමාජිකත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

අධ්‍යක්ෂක මණ්ඩල අනු කමිටු

ඉහත සඳහන් අනු කමිටුවල සභාපතිවරයා ලෙස කටයුතු කරනුයේ විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකි. විගණන හා අනුකූලතා කමිටුව සම්පූර්ණයෙන්ම සමන්විත වනුයේ විධායක නොවන අධ්‍යක්ෂකවරුන් විසිනි. මානව සම්පත් අනු කමිටුවේ සභාපති ධූරය උසුළනුයේ විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු වන අතර විධායක අධ්‍යක්ෂකවරු මෙන්ම විධායක නොවන අධ්‍යක්ෂකවරුද එහි සාමාජිකත්වය දරයි. කෙසේ නමුත් යහපාලන මූලධර්ම පදනම් කරගෙන විධායක අධ්‍යක්ෂකවරු ඔවුන්ගේ වැටුප් තීරණය කිරීම සම්බන්ධව සහභාගි නොවේ. විධායක අධ්‍යක්ෂකවරුන්ගේ වැටුප් තීරණය කරනු ලබන්නේ විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වන අතර ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ එකඟතාව ලබා ගනී.

2016 වසරේ පැවති අධ්‍යක්ෂක මණ්ඩල සහ අනු කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ මෙම රැස්වීම්වලට සහභාගි වූ එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් - 2016

2016 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 6 ක් පවත්වන ලදී.

අධ්‍යක්ෂවරයාගේ නම	පැමිණීම
හේමක ඩී. එස්. අමරසූරිය මහතා (සභාපති)	06
ටී.එම්.ආර්. බන්ස ජයා මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)	06
මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	05
පී. අල්ගම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	05
කිත් ඩී. බර්නාර්ඩ් මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)	05
අසේල එස්. පද්මපෙරුම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	04
ප්‍රදීප් ඒ. ලියනමාන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	04

(කිත් ඩී. බර්නාර්ඩ් මහතා 2016.12.20 දින සමාගමේ සේවයෙන් ඉවත් වූ අතර ඩී.බී. අරුණ පී.එස්. සිරිවර්ධන මහතා 2016.12.20 දින පත් කරන ලදි)

විගණන සහ අනුකූලතා රැස්වීම් (ACCM) - 2016

2016 වර්ෂය තුළදී විගණන සහ අනුකූලතා රැස්වීම් 4ක් පවත්වන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත පී අල්ගම මහතා සමිතියේ සභාපති ලෙස කටයුතු කරන ලදි.

අධ්‍යක්ෂකවරයාගේ නම	පැමිණීම
පී. අල්ගම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	04
මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	04

ආයෝජන කමිටු රැස්වීම් - 2016

2016 වර්ෂය තුළදී ආයෝජන කමිටු රැස්වීම් 24 ක් පවත්වන ලද අතර විධායක නොවන අධ්‍යක්ෂක ප්‍රදීප් ඒ. ලියනමාන මහතා කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදි.

අධ්‍යක්ෂවරයාගේ නම	පැමිණීම
හේමක ඩී. එස්. අමරසූරිය මහතා (සභාපති)	19
ටී.එම්.ආර්. බන්ස ජයා මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)	18
ජී.පී.ජේ. පෙරේරා මහතා (විධායක අධ්‍යක්ෂ)	09
ප්‍රදීප් ඒ. ලියනමාන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	13
කිත් ඩී. බර්නාර්ඩ් මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)	16

(ජී.පී.ජේ. පෙරේරා මහතා 2016.03.01 දින සිට සහ කිත් ඩී. බර්නාර්ඩ් මහතා 2016.12.20 දින සිට සමාගමේ අධ්‍යක්ෂ ධූරවලින් ඉවත් විය)

අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් - 2016

2016 වර්ෂයේ දී අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වන ලද අතර විධායක නොවන අධ්‍යක්ෂක මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදි. මෙම කමිටුවේ සාමාජිකත්වය පුළුල් පරාසයක් නියෝජනය කරන අතර, මූල්‍ය, ආයෝජන, ජීවගණකඥ, ප්‍රතිරක්ෂණ, අනුකූලතා, අභ්‍යන්තර විගණනය, මානව සම්පත් කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවල අවදානම් කළමනාකරණ කළමනාකරුවන් ඊට ඇතුළත් වේ.

අධ්‍යක්ෂවරයාගේ නම	පැමිණීම
හේමක ඩී. එස්. අමරසූරිය මහතා (සභාපති)	02
ටී.එම්.ආර්.බන්ස ජයා මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)	03
මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	03
පී. අල්ගම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	02

මානව සම්පත් කමිටු රැස්වීම් - 2016

2016 වර්ෂය තුළදී මානව සම්පත් කමිටු රැස්වීම් 04 ක් පවත්වන ලද අතර විධායක නොවන අධ්‍යක්ෂක මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදි.

අධ්‍යක්ෂවරයාගේ නම	පැමිණීම
මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	04
අසේල පද්මපෙරුම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	00
කිත් ඩී. බර්නාර්ඩ් මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)	01

(කිත් ඩී. බර්නාර්ඩ් මහතා 2016.12.20 දින සිට සමාගමේ සේවයෙන් ඉවත් විය)

අනෙකුත් මෙහෙයුම් කමිටු

ඉහත සඳහන් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවලට අමතරව, තවත් මෙහෙයුම් කමිටු පවතී. ඒවා නම් විගණන පසු විපරම් කමිටු, ශාඛා කළමනාකරණ පරීක්ෂා කිරීමේ කමිටු, කළමනාකරණ කමිටුව, නීති කමිටු සහ අලෙවි සහ අලෙවිකරන සමාලෝචන කමිටුව වේ. මේ සියල්ල පාලන ව්‍යුහය තුළ අත්‍යාවශ්‍ය කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

අධ්‍යක්ෂක මණ්ඩලය



01

හේමක ඩී.එස්. අමරසූරිය
සභාපති



02

ටී.එම්.ආර්. බන්ස ජයා මහතා
සම කළමනාකාර අධ්‍යක්ෂ



03

අරුණ සිරිවර්ධණ මහතා
සම කළමනාකාර අධ්‍යක්ෂ



04

විද්‍යාජෝති මහාචාර්ය ලාල් චන්ද්‍රසේන මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248



05

ප්‍රියංග අල්ගම මහතා
විධායක නොවන අධ්‍යක්ෂ



06

සංජය පද්මපෙරුම මහතා
විධායක නොවන අධ්‍යක්ෂ



07

ප්‍රදීප් ලියනමාන මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

අධ්‍යක්ෂක මණ්ඩලය ඉතිරි කොටස.

01. හේමක ඩී.එස් අමරසූරිය මහතා
සභාපති

ගෞරවයට පාත්‍රවූ වෘත්තිකයකු වන හේමක අමරසූරිය මහතා කොළඹ රාජකීය විද්‍යාලයේ අභිමානයක් වන අතර ක්‍රියාශීලී පරිපාලකයකු වශයෙන් ඔහු සිය වෘත්තීය ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ සිංගර් සමූහ ව්‍යාපාරයේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කර ඇති අතර ජාතික සංවර්ධන බැංකුව, පීවිල්සී හි සභාපතිවරයාද විය. බාටා ෂූ කම්පනි ඔෆ් සිලෝන් ලිමිටඩ්, බාටා එක්ස්පෝර්ට් (ප්‍රයිවට්)ලිමිටඩ්, ඒසීවිල් කේබල්ස් පීවිල්සී, සී.ඩබ්ලිව් මැකී පීවිල්සී, ලංකා ඇල්මිනියම් පීවිල්සී ඇන්ඩ් ඒඩීඑම්ඊ ප්‍රින්ටිං ඇන්ඩ් පැකේජ් පීවිල්සී සහ අනිකුත් ලැයිස්තුගත නොකළ සමාගම්වල අමරසූරිය මහතා විසින් අධ්‍යක්ෂ ධූර දරනු ලබයි. ඔහු ර්ටෙයිල් හෝල්ඩිං ලිමිටඩ් අ.වි.ප. සිංගර් ආසියා ලිමිටඩ් හි උප සභාපති වශයෙන් කටයුතුකරනු ලැබූ අතර ලොව පුරා සිංගර් බිස්නස් කවුන්සලයෙහි හිටපු සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත.

ඔහු ශ්‍රී ලංකා කර්මාන්ත සංගමයේ ආරම්භක සභාපතිවරයා ද වේ. දැනට අමරසූරිය මහතා දකුණු පළාත් කර්මාන්ත සංවර්ධන හා වාණිජ අමාත්‍යාංශයේ, ප්‍රාදේශීය වෙළඳ සේවා කමිටුවේ සභාපතිවරයා වශයෙන් සේවය කරයි. ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා සෞඛ්‍ය සංගමයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කර ඇති අතර විවිධ අවස්ථාවලදී විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ සමාගම් නීතිය පිළිබඳ උපදේශක කමිටුවේ සේවය කර ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙක් වන අතර එක්සත් රාජධානියේ වරළත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, ගෝලීය වරළත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ මෙන්ම එක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරළත් ආයතනයේ සාමාජිකයෙක්ද වේ.ඔහු ඇ.වි.ප. නිව්යෝක් විශ්ව විද්‍යාලයේ අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙක්ද වේ. වරළත් අලෙවිකරණ ආයතනයේ ආසියාව තුළ අලෙවිකරණය සම්බන්ධයෙන් ඔහුගේ දායකත්වය උදෙසා (ශ්‍රී ලංකා කලාපය) ආරම්භ සභාපතිවරයා වශයෙන්ඔහුව පත්කිරීම මගින් සහ ආසියානු අලෙවිකරන කොන්ග්‍රසය විසින් අලෙවිකරණ නායකත්වයට පත් කිරීම මගින් සහ පාරභෝගික වෙළඳපොල තුල විප්ලවීය වෙනස්කම් ඇති කරමින් අලෙවිකරන වෘත්තියට ඔහු විසින් සිදුකරන ලද අනර්ඝ දායකත්වය උදෙසා, එක්සත් රාජධානියේ අලෙවිකරණය පිළිබඳ වරළත් ආයතනය මගින් ඔහු දූරදර්ශී ව්‍යාපාරික නායකයා වශයෙන් නම් කිරීම මගින් අලෙවිකරන ක්ෂේත්‍රය තුළ ඔහුගේ කාර්යභාරය පිළිගැනීමකට ලක්කර ඇත.

රටේ පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශ තුළම දසක කීපයක් පුරාවට කීර්තිමත් වෘත්තියක් තුළින් වෘතිතියට සහ පොදු ජනතාවට කරන ලද ඔහුගේ සේවය ඇගයීමට ලක් කරමින් ශ්‍රී ලංකා වරලත් ඝනකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් 2011 වසරේදී විශිෂ්ඨත්වය උදෙස වන යාවජීව සම්මානය ඔහු වෙත පිළිගන්වන ලදි. ඊට අමතරව, කළමනාකරණ ගණකාධිකාරී වරුන්ගේ වරලත් ආයතනය විසින් 2013 වසරේ ජනප්‍රිය ව්‍යාපාරිකයාට හිමි සම්මානය ඔහු වෙත පිරිනමන ලදී.

එසේම, ඔහු විශිෂ්ඨ හා අද්විතීය ක්‍රීඩකයෙක් ද වේ

---

02. ටී.එම්.ආර්. බන්ස ජයා මහතා
සමකළමනාකාර අධ්‍යක්ෂ

පොලිස් සේවයේ වසර 29ක අත්දැකීම් ඇති ටී.එම්.ආර්. බන්ස ජයා මහතා අධිකාරීලත් විශ්‍රාමික පොලිස් නිලධාරියෙකි. පොලිස් දෙපාර්තමේන්තුවේ ඔහුගේ සේවා කාලය තුළ, නියෝජ්‍ය කතානායකවරයා සහ උතුරු - නැ[illegible]නහිර ආණ්ඩුකාරවරයා වෙනුවෙන් ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වශයෙන් කටයුතු කර ඇත.

කුරුණෑගල ශාන්ත අන්තෝනි විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයකු වන අතර කොළඹ ඇක්වයිනාස් විද්‍යාලයේදී වැඩිදුර අධ්‍යාපනය හදාරා ඇත. ඔහු ස්වකීය පාසැල් දිවිය තුළ ක්‍රිකට් සහ පාපන්දු ඇතුලු ක්‍රීඩාවලදී විශිෂ්ඨ දක්ෂතා දක්වා ඇත. ඔහු පාසැලේ කැඩෙට් කණ්ඩායමේ සාමාජිකයෙක් වශයෙන්ද කටයුතු කර ඇත. පාසැල් කටයුතු වලින් පසු ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයෙහි නීති උපාධිය සම්පූර්ණ කර ඇත.

බන්ස ජයා මහතාට ඉදිකිරීම් කර්මාන්තයේ වසර 15 කට වැඩි අත්දැකීම් ඇති අතර ඔහු ප්‍රකට ෆයිලි සමාගමක ප්‍රධාන හවුල්කරුවෙක් වේ. ජයා මහතා කොළඹ ඩොක්යාඩ් පීවිල්සී, මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කරයි.

ඔහු සිලෝන් ඇසෙස් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්හි සභාපතිවරයාද වේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

03. අරුණ සිරිවර්ධන මහතා

සම කළමනාකාර අධ්‍යක්ෂ

අරුණ සිරිවර්ධන මහතා ශ්‍රී ලංකාවේ පමණක් නොව දකුණු සහ නැගෙනහිර ආසියාවේ ප්‍රථම සෙලියුලර් විදුලි සංදේශන සේවා සපයන්නාවූ සෙල්ටෙල් ලංකා ලිමිටඩ් (වර්තමානයේ එට්සලාට්) හි සම ආරම්භක සහ ප්‍රථම සභාපතිවරයා විය. මෙම ජාලය දියත් කිරීම සඳහා 1980 දශකයේ අගභාගයේදී යූඑස් මිලිකොම් ඉන්ටනැෂනල් හඳුන්වා දීම සඳහා ඔහු විසින් මූලිකව කටයුතු කරන ලදි.

රටතුළ සායනික අත්හදා බැලීමේ ප්‍රතිකාර පවත්වාගෙන යාම සඳහා රජය විසින් අනුමත කරන ලද පළමු සමාගම වන රෙමෙඩියම් වන් ලිමිටඩ් ආයතනයේ ඔහු (Remedium one Ltd) සම ආරම්භකයා මෙන්ම අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරියාද වන අතර ඩිජිටල් ඉන්ෆොමේෂන් ටෙක්නොලජීස් ලිමිටඩ්, ප්‍රසිසන් මෝටර්ස් ලිමිටඩ්, ඩයිනනෙට් ලිමිටඩ් සහ ඉන්ටප්‍රයිට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් සේවය කර ඇත. අරුණ සිරිවර්ධන මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ සහ කොළඹ විශ්ව විද්‍යාලයේ රංග කලා ආයතනයේ ආර්ථික දේශකයකු වශයෙන් ද සේවය කරයි. එසේම ඔහු ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීවිල්සී හි අධ්‍යක්ෂවරයෙක් ද වේ.

සිරිවර්ධන මහතා හිටපු ඉහළ පෙළේ සිවිල් නිලධාරියෙකු වන නැසීගිය ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන මහතාගේ සහ කතෘවරයෙකු මෙන්ම අධ්‍යාපනවේදිනියක වන නැසීගිය එලීන් සිරිවර්ධන මැතිණියගේ පුත්‍රයා වේ. ඔහු ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන අතර කීර්තිමත් සංගීතඥයකු මෙන්ම ජේස් අන්ලිමිටඩ්හි සභාපතිවරයාද වේ. සංගීතයට තමා තුළ ඇති ආදරය ඊළඟ පරම්පාරවට ලබා දීම සඳහා ශාස්තු අයකිරීමකින් තොරව ඔහු ශිෂ්‍යයන්ට ඔහුගේ සංගීතය පිළිබඳ ඇති දැනුම ලබා දෙයි.

04. විද්‍යාජෝති මහාචාර්ය ලාල් චන්ද්‍රසේන මහතා

විධායක නොවන අධ්‍යක්ෂ

මහාචාර්ය චන්ද්‍රසේන මහතා වෘත්තියෙන් සායනික ජෛවරසායනඥයකු වන අතර විශ්ව විද්‍යාල අධ්‍යයන සේවයේ වසර 24 ක පළපුරුද්ද සහ රෝහල්, සෞඛ්‍ය ආරක්ෂණ පරිපාලනය මෙන්ම රසායනාගාර විද්‍යා පිළිබඳ වසර 22 වැඩි පළපුරුද්දක් ද ඔහු සතුවේ. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ ජෛව රසායන විද්‍යාවේ සහ සායනික රසායන විද්‍යාවේ පදනම් මහාචාර්යවරයා වශයෙන් සහ වෛද්‍යපීඨයේ ජ්‍යේෂ්ඨ මහාචාර්යවරයා වශයෙන් 2011 ජූනිමස දී විශ්‍රාම ලැබූ අතර වර්තමානයේදී සම්මානික මහාචාර්ය යන ගරු නාමය දරනු ලබයි.

මහාචාර්ය චන්ද්‍රසේන මහතා ලිවර්පූල් (එක්සත් රාජධානිය) විශ්ව විද්‍යාලයෙන් දර්ශන විශාරද ආචාර්ය උපාධිය ද ලිවර්පූල් (එක්සත් රාජධානිය) විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී (ගෞරව) උපාධියද ලබාගෙන ඇති අතර ලංකා රසායන විද්‍ය ආයතනයේ සාමාජිකත්වය උසුලන වරළත් රසායනඥයෙකු වේ.

ඊට අමතරව, ඔහු රසායනික විද්‍යාව පිළිබඳ රාජකීය සංගමයේ (එක්සත් රාජධානිය) සාමාජිකත්වය ද ශ්‍රී ලංකාවේ පිළිබඳ ජාතික ආයතනයේ සහ ඇ.එ.ජ. කොලොරාඩෝ ස්ටේට් විශ්ව විද්‍යාලයේ පශ්චාත් විද්‍යාව ආචාර්ය උපාධි සාමාජිකයෙක් වේ. ඔහු වරළත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙක් වන අතර ඉන්දියානු අහමඩාබාඩ්හි කළමනාකරණ ආයතනයෙන්රෝහල් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රයක් ද ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා පෞද්ගලික රෝහල් සංගමයේ වර්තමාන සභාපතිවරයා මෙන්ම සායනික ජෛව රසායනක සඳහා වන සංගමයේ සභාපතිවරයා ද වේ. එසේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ද වේ.

ඔහු නවලෝක හොස්පිට්ල්ස් පීවිල්සී, නවලෝක හොස්පිට්ල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, නවලෝක කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, නවලෝක ගාර්ඩියන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ නවලෝක රෝහල් පර්යේසණ සහ අධ්‍යාපන පදනමේ අධ්‍යක්ෂවරයෙක් ද වේ.

අධ්‍යක්ෂක මණ්ඩලය ඉතිරි කොටස.

05. ප්‍රියන්ග අල්ගම මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

අල්ගම මහතා දැනට මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේඅධ්‍යක්ෂ ජනරාල් වශයෙන් සේවය කරයි. ඔහු නැන්යැංග් තාක්ෂණික (සිංගප්පූරුව) විශ්ව විද්‍යාලය - එම් අයි (ඇ.ඒ.ජ.)ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබාගෙන ඇත. ඔහු ඕස්ට්‍රේලියාවේ සහතිකලත් වෘත්තීය විගණකාධිකාරිවරුන්ගේ සංගමයේ (සීපීඒ) සහාය සාමාජිකයෙක්ද වේ. මූල්‍ය නියාමනය පිළිබඳ පද්ධති හා ක්‍රියාපරිපාටි, රජයේ ප්‍රසම්පාදන ප්‍රතිපත්ති රාමුව, රජයේ වත්කම් කළමනාකරණය, රජයේ ආයතනවල ව්‍යාපෘති යෝජනා සහ සංයුක්ත සැලැස්ම යනාදිය පිළිබඳ ඉතා පුළුල් අත්දැකීම් ඔහු සතුවේ.

06. සංජය පද්මපෙරුම මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

සංජය මහතා විසින් උතුරු කැරොලිනායේ කල්ලෝපීහි, බටහිර කැරොලිනා විශ්ව වද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය ප්‍රධාන වශයෙන් පරිෂනක තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධියක් (ඊක්සහ කැලිපෝනියාවේ පිලසන්ට් හිල්හි ඩියබ්ලෝ වැලි කොලේජ් අධ්‍යාපනආයතනයෙන් පරිෂනක තොරතුරු පිළිබඳ සාධන සහතික පත්‍රය ඇතුලු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ජාතික ආයතනයෙන් (හෂඊඒ) පරිෂනක පද්ධති විශ්ලේෂණය කිරීම හා සැලසුම් කිරීම පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබාගෙන ඇත. ඔහු සවුත් ඒසියන් ටෙක්නොලොජිස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාද වේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ විවිධ පැතිකඩ පිළිබඳ වසර 22 කට වැඩි අත්දැකීම් සම්භාරයක් ඔහු සතුවන අතර බටහිර කැරොලිනා විශ්ව විද්‍යාලයේ සිග්මා වී ඉන්ටර්නැෂනල් ෆරැටර්නිටි කප්පා ගැම්මා චැප්ටර් (ණ්චඒ ඨපප් ක්ය්චවැර) සංගමයේ වරළත් සාමාජිකයෙක් ද වේ. සංජය මහතා රග්බි ක්‍රීඩාවෙන් බටහිර කැරොලින් විශ්ව විද්‍යාලයද බාස්කට් බෝල් ක්‍රීඩාවෙන් සෙලාන් බැංකුව ද නියෝජනය කර ඇත.

07. ප්‍රදීප් ලියනමාන මහතා
විධායක නොවන අධ්‍යක්ෂ

ලියනමාන මහතා දසක දෙකකට වැඩි ශ්‍රී ලංකාවේ සහ විදේශීය වෘත්තීය සේවා අත්දැකීම් සහිත සංවර්ධන ආර්ථික විශේෂඥයෙකි. තරඟකාරිත්වය, ආයෝජන වැඩි කිරීම, ඵලදායිතාවය සහ සේවා නියුක්තිය ඉහළ නංවමින් කර්මාන්ත අංශ කීපයක සේවය කර ඇත. ලියනමාන මහතා විසින් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණය කිරීමේදී, පුළුල් කිරීමේදී හා ක්‍රියාවට නැංවීමේදී රාජ්‍ය හා පෞද්ගලික අංශය අතර සහභාගිත්වය වර්ධනයකර ඇත. ඊට අමතරව ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී එකඟත්වය ගොඩ නැගීම සඳහා වෘත්තීය සමිති, පෞද්ගලික හා රාජ්‍ය අංශය ඇතුළු පාර්ශවකරුවන් සමග ඔහු කටයුතු කර ඇත. ලියනමාන මහතා විසින් හවුල් ආයෝජන වලට මඟ පාදන්නාවූ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල් ව්‍යාපාර වලට අදාළ මූලික කටයුතු කීපයක් කළමනාකරණය කර ඇත.

ලියනමාන මහතා ටෙක්ෂාක් ඒ ඇන්ඩ් එම් විශ්ව විද්‍යාලයෙන් කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය ද ටෙක්සාස් සැන් ඇන්ටෝනියෝ ඉන් කාර්නේට් චාර්ල් විශ්ව විද්‍යාලයෙන් අලෙවිකරණ සහ කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ ප්‍රථම උපාධියද ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම

අංකය	නම	තනතුර	සුදුසුකම්
1.	සුරේෂ් පරණවිතාන මහතා	ප්‍රධාන නිලධාරී - ජීවිත/ප්‍රධාන නිලධාරී	FCII, MBA, DipM, FCIM, M.I. Mgt, CMA (Aus)
2.	රුවන්ති ගුණරත්න මිය (පත් 2017.01.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි)	ප්‍රධාන නිලධාරී - සාමාන්‍ය රක්ෂණ	FCII, Chartered Insurer
3.	රන්ජිත් පෙරේරා මහතා (2017.04.30 දින සිට විශ්‍රාම යන ලදි)	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය/ප්‍රධාන මූල්‍ය නිලධාරී	BSc (Hons) (Pub.Admin.Sp.), MBA, MA, PG. Dip. in Corp. Finance, FCMA, FCA
4.	ඊ.එම්. මාලනී තෙන්නකෝන් මිය (2017.03.01 දින සිට කියාත්මක වන පරිදි පත් කරන ලදි)	ප්‍රධාන මූල්‍ය නිලධාරිණි	MBA, FCA (SL), CPA (AUS), CIMA (UK)
5.	නිරෝෂිණී පෙතියාගොඩ මිය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ	MBA (MGSM, Syd), FCIM (UK), DipM (UK), Chartered Marketer
	අජිත් විජයසුන්දර මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තොරතුරු සන්නිවේදන තාක්ෂණ	Bsc (Eng.), MBA
6.	තනුජා හිඟුලගේ මිය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - සාමාන්‍ය රක්ෂණ	BSc. (Hons), FCII (UK), Chartered Insurer, ANZIIF (Fellow)
7.	නලින් සුබසිංහ මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ජීවගණකාඥ සහ අවදානම් කළමනාකරණ	MSc in Actuarial Management. (UK), BSc (Hons. Mathematics Special), Dip. in Computer Studies
8.	ධනුක ලියනගමගේ මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ආයෝජන	BSc (Eng) (Hons), MBA (Finance), CFA, Member of the CFA Institute (USA) and CFA Sri Lanka Society
9.	රුවනි ධර්මවර්ධන මිය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතා/ සමාගම් ලේකම්	LLB, Attorney-at-law, MBA, ACISI (UK)
10.	දයාරත්න පෙරේරා මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ජීවිත (තාක්ෂණික)	BSc (Hons), FCII, Dip. In BA, Chartered Insurer, MBA (USJ), AUKP (UK)
11.	වෛද්‍ය ෂෙරිකා ප්‍රනාන්දු මිය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වෛද්‍ය	MBBS (SL), MSc -Community Medicine (SL), ACII (UK), MRCGP (INT)(UK),Ad. Dip in Insurance-CII, Dip in Life & Disability claims
12.	හසන්ත පෙරේරා මහතා	සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ (පාලන සහ පරිපාලන)	MSc (IT), MSC (Const. P.Mgmt.), MBA, BSc (Eng.), AIPMSL, AIESL, Dip. in Credit Mgmt. (IBSL)
13.	රසික රණතුංග මහතා	සහකාර සාමාන්‍යාධිකාරී - පහසුකම් කළමනාකරණය	Member (ASHRAE) (USA), Member (ASHRAE) (SL), Dip. HVAC (USA)
14.	පෙරෝම් වින්සන්ට් මහතා	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි සහායක	B.com (Special - Hons), MBA, Dip. in Journalism, Dip. in Marketing (UK) MCIM, AIII
15.	චමින්ද අතාවුද මහතා	සහකාර ප්‍රධාන සාමාන්‍යාධිකාරී - ජීවිත (තාක්ෂණ)	BSc.(Hons), FCII, AIII, ANZIIF (Fellow), MBA (Colombo), Chartered Insurer
16.	චම්පා කන්නන්ගර මිය	සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු සන්නිවේදන තාක්ෂණ පද්ධති සංවර්ධන	BSc, Msc (Comp.Sc.), MBCS
17.	නාමලී සිල්වා මිය	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි සහ සමායතන සන්නිවේදන	MCIM (UK), Chartered Marketer, Prof. Dip. in Marketing-CIM, ACIB (UK)
18.	චමින්ද ගුණසිංහ මහතා	සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය	B.B.Mgt. (Accountancy) Sp. (Hons), FCA, ACMA, MBA(Finance)
19.	මාලක බණ්ඩාර මහතා	සහකාර සාමාන්‍යාධිකාරී - කළමනාකරණ ගිණුම් සහ අයවැය පාලන	BSc. - Accountancy (Sp.), FCA, MBA (Colombo)
20.	ලලිත් ද සිල්වා මහතා	සහකාර සාමාන්‍යාධිකාරී - රථවාහන	P.G. Dip. In Finance & Bus. Admin., MBA
21.	රොෂාන් කොලස් මහතා	සහකාර ගිණුම් - ජාතික විකුණුම් (ජීවිත)	MBA, CMA (Aus), Dip. In Marketing(SLIM), MSLIM, FCPM, MIM (SL)
22.	මහේන්ද්‍ර සිල්වා මහතා	සහකාර ප්‍රධාන අධිකාරී - පරිපාලන සහ සේවක සබඳතා	Attorney-at-Law, LLB (SL), MBA in HRM (OUSL), PG . Dip in HRM, NDES, MIIE (SL), I ENG, AMIPM (SL)
23.	සුදත් නිශාන්ත මහතා (2016.01.08 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි)	සහකාර සාමාන්‍යාධිකාරී - ජාතික අලෙවි (ජීවිත නොවන)	B.Sc. (B/Admin.)(Sp.), MIM (SL), PG. Dip. in Labour Relations & HRM
24.	ලක්ෂ්මන් රණසිංහ මහතා (2017.04.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි)	සහකාර සාමාන්‍යාධිකාරී - රථ වාහන (තාක්ෂණ)	MIE (SL), MIIE (SL), FIAE (SL)
25.	චන්ද්‍රසිරි ගන්හිලේ මහතා (31.03.2017 දින සිට සේවය අවසන් කරන ලදි)	ප්‍රධාන නිලධාරී - පරිපාලන සහ මානව සම්පත්	MBA, B.LE (Sp.), FCMI (UK), FIMSL, FIPM, Dip. In Journalism, National Dip. In PM (IPM), HNDA, National Dip. in Teaching (NIE), MITD (SL)

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

අංකය	නම	තනතුර
26.	ඩබ්.ඩී.සී. විතානගේ මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු- ප්‍රධාන ගිණුම්
27.	සී.වී.එස්. ප්‍රනාන්දු	නියෝජ්‍ය ප්‍රධාන මෝටර් ඉන්ජිනියර්
28.	එස්.පී.ඒ. රොද්‍රිගෝ මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු- සුරැකුම්
29.	ඩබ්.ආර්.එම්.එච්.බී.වීරසූරිය මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු- විශේෂ ව්‍යාපෘති
30.	කේ.ජී.ඩී.ජී. කන්දෙගම මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු- තොරතුරු තාක්ෂණ දත්ත මධ්‍යස්ථානය
31.	ඩබ්.එස්. කුලසිංහ මිය	ජ්‍යෙෂ්ඨ කළමනාකරු- මූල්‍ය
32.	කේ.එස්. පුෂ්පකුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - විශේෂ ව්‍යාපෘති (ජීවිත)
33.	ඩී.පී.ජේ.එස්. මෛත්‍රිරත්න මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - සාමාන්‍ය හදිසි අනතුරු
34.	ඩී.එන්.සී.ඒ. ගුණවර්ධන මිය	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නාවුක
35.	එන්.ජී.කේ. බණ්ඩාර මහතා	ජ්‍යෙෂ්ඨ කලාපීය ඉන්ජිනේරු
36.	ආර්.එම්.ඒ.කේ. රාජපක්ෂ මහතා	ජ්‍යෙෂ්ඨ කලාපීය ඉන්ජිනේරු
37.	එම්.ඩී. චන්ද්‍රිරම් මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - එම්.ඊ. සහ විකල්ප මාර්ග අංශය (සාමාන්‍ය)
38.	ඒ.ජී.එම්.එම්. ගමගේ මහතා	ජ්‍යෙෂ්ඨ කාණ්ඩ කළමනාකරු - සාමාන්‍ය
39.	ආර්.එන්. සේනාධීර මහතා	ජ්‍යෙෂ්ඨ මෝටර් ඉන්ජිනියර්
40.	එම්.ඩී. අත්තනායක මිය	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති (ජීවිත)
41.	පී.ඒ.එම්.පී.ඩබ්. ගුණතිලක මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ජාල හා සන්නිවේදන
42.	එම්.ජේ.එස්. දාබරේරා මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - බැංකු රක්ෂණ (ජීවිත)
43.	ජී.කේ.එම්.එස්.නානායක්කාර මිය	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ජීවිත
44.	ජී.ඩබ්.ආර්.සී. ද සිල්වා මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ජීවිත
45.	ජී.ඒ.පී. දේශප්‍රිය මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අභ්‍යන්තර විගණන
46.	එච්.එල්.ආර්.ඒ. විජේවර්ධන මිය	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති (පරිපාලන)
47.	එස්. පතිරණ මිය	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති (හිමිකම් රක්ෂණ)
48.	එන්.ඩී.කේ.එම්. ජයතිලක මිය	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති (නඩු පැවරීම්)
49.	එම්.කේ.එස්. ප්‍රනාන්දු මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
50.	ඩබ්.එල්.ජේ.ඩබ්.කේ. වෙල්ගම මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
51.	එම්.ඩී.පී. නවගමුව මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
52.	ටී.ඩී.පී. පීරිස් මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
53.	යූ.ජී.යූ.ආර්. කුමාර මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
54.	එම්.පී.එන්. කුමාර මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
55.	ඩී.එන්.කේ. නාරන්ගම්මන මහතා	ජ්‍යෙෂ්ඨ කළමනාකරු - ටීඑස්ඩී
56.	ඩබ්.එම්.ඒ.යූ.කේ. කුලසේන මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
57.	ආර්. හේවපතිරණගේ මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
58.	එන්.කේ.එස්. එස්. කුමාර මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
59.	කේ.ආර්.ඩී. රුද්‍රිගෝ මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
60.	පී. සතියන් මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
61.	එච්.ජේ.එස්. මෙන්ඩිස් මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
62.	එල්.එච්.ඒ.එස්. සිරිමාන්න මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
63.	එම්.බී.කේ .ටී. ජයසිංහ මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
64.	ටී.එස්.කේ. පීරිස් මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
65.	ඒ.එම්.එච්. අධිකාරී මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
66.	එච්.එම්.ජී. සරත්චන්ද්‍ර මහතා	කලාපීය විකුණුම් කළමනාකරු
67.	ආර්.බී.ඩබ්.එම්.එස්.පී. කුමාර මහතා	කලාපීය විකුණුම් කළමනාකරු (2017.02.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගොස් ඇත.
68.	එල්.ජී.එන්. ප්‍රියන්ත මහතා	කලාපීය විකුණුම් කළමනාකරු

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

සාමාන්‍ය රක්ෂණ කණ්ඩායම



ජීවිත රක්ෂණ කණ්ඩායම



ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් කණ්ඩායම ඉතිරි කොටස.

සහයසේවා කණ්ඩායම



තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා කණ්ඩායම



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

පරිපාලන, මානව සම්පත් වෛද්‍ය සහ නීති කණ්ඩායම



මූල්‍ය කණ්ඩායම



ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් කණ්ඩායම ඉතිරි කොටස.

විකුණුම් සහ අලෙවි කණ්ඩායම 1



විකුණුම් සහ අලෙවි කණ්ඩායම 2



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

විකුණුම් සහ අලෙවි කණ්ඩායම 3



විකුණුම් සහ අලෙවි කණ්ඩායම 4



4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

අවදානම් කළමනාකරණය

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වර්ෂ 55 කට වැඩිකාලයක් ව්‍යාපාරික කටයුතුවල නිරත වී සිටින අතර පවත්නා වෙළඳපොළ අස්ථිරතාවයක් තිබිය දීත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ශක්තිමත්, ස්ථාවර සහ මූල්‍යමය වශයෙන් යහපත් සමාගමක් වශයෙන් පවතියි. රක්ෂණ ඔප්පු යටතේ පිළිගනු ලැබ ඇති බැඳීම් සම්බන්ධයෙන් සෑම අවස්ථාවකදීම සෑහීමකට පත්විය හැකි බවට තහවුරු කිරීමේදී අප ආයතනයේ ප්‍රමුඛම ප්‍රවීනතාවය වන්නේ අවදානම් සම්බන්ධයෙන් වෘත්තීමය ආකාරයට කටයුතු කිරීමයි. ශාඛා පුළුල් කිරීම සහ යෝග්‍ය අවදානම් සංස්කෘතියක් නිර්මාණය කිරීම අඛණ්ඩව ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමට ඉතා ඉහළ වැදගත්කමක් ලබා දී ඇත. 2016.12.31 දිනට, ශාඛා සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 131, ක්‍රියාකාරී නියෝජිත බලකාය 2600, අලෙවිකරණ විධායක සහ බැංකු රක්ෂණ නිලධාරීන් 235 සහ තැරැව්කරුවන් 56 දෙනෙකුගෙන් සමන්විත වන අපගේ පුළුල් ව්‍යාපාර පරාශය සහ අපගේ බෙදා හැරීමේ ජාලයේ පෘතුලභාවය අවදානම් ස්වාභාවිකව විවිධාංගිකරණය කර අඩු කරයි. අපගේ විවිධාංගිකරණය කරන ලද නිෂ්පාදන කළඹ මගින්, කිසිම ව්‍යාපාරයකට හෝ අවදානමකට අතිශයින්ම නිරාවරණය නොකර, ඉපයීම්වල සුලභ මූලාශ්‍ර සහ මූල්‍ය ප්‍රවාහයන් ආයතනය වෙත ලබා දෙයි.

අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන රාමුව

ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් ඉතාමත් දැඩි නීති මාලාවක් මගින් පාලනය වන අතර රක්ෂණ සමාගම් මූල්‍යමය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාවන් පවතින බවට තහවුරු කිරීම සඳහා දැඩි ප්‍රාග්ධන නීති රීතිවලට යටත් කරනු ලැබ ඇත.

අපගේ ශක්තිමත්භාවයේ සහ ස්ථාවරභාවයේ ප්‍රධාන මිණුම් දණ්ඩ ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවලට අදාළව 2016.12.31 දිනට 427% විය යුතු බවට ඇස්තමේන්තුගත කරන ලද අවදානම් පාදක කරගත් ප්‍රාග්ධන (වන අතර (2015 වර්ෂයේ සාපේක්ෂ අගය වූයේ 402% කි) ජීවිත නොවන රක්ෂණ කටයුතුවලට අදාළව 2016 වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රමාණවත් අනුපාතය 186% (2015 වර්ෂයේදී සාපේක්ෂ අගය 213% කි) වූ අතර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නීති රීතිවලට අනුව අවශ්‍ය අනුපාතය වන්නේ 120% කි.

රක්ෂණ ඔප්පු හිමියන් වෙත ඇති බැඳීම් සපුරාලීම සඳහා රක්ෂණ නියාමන ආයතන අවශ්‍ය යැයි සලකනු ලබන අවශ්‍ය ප්‍රමාණයට වඩා තුන් ගුණයක ප්‍රාග්ධන ප්‍රමාණයක් අප සතුවන බව මෙම දත්ත මගින් පිළිබිඹු කරයි.

සියළුම ව්‍යාපාර මාර්ග තුළ සිදුවන ස්වකීය මූල්‍ය බැඳීම් සහ හිමිකම් පෑම් සපුරාලීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුව ප්‍රමාණවත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතාවයක් පවතින බවට තහවුරු කරන්නාවූ ශක්තිමත් විනයගරුක ආයෝජන ප්‍රතිපත්තිය මගින් පාලනය කරනු ලබන්නා වූත්, ඉතා ශක්තිමත් ශේෂ පත්‍රයක් සහ තත්ත්වයෙන් උසස් ආයෝජන කළඹක් පවත්වාගෙන යාමේ දීර්ඝ ඉතිහාසයක් සතුවීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සම්පතකි. එලෙසම වගකීම් සීමා කිරීම සඳහා සමහර අවස්ථා ලෝකප්‍රකට පිළිගත් ශ්‍රේණිගත කිරීම් ලැබූ ප්‍රතිරක්ෂණ ආයතන වෙත ප්‍රතිරක්ෂණය කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් අවදානම් කළමනාකරණය දෛනික ව්‍යාපාර කටයුතුවලට අන්තර්ගත කර ඇත.නිෂ්පාදන සහ නිෂ්පාදන කළඹ ව්‍යුහගත කරනු ලබයි.

අභ්‍යන්තර සහ බාහිර නීතිරීතිවලට අනුකූලව යෝග්‍ය පරිදි ප්‍රතිරක්ෂණ මිල නියම කිරීම අනුමත කිරීම සහ කළමනාකරණය සිදු කරනු ලබයි; සහ මණ්ඩලයේ අනු කමිටුවලට ප්‍රධාන වශයෙන් බලය පැවරුණු අධිකාරීන් වනම් ආයෝජන කමිටුව, විගණන සහ අනුකූලවීමේ කමිටුව, අවදානම් කළමනාකරණ කමිටුව සහ මානව සම්පත් කමිටුව සහ ජීවිත රක්ෂණ ප්‍රධාන නිලධාරියට, සාමාන්‍ය රක්ෂණ ප්‍රධාන නිලධාරියාට ප්‍රධාන මූල්‍ය නිලධාරියාට සහ අනෙකුත් ආයතන ප්‍රධානීන්ට සමස්ථ උපාය මාර්ගික සහ අවදානම් රුචියට අනුකූල ආකාරයට කටයුතු කරනු ලබයි. එදිනෙදා කළමනාකරණ අවදානම සහ ආරක්ෂාවේ පළමුපෙළ ලෙස කටයුතු කිරීමේ මූලික වගකීම ප්‍රධාන නිලධාරීන් සහ අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් සතුවේ. අවදානම් කළමනාකරණ කාර්යයේ කොටසක් වශයෙන් කටයුතු කරන අනෙකුත් මණ්ඩලයේ උපකමිටු සමඟ දෙවන ආරක්ෂක පවුර වන්නේ පහත විස්තර කරනු ලබන අවදානම් කළමනාකරණ කමිටුවයි. මූල්‍ය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය ඇතුළුව අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව අඛණ්ඩ ස්වාධීන හා විෂයානුබද්ධ ඇගයීමක් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය මගින් සකසනු ලබන අතර, එය තෙවන පෙළ ආරක්ෂක පවුර ලෙස කටයුතු කරයි. රක්ෂණ කර්මාන්තය දැඩි නීතිමය රාමුවක් මගින් ක්‍රියාත්මක වන කර්මාන්තයක් වන බැවින් රක්ෂණ මණ්ඩලය සහ අභ්‍යන්තර විගණකවරුවන් සිවුවන ආරක්ෂක පෙළ ලෙස කටයුතු කරයි. දැනට පවතින නෛතික රාමුව අනුව වාර්ෂික අවදානම් පාදක ප්‍රතිලාභ අප ආයතනයේ අභ්‍යන්තර විගණකවරුන් විසින් සහතික කිරීමට අවශ්‍ය වේ.

ව්‍යවසාය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය

ආයතනය සතුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමතකරන ලද ව්‍යවසාය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් පවතින අතර එයට අනුව එනම් උපාය මාර්ගික මූල්‍ය මෙහෙයුම් සහ ආපදා සම්බන්ධ ප්‍රධාන අවදානම් හතරකට අදාළව ව්‍යාපාර අවදානම් කළමනාකරණය පිළිබඳ සංකල්පීය අදහසක් මතයක් තෝරා ගැනීමට සමාගම අදහස් කරයි. අවදානම් කළමනාකරණ කමිටුවේ අනාගත කාර්ය සාධනය, උපායමාර්ගික කළමනාකරණ සහ මෙහෙයුම් මට්ටම යන දෙඅංශයේම පුළුල් අවදානම් කෙරෙහි අවධානය යොමු කරන්නාවූ අවදානම්

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ අනු කමිටුවක් වන අවදානම් කළමනාකරණ කමිටුව වගකිව යුතුවේ. ආයතනයේ කළමනාකරණය විසින් ස්වකීය අවදානම් අඛණ්ඩව ඇගයීමකට ලක් කිරීම සහ ස්වකීය අවදානම් ලේඛණය අඛණ්ඩව යාවත්කාලීන කරන බවට තහවුරු කිරීම සහ අවදානම් ඇගයීම තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් බවත්, අධ්‍යක්ෂක මණ්ඩලය විසින්, ලබාදෙන අවදානම් රුචි සීමාවලට අනුව කටයුතු කරනු ලබන බවට සහතික කිරීම අවදානම් කළමනාකරණ කමිටුවේ වගකීම වේ. ඊට අමතරව අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම යාවත්කාලීන කිරීම, බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේදී අවදානම් කළමනාකරණ කමිටුවට පාලන කාර්ය භාරයක් පැවරී ඇත.

2016 වර්ෂය තුළදී පවත්වන ලද අවදානම් කළමනාකරණ උපකමිටු සංඛ්‍යාව සහ මෙම රැස්වීම්වලට පැමිණි එක් එක් අධ්‍යක්ෂකවරයාගේ පැමිණීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

අවදානම් කළමනාකරණ රැස්වීම් - 2016

අධ්‍යක්ෂවරයාගේ නම	රැස්වීම් සංඛ්‍යාව	
	පවත්වනලද	පැමිණීම
මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන (විධායක නොවන අධ්‍යක්ෂ)	3	3
පී. අල්ගම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	3	2
එච්.ඩී.එස්. අමරසූරිය මහතා	3	2
ටී.එම්.ආර්. බන්ස ජයා මහතා	3	3
කීත් ඩී. බර්නාඩ් මහතා	3	0

(කීත් ඩී. බර්නාඩ් මහතා සමාගමේ අධ්‍යක්ෂක දූරය 2016.12.20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් කරනු ලැබූ අතර ඩී.බී. අරුණ පී.එස්. සිරිවර්ධන මහතා 2016.12.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදි.)

ජීවිත රක්ෂණ අවදානම

ජීවිත රක්ෂණ ආශ්‍රිතව බොහෝ අවදානම් තිබේ. එයට පහත දක්වා ඇති අවදානම් ඇතුළත් වේ.

- මරණ අනුපාතික අවදානම" ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ තථ්‍ය රක්ෂණ ඔප්පු හිමියකු මරණයට පත්වීමේ අවදානම අපේක්ෂා කරනු ලබනවාට වඩා ඉහළ යාමේ අවදානම
- දීර්ඝායුෂ අවදානම" වාර්ෂික දීමනාලාභිය අපේක්ෂා කරනු ලබනවාට වඩා දීර්ඝකාලයක් ජීවත්වීමේ අවදානම
- රෝගාතුර වීමේ අවදානම" - තථ්‍ය රක්ෂණ ඔප්පුහිමියකුගේ සෞඛ්‍ය/හදිසි අනතුරු වලට අදාළ හිමිකම්පෑම් අපේක්ෂා කරනු ලබනවාට වඩා ඉහලයාමේ අවදානම
- රක්ෂණ ඔප්පු හිමියාගේ හැසිරීමේ අවදානම" - ගිවිසුම කල් පිරීමට කලින් දායක මුදල් ගෙවීම නතර කිරීමේදී හෝ අඩු කිරීමේදී රක්ෂණ ඔප්පු හිමියන්ගේ හැසිරීම අපේක්ෂා කරනු ලැබූ තත්ත්වයට වඩා නරක තත්ත්වයකට පත්වීමේ අවදානම දුර්වල නොවෙනස්ව පවතින ගාස්තු අනුපාතයන් පොත්පත්වල සඳහන් රක්ෂණ ඔප්පුගගඟ අඩුකරමින් අනාගත ස්ථාවර වියදම් පියවීම සඳහා මුදල් සැපයීම දක්වා යොමු කරනු ලැබිය හැකි අතර විලම්බනය කරන ලද අත්පත් කර ගැනීමේ ගාස්තු අයකර ගැනීමේ ස්වකීය හැකියාවට ප්‍රබල ලෙස බලපෑමක් විය හැකි ලිඛිතවව සඳහන් ව්‍යාපාර වල අනාගත සාධාරණ මූල්‍ය ප්‍රවාහයන් අඩුකරනු ලැබිය හැකිය.
- වියදම් අවදානම" රක්ෂණ ඔප්පු ලබා ගැනීමේදී හා පරිපාලනය කිරීමේදී දරණු ලබන වියදම් අපේක්ෂා කරනු ලබනවාට වඩාඉහල යාමේ අවදානම.

විධිමත්ව පාලනයකර හා කළමනාකරණය නොකරනු ලැබුව හොත් ආයතනයේ මෙහෙයුම්වලට බලපෑමක් විය හැකි ඉහත සඳහන් අවදානම් ඇගයීමට ලක් කිරීම සඳහා වන ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලීන් අප ආයතනය විසින් ස්ථාපනය කර ඇත. නිෂ්පාදන සංවර්ධනයේ සිට ප්‍රතිලාභ පරිපාලනය දක්වා සියලුම වැදගත් අවදීන් ආවරණය කිරීම උදෙසා ක්‍රිපාටි ක්‍රියාවට නංවනු ලබයි.

මෙම අවදානම්වලට අමතරව, නිෂ්පාදන සැලැස්ම හා මිල නියම කිරීමේ අවදානම් ලිහිල් කරමින් සියලුම ජීවිත රක්ෂණ මූල්‍ය ප්‍රවාහයන් ආකෘති වශයෙන් සකස් කරනු ලබන අතර ලාභ පිරික්සුම ජීවිත රක්ෂණ ජීවගණකාඥ විසින් ඉදිරිපත් කරනු ලබයි. එසේම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වගකීම් වලට, ඇත්නම්, අනුබලදීම සඳහා ගැලපුම් ලේඛණ භාවිතා කරනු ලබයි.

රක්ෂණ නියාමන ආයතන මණ්ඩලයේ අනිවාර්යය අවශ්‍යතාවයක් මත 2016.01.01 දින සිට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වගකීම් ඇගයීම් අරමුණ සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන පාලනය යටතේ අවශ්‍ය වන්නා වූ දළ වාරික තක්සේරු පදනම යොදා ගැනීම වැනි අවදානම් පාදක ප්‍රාග්ධන නුබුන්වත් රාමුව පූර්ණ ලෙස ක්‍රියාත්මක කරන ලදි. මීට පෙර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් "ශුද්ධ වාරික තක්සේරු" පදනම (අනුගමනය කරන ලදි. වෙළඳපොළට අනුකූලවන ආකාරයට වගකීම ගණනය කළ යුතුව ඇති නව ප්‍රවේශය යටතේ වගකීම් අගයට අදාළව මෙය ඉතා වැදගත් වෙනසකි. එම නිසා මරණ අනුපාතය, දීර්ඝායුෂ, වියදම් ,අප්‍රාණවීම යනාදිය උදෙසා පැහැදිලි ඇස්තමේන්තු මත දළ වාරික තක්සේරු පදනම් විය යුතුව ඇති

අවදානම් කළමනාකරණය ඉතිරි කොටස.

අතර ශුද්ධ වාරික තක්සේරු පදනම යටතේ භාවිතා කරනු ලබන වෙනස් නොවන පොළී අනුපාත ව්‍යුහයකට ප්‍රතිවිරුද්ධව මිල අඩු කිරීම සඳහා අවදානම් වලින් තොර පොළී අනුපාත ව්‍යුහයක් භාවිතා කළ යුතුය. මුළු ප්‍රතිලාභ වගකීම යැයි කියනු ලබන අනාගතයේදී අපේක්ෂිත ප්‍රසාද දීමනා මට්ටම සඳහා මෙම වගකීම මගින් පැහැදිලි සීමාවක් ද ගෙන ආයුතුව ඇති අතර, එම නිසා අනාගත ප්‍රසාද දීමනා උසස් ඇස්තමේන්තු උපකල්පන යටතේ ආරක්ෂා වනු ඇත. වාර්කව සිදු කරනු ලබන අභ්‍යන්තර අත්දැකීම් පදනම් කරන්නාවූ වගකීම් තක්සේරුව සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වඩා උසස් ඇස්තමේන්තු උපකල්පන සූදානම්කර තබනු ලබයි. රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් ස්ථාවර මට්ටමකින් පාලනය කිරීම උදෙසා පසුගිය කාලය තුළ මෙමගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකියාව ලබා දී ඇත.

ඊට අමතරව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශවලට අනුව මුළු ප්‍රතිලාභ වගකීම ගණනය කිරීම සඳහා සලකා බලනු ලබන උසස් තක්සේරුගත පරාමිතීන් මගින් අවදානම් ආන්තික පිළිබඳ තවදුරටත් අවධාරණය කරනු ලබන අතර මුළු ප්‍රතිලාභ වගකීම ගණනය කරනු ලබන්නේ අහිතකර වෙනස්වීම්වලට ආන්තිකයක් තබා ගනිමිනි. අවදානම් ආන්තික භාවිතය මගින් රක්ෂණ ඔප්පුවල වගකීම පිළිබඳ සංඛ්‍යානමය විශ්වාස ඉහළ නංවන බැවින් රක්ෂණ හිමියන්ගේ ප්‍රතිලාභවලට ලබාදෙන ආරක්ෂාව වැඩිවන අතර එමගින් රක්ෂණ ඔප්පු වගකීම් වැඩි දියුණු වේ.


ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් භාවිතා කරනු ලබන අවදානම් ආන්තිකය, අවදානම් පාදක ප්‍රාග්ධන රාමුව තුළ අර්ථ දක්වා ඇති සාධකවලට අනුකූලවන අතර එය වියහැකි ප්‍රතිඵලවල අප්‍රකට සම්භාවිතා බෙදා හැරීමට අදාළව 75% විශ්වාශනීය අන්තරයක් නියෝජනය කරයි.

ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම නිර්නය කිරීමේදී භාවිතා කරනු ලබන ප්‍රධාන උපකල්පන

ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම නිර්නය කිරීමේදී භාවිතා කරනු ලබන ප්‍රධාන උපකල්පන පහත වගු ගතකර ඇත.


උපකල්පන	විස්තරය
මර්ත්‍යව	▣ වාර්ෂික මුදලක් නොගෙවනව්‍යාපාර සඳහා ඒ 67/70 ▣ පුරුෂ දීමනා ලාභීන් සඳහා ඒ(90) එම් සහ ස්ත්‍රී දීමනා ලාභීන් සඳහා ඒ(90) එෆ්
ආයෝජන ප්‍රතිලාභ	2016.12.31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් යෝජනා කරන ලද අවදානම් නිදහස් අනුපාත ව්‍යුහය

Risk Free Rate



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 2016 වසර පුරා ස්ථාවර, ශක්තිමත් නුබුන්වත් අනුපාත ජීවිත රක්ෂණයට සම්බන්ධව පවත්වාගෙන යන ලදි. 2016.12.31 දිනට අවදානම පදනම් කරගත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (ක්සෘ) 427% අගයක් ගන්නා ලද අතර 2015.12.31 දිනට එම අගය 402% ක් විය. මෙය නීතිමය වශයෙන් පවත්වාගත යුතු වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය 120% අගයට වඩා විශාල වැඩි අගයකි.

Capital Adequacy Ratio



ජීවිත රක්ෂණ අවදානම උදෙසා සංවේදිතා විශ්ලේෂණය

උපකල්පනය	උපකල්පනවල වෙනස්වීම	වගකීම් මත බලපෑම රු. මිලියන
මරණයතාව	+10%	311
	-10%	(312)
වට්ටම් අනුපාතය	අවදානම්පාදක ප්‍රාග්ධනය යටතේ ඉහළ කම්පන සිද්ධි දාමය	(6,983)
	අවදානම්පාදක ප්‍රාග්ධනය යටතේ උපකල්පන සිද්ධි දාමය	10,425

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

පහත සඳහන් වගුවෙන් සහභාගිවීමේ සහ සහභාගිනොවීමේ ආයතනයේ අරමුදල් තත්ත්වය පෙන්නුම් කරයි.

	සහභාගිවන රු. 000	සහභාගි නොවන රු. 000	එකතුව රු. 000
31.12.2016	81,138,670	6,218,715	87,357,386
ප්‍රතිශතය	92.88%	7.12%	

සාමාන්‍ය රක්ෂණ අවදානම

2016.01.01 දින සිට රක්ෂණ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් නියම කරන ලද නෛතික අවශ්‍යතාවයකට අනුව, අවදානම් පාදක ප්‍රාග්ධනය මගින් නියම කරනු ලබන අවදානම් පාදක ප්‍රාග්ධනය නුබුන්වත් රාමුව රක්ෂණ සංස්ථාව විසින් පූර්ණ වශයෙන් ක්‍රියාවට නංවා ඇත.

මේ යටතේ හිමිකම් වගකීම් සහ අවදානම් ආන්තිකය මධ්‍ය ඇස්තමේන්තුවේ සමුච්චිතයක් ලෙස හිමිකම් වගකීම අර්ථ නිරූපනය කරනු ලබයි. අවදානම් සීමාවන් සහිතව අනපේක්ෂිත අවදානම් සංචිතවල මධ්‍ය ඇස්තමේන්තුව වශයෙන් වාර්ක වගකීම අර්ථ නිරූපනය කරනු ලබයි.

විවක්ෂණශීලීව සංචිත තබා ගැනීම

සාමාන්‍ය ආයුගණකඥ සංචිතවල වාර්ක වගකීම සහ හිමිකම් වගකීම වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් තිබේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් 75% ක විශ්වාසනීය මට්ටමකින් හිමිකම් වගකීම (දරනු ලැබූ හිඟ හිමිකම් සංචිත එකතුවන නමුත් (ප්‍රමාණවත් ලෙස) වාර්තා නොවූ හිමිකම් (තබා ගෙන ඇති අතර එයට, හිමිකම් වගකීම් මධ්‍ය ඇස්තමේන්තුව, හිමිකම් අනාගතයේදී පියවීම සඳහා වන වියදම් සහ මධ්‍ය ඇස්තමේන්තු වගකීමෙන් අහිතකර ව්‍යුත්පන්න මිල සඳහා වන ප්‍රතිපාදන ඇතුළත් වේ. වාර්ක වගකීමද 75% ක විශ්වාසනීය මට්ටමක් තබා ඇති අතර, පසුගිය දෙක තුන හදිසි අනතුරු වර්ෂ උදෙසා වන මධ්‍ය ඇස්තමේන්තු අවසන් අලාභ අනුපාතයේ සාමාන්‍ය ලබා ගනිමින් නිර්ණය කරන ලද මධ්‍ය ඇස්තමේන්තු කල් ඉකුත් නොවූ අවදානම් සංචිත පදනම් කරගෙන එය ගණනය කරනු ලබයි. නිරාවරණය වශයෙන් අතිරේක අස්ථිරතාවය පිළිඹිඹු කිරීම සම්බන්ධයෙන් වන අහිතකර ව්‍යුත්පන්න වීම සඳහා වන ප්‍රතිපාදන හට නොගන්නා ලදි.

හිමිකම් සංවර්ධන තොරතුරු

පහත වගුව මගින් ඓතිහාසික ජීවිත නොවන සංචිත, එනම් ශුද්ධ ප්‍රතිරක්ෂණවල වෙනස්වීම් ඉදිරිපත් කරනු ලබයි. වගුවේ ඉහළම පේළියෙන් නොගෙවන ලද අලාභ සහ එකී වර්ෂය තුළ හා පසුගිය වර්ෂ තුළ දරණ ලද අලාභ වෙනුවෙන් අනාගත ගෙවීම්වල තක්සේරුගත වටිනාකම නියෝජනය කරන්නාවූ, එක් එක් ශේෂපත්‍ර දිනයට අදාළ අලාභ ගැලපුම් වියදම් සඳහා වන, තක්සේරුගත සංචිත පෙන්නුම් කෙරේ. වගුවේ වර්ෂය අවසානයේදී ස්ථාපිත සසම්පත්වලට අදාළව, එක් එක් වර්ෂය අවසානය මගින් ගෙවන ලද සමුච්චිත ප්‍රමාණයන් වගුවේ සමුච්චිත ගෙවන ලද කොටසින් පෙන්නුම් කෙරේ. එසේම ඉහත සම්බන්ධය තුළ දක්න සමුච්චිත ගෙවීම් වටිනාකම් මුදල සහ මූල්‍ය වර්ෂය අවසානයේ ශුද්ධ හිඟ තත්ත්වය සමුච්චිත වාර්තාගත අලාභ අංශය මගින් විස්තර කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වසර 55 කට වැඩි කාලයක් ව්‍යාපාර කටයුතුවල නිරතව සිටින අතර පවත්නා වෙළඳපොළ තුල අස්ථිරතාවයක් තිබියදීත්, ශක්තිමත්ව, ස්ථාවර සහ මූල්‍යමය වශයෙන් යහපත් ආයතනයක් වශයෙන් එය පවතී.

අවදානම් කළමනාකරණය
ඉතිරි කොටස.

රු. 000	2011	2012	2013	2014	2015	2016
අලාභ සඳහා දළ සංචිත සහ අලාභ ගැළපුම් වියදම්	7,898,097	8,720,583	7,817,801	7,709,471	7,893,502	8,663,903
ප්‍රතිරක්ෂණ අයකර ගැනීම්	(1,168,930)	(1,509,188)	(1,160,449)	(1,004,432)	(976,138)	(1,434,140)
අලාභ සහ අලාභ ගැලපුම් වියදම් සඳහා ශුද්ධ සංචිත	6,729,167	7,211,395	6,657,352	6,705,038	6,917,364	7,229,762
දෙසැම්බර් 31 දිනට ගෙවන ලද සමුච්චිත :						
වසරකට පසු	3,632,757	4,545,085	4,481,214	4,572,093	4,981,269	6,637,140
වසර දෙකකට පසු	4,903,405	5,908,837	5,873,386	5,907,060	6,989,106	
වසර තුනකට පසු	4,980,093	6,016,063	5,960,968	6,055,117		
වසර හතරකට පසු	5,014,506	6,042,845	6,010,004			
වසර පහකට පසු	5,047,142	6,072,977				
වසර හයකට පසු	5,080,082					
දෙසැම්බර් 31 දිනට වාර්තා වූ සමුච්චිත:						
වසරකට පසු	4,740,385	5,765,263	5,564,838	5,631,797	6,325,676	7,912,768
වසර දෙකකට පසු	5,147,257	6,199,144	6,107,021	6,204,339	7,290,857	
වසර තුනකට පසු	5,195,146	6,287,566	6,209,496	6,352,291		
වසර හතරකට පසු	5,289,159	6,285,316	6,218,063			
වසර පහකට පසු	5,266,479	6,309,599				
වසර හයකට පසු	5,258,996					

සාමාන්‍ය රක්ෂණ අවදානම් උදෙසා සංවේදිතා විශ්ලේෂණය

පහත සඳහන් වගුව මගින් වාර්තාගතවූ හිඟ හිමිකම් තුළ සියයට එක කොටසක් වූ අහිතකර වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස බදුවලට පෙර ශුද්ධ ආදායමේ සංවේදිතාවය සහ ශුද්ධ වත්කම්වල සංවේදිතාවය පෙන්නුම් කරනු ලබයි. එවැනි ඉහළ යාමක් රක්ෂිත සිදුවීම් හට ගැනීමේ ඉහළ සංඛ්‍යාතය මඟින් නැතහොත් හිමිකම් ඇති වීමේ බරපතල තත්ත්වය ඉහළයාමක් මඟින් හෝ සංඛ්‍යාතය සහ බරපතල තත්ත්වය එකතු වීමක් මඟින් ඉහළ යාමත් ඇතිවිය හැකිය. සංවේදිතා මඟින් එවැනි සිද්ධියක් සිදුවීමේ හැකියාව ප්‍රකාශ නොකරන අතර ප්‍රතිරක්ෂණය පිළිබඳ රේඛීය නොවූ යම් ප්‍රතිඵල සංවේදිතා මඟින් සැලකිල්ලට නොගනී.

මෙහිදී අප උපකල්පනය කරනු ලැබ ඇත්තේ මධ්‍යම ඇස්තමේන්තුව හිඟ හිමිකම් මුදල සහිතව සියයට එක් කොටස මගින් බලපෑමට ලක්වන බව ද සහ හිමිකම් පාලන වියදම්වලට බල නොපානු ලබන බවයි. පහත දක්වා ඇති වගුවේ සංවේදිත විශ්ලේෂණය පිළිබඳ ඉදිරිපත් කිරීමට යොදා ගනු ලැබූ උපකල්පන මත පදනම් වී, වාර්තා වන හිඟ හිමිකම්වල වැඩිවන එක් එක් සියයට කොටස බදුවලට පෙර ශුද්ධ ආදායම සහ ශුද්ධ වත්කම් මත රේඛීය බලපෑමක් ඇති කිරීමට හේතු වනු ඇත. ඊට අමතරව, සමාගම විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුම්වල රේඛීය ප්‍රතිඵල සැලකිල්ලට ගෙන සීමාන්තික සිද්ධිදාමය සිද්ධි ඇගයීමට ලක් කිරීම මගින් රක්ෂණ අවදානම අධීක්ෂණය කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

	උපකල්පන වෙනස්වීම	වාර්තාවූ දළ හිමිකම් හිඟ රු. 000	වාර්තා වූ ශුද්ධ හිමිකම් හිඟ රු. 000	දළ වගකීම් මත බලපෑම රු. 000	ශුද්ධ වගකීම් මත බලපෑම රු. 000	බදුවලට පෙර ලාභය මත බලපෑම රු. 000	කොටස්වල අගය මත බලපෑම (බදුවලට පසු) රු. 000
31.12.2016	+1%	6,284,617	4,923,394	82,323	67,958	(67,958)	(48,930)

තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය

වාර්ෂිකව ආයතනයේ බාහිර විගණනකරුවන් විසින් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ අවදානම අධ්‍යයනය කරනු ලැබේ. වැදගත් තොරතුරු තාක්ෂණ අවදානම් හඳුනාගෙන ඒවා සම්බන්ධව අවදානම අවම කිරීමේ පියවර අරගෙන ඇත.

ශක්තිමත් හා උසස් තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් එම පද්ධති නිසා ඇතිවන මෙහෙයුම් අවදානම අවම කිරීමට ආපදා කළමනාකරණ පද්ධතියේ උපස්ථ ලබා ගන්නා අතර මෙයට අමතරව මේ සම්බන්ධව අඛණ්ඩ පරීක්ෂණ පවත්වනු ලබයි.

මෙම වර්ෂයේ වැඩිපුර අවධානය යොමු වනුයේ අනාරක්ෂිත තත්ත්වයන් පිළිබඳව තක්සේරුවක් කර තොරතුරු ආරක්ෂණය සම්බන්ධව අවදානම හඳුනාගෙන එම අවදානම පාලනය කිරීමට පියවර ගැනීමයි.

අනුකූලතා අවදානම් කළමනාකරණය

සමස්ථයක් වශයෙන් මහජනතාවගේ යහපත උදෙසා පවරනු ලැබූ ව්‍යාපාරයක් ලෙස, රක්ෂණ කටයුතු ජනතාවට බලපාන කරුණාක් බවට පත්වී ඇති අතර රක්ෂණ ගිවිසුම රක්ෂිතයා හා රක්ෂකයා අතර පෞද්ගලික ගිවිසුමක් වූවද, පුළුල් පරාශයක පැතුරුණු නොයෙකුත් නීති රීති සහ රෙගුලාසි මඟින් මැදිහත්වීමට රජය වෙත බලය ලබාදී ඇත.

තරඟකාරී වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම වැනි මූලික රක්ෂණ නියමාන පරමාර්ථ සාක්ෂාත් කර ගනිමින් රක්ෂණ ඔප්පු හිමියන්ට සර්ව සාධාරණ සහ සමානව සැලකීම උදෙසා අවශ්‍ය පහසුකම් සලසා දීම මඟින් මහජන යහපත සඳහා සේවය සැපයීමට ඉලක්කගත කරන ලද නීති සහ රෙගුලාසි මඟින් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය පාලන වේ. නුබුන්වත්බව සහ මූල්‍ය ස්ථායිතාවය මෙමඟින් තහතවුරු කරනු ලබන අතර රජයේ නීතිරීති ද පුළුල් කරයි.

රක්ෂණ කර්මාන්තය තුළ දැනට ක්‍රියාත්මකවන සුවිශේෂී නීතිරීතිවලට අමතරව රක්ෂණ කර්මාන්තයට උචිත පරිදි 2007 අංක 7 දරන සමාගම් පනත, 2006 අංක 10 දරන සංශෝධිත දේශීය ආදායම් පනත, 2006 අංක 19 දරන විද්‍යුත් ගණුදෙනු පිළිබඳ පනත, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සහ 1995 අංක 11 දරන ගැටළු නිරාකරණය කිරීමේ පනත මෙකී ඇතැම් නීති රීති සහ රෙගුලාසිවලට ඇතුළත් වේ.

අනුකූලතා අවදානම; අදාළ නීති, රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියාපරිපාටි සහ ව්‍යාපාර මූලධර්ම වලට අනුකූලවීමට අපොහොසත්වීම, නොවිසේනම්, දඩ, සිවිල් හෝ අපරාධ දණ්ඩනයන් යනාදියට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ලක්විය හැකි අනුකූලතා අවදානම ඵලදායක ලෙස කළමනාකරණය කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විශ්වාසනීයත්වයට වන අවදානම හෝ හානිය වශයෙන් අර්ථ නිරූපනය කරනු ලබයි. සෑම මට්ටමකම සියළුම කාර්ය මණ්ඩලය නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරනවා පමණක් නොව වගකීම සිත්හි දරාගෙන විශ්වාසනීයත්වයකින් කටයුතු කිරීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ව්‍යාපාර මූලධර්මවලින් අපේක්ෂා කෙරේ. පාරිභෝගිකයන් ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අපේක්ෂා ඉටු කිරීමට යහපත් අනුකූලතා අවදානම් කළමනාකරණය සම්බන්ධ වී සිටින බවට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව අවබෝධ කරගෙන සිටියි.

අනිවාර්යය නීති (රෙගුලාසි සහ කර්මාන්තයේ නීති මාලාවන් යනාදිය සහ අභිමත අවදානම් (ව්‍යාපාර උපායමාර්ග, අභිමතාර්ථ සහ සමායතන ප්‍රතිපත්ති යනාදිය) සමතුලිත කර ගනිමින් අනුකූලතා අවදානම් රුචිකත්වය ලබාදීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුවේ. ඵලදායී අනුකූලතා අවදානම් කළමනාකරණය යනු අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන නෛතික හා මානව සම්පත් වැනි ආයතනය තුළ සියළුම විවිධාංග කරන පාලන කාර්යයන් එකට ඉදිරියට යොමු කිරීම සහ උපරිම තත්ත්වයෙන් ප්‍රයෝජනය ලබා ගැනීමට මෙහෙයවනු ලබන සාමූහික ක්‍රියාවලියක් වේ.

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

අවදානම් කළමනාකරණය ඉතිරි කොටස.

කාර්ය මණ්ඩලයේ සහ කළමනාකරණයේ භාවිතය සඳහා නිර්මාණය කරන ලද පූර්ණ අනුකූලතා රාමුවකින් හෝ අනුකූල වැඩසටහනකින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමන්විත වන අතර අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට ස්වකීය පෞද්ගලික පරිගණක තුලින් ප්‍රවේශවිය හැකි අප ආයතනයේ අභ්‍යන්තර ජාලයේ අනුකූලතා වෙබ් පිටුව තුළ එකී අනුකූලතා රාමුව සඳහන් කර ඇත. අදාල ව්‍යවස්ථාපිත සහ නියාමන අනුකූලතා වගකීම් කාර්ය මණ්ඩලයට සහ කළමනාකරණය වෙත ලබා දීම පිළිබඳ විදිනෙදා තොරතුරු (මූලික වශයෙන් ආයතනයේ අභ්‍යන්තර ජාලය සහ ලෝටස් සටහන් මගින්) හඳුනාගැනීම, ලේඛනගත කිරීම හා සන්නිවේදනය කිරීම අනුකූලතා වෙබ් පිටුවේ ප්‍රධාන අභිමතාර්ථය වේ. සමාලෝචන වර්ෂය තුළ බාහිර විගණකවරයාගේ වාර්තාවේ අනාවරණය කිරීම්වලට යටත්ව සියළුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා රීති සහ රෙගුලාසි, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සහ අදාළ අමාත්‍යාංශ විසින් අධ්‍යක්ෂකවරුන් නම් කරනු ලැබීම සහ පත්කරනු ලැබීමට අනුව අධ්‍යක්ෂකවරුන්ගේ පත් කිරීමට අදාළව සමායතන පාලන වාර්තාව මෙම ආයතනය විසින් සම්පාදනය කරනු ලබයි.

අප ආයතනයේ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් අදාළ කරගනු ලැබිය යුතු නීති,රීති සහ රෙගුලාසි සම්බන්ධයෙන් වගකිව යුතු අයෙක් හඳුනාගෙන අනුකූලතා අවශ්‍යතා සපුරාලීමේදී සහයෝගිතවෙන් කටයුතු කරන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරයි. පූර්වගාමී ව්‍යාපාර කටයුතු ක්‍රියාවලි කළමනාකරණ විසඳුම් මගින් නව රෙගුලාසිවලට නව පිරිවැය ඵලදායී ලෙස පිළියම්ලබා දීම පිණිස අවශ්‍ය මෙවලම් ආයතනයට සපයා දෙන බැවින් පූර්වගාමී පියවරක් වශයෙන් අපේක්ෂා කරනු ලබන අනාගත රෙගුලාසි කළමනාකරණය කිරීම සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුව මාර්ගෝපදේශ ලබා දෙයි.

අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර සන්නිවේදන ක්‍රියාමාර්ග හරහා අනුකූලතා උපදෙස් මාර්ගයෙන් දෙපාර්තමේන්තු මට්ටමේ පුහුණු කිරීම් හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන් දැනුවත් කිරීම ද සිදු කරනු ලබයි. වඩාත් ඵලදායී ලෙස අනුකූලතා කළමනාකරණය කෙරෙහි අවදානය යොමු කිරීම සඳහා ඉදිරි අනාගතයේදී සුවිශේෂී හැකියාවන්ගෙන් යුත් අනුකූලතා ප්‍රාග්ධනය උපයෝජනය කිරීම උදෙසා පහසුකම් සලසන්නාවූ ආයතනය සතු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් උසස් තත්ත්වයට පත් කිරීමේ කටයුතුවල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නිරතවෙමින් සිටියි.

අනුකූලතා අවදානම් ක්ෂේත්‍රය තුළ, පෙළ වශයෙන් ආකෘති හතරක ආරක්ෂක මොඩියුලයක් ක්‍රියාත්මක වන අතර, පළමු පෙළ ආරක්ෂක පෙළ වශයෙන් ක්‍රියාකරන අදාළ දෙපාර්තමේන්තුවල අවදානම් හවුල්කරුවන් වශයෙන් හඳුනාගනු ලබන තථ්‍ය අවදානම් හිමිකරුවන්; අවදානම් කළමනාකරණ කමිටුව හා විගණන හා අනුකූලතා කමිටුව දෙවන ආරක්ෂක පෙළ වශයෙන් ද; තෙවන ආරක්ෂක පෙළ වශයෙන් ක්‍රියාකරන මූල්‍ය විශ්වද්ධිකරණය උදෙසා වන අභ්‍යන්තර විගණන අංශය ද; රක්ෂණ නියාමකයා වන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (සහ බාහිර විගණකවරුන් ද (2010 අගෝස්තු 23 දිනැති අංක 29 දරන චක්‍ර ලේඛය අදාළවේ) හතරවන ආරක්ෂක පෙළ වශයෙන් ක්‍රියා කරයි. අනුකූලතා අවදානම් න්‍යාය පත්‍රය විගණන න්‍යාය පත්‍රයට දෙවෙනි නොවන බව තහවුරු කිරීම සඳහා, අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් විගණන හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් විගණන තහා අනුකූලතා කමිටුව සහ අවදානම් කළමනාකරණ කමිටුව යන දෙපාර්ශවයටම වාර්තා කරයි.

අවදානම් රුචිය පිළිබඳ නිර්ණය කර ඒවා සන්නිවේදනය කිරීම, අනුකූළතාව පිළිබඳ අවදානම් කළමනාකරණය ඒකාබද්ධ අධීක්ෂණයකට ලක් කිරීම; විවෘත හා විනිවිදභාවයකින් යුතු වාර්තාකරණයට සහයෝගය දැක්වීම සහ පාර්ශවකරුවන් සමඟ සහයෝගිතාවය වර්ධනය කිරීම මගින් අනුකූලතා අවදානම් ඇතිවීම් සම්භාවිතාව අවමකර ඇත.විගණන හා අනුකූලතා කමිටු ප්‍රඥප්තිය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කලින් කලට සමාලෝචනයට ලක් කරනු ලබන අතර විගණන හා අනුකූලතා කමිටුවේ නිර්දේශ සහිත වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකූලතා කාර්යට සැබෑ ලෙසම සහයෝගය දැක්වීම උදෙසා 2016 අප්‍රේල් මාසයේ දී නව ප්‍රඥප්තිය අනුමත කරන ලදි.

වංචා හා විෂමාචාර පිළිබඳ අවදානම් කළමනාකරණය

වෙළඳපොළ විශ්වාසය සහ මහජන විශ්වාසය ආරක්ෂාකර පවත්වා ගෙන යාම සඳහා අවංකභාවය උදෙසා ඉතා උසස් කීර්තියක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. අපගේ ක්ෂේත්‍රය තුළ වත්කමක් වශයෙන් වාර්තාගත කරනු නොලැබුවද, දැනට පවත්නා රක්ෂණ ඔප්පු අළුත්කර ගැනීම සහ නව ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම යන දෙයාකාරය තුළින් ව්‍යාපාරය අඛණ්ඩව ඉදිරියට ගලා යාමක් ඇති කරන්නාවූ ප්‍රධාන සංචිතය බවට එය පත්වී ඇත. අවාසනාවකට මෙන් නෛතික, නියාමන හෝ කීර්තියට සිදුවන හානිය වැනි විවිධාකාර වූ මෙහෙයුම් අවදානමකට අප ආයතනය නිරාවරණය කරමින් මෙම වංචා සහ විෂමාචාර මගින් ව්‍යාපාර අඛණ්ඩව ඉදිරියට ගලා යාම අහිතකර ලෙස දුර්වල කරනු ලැබිය හැකිය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තුළ, අත්දැකීම් සහිත ව්‍යාපාරික කටයුතු මෙහෙයවන කාර්ය මණ්ඩලය විසින් විදින් විදා පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරාලමින් මධ්‍ය කාර්යාලයේ සහ මෙහෙයුම් ප්‍රදේශවල ස්වකීය කාර්ය මණ්ඩලයේ අනෙකුත් අය සමඟ මෙන්ම අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්ය මණ්ඩලය සමඟ එකට එකතුවී පරීක්ෂා කර බැලීමේ සහ විභාගකර බැලීමේ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් තුළින් මෙම අවදානම් අවම කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා කටයුතු කරයි.

අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශක්තිමත් කළමනාකරණ කණ්ඩායමක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුව ඇත. වාර්ෂික විගණන සැලැස්ම අනුව, හිමිකම් ගෙවීම් යනාදිය, රක්ෂණ වාරික එකතු කිරීම, ණය පාලනය සහ කොමිස් මුදල් ගෙවීම වැනි සියලුම ඉහළ අවදානම් අංශ ඒමඟින් ආවරණය කෙරේ. මෙමඟින් අවධානය යොමු කරනුයේ වංචා සහ විෂමචාර අවදානම් වැළැක්වීම හසුකර ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම චර්යා ධර්ම සහ අනුකූළතා වැඩසටහන් මෙන්ම අදාළ වංචා විරෝධී වැඩ සටහන් සහ පාලනය කිරීම් නිර්මානය කිරීම,

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ක්‍රියාත්මක කිරීම සහ ඇගයීමට කටයුතු කිරීම මගින් මෙම සැලැස්ම ක්‍රියාත්මක කරනු ලැබේ. බොහෝ කාර්යයන් වලින් සුවිශේෂී ප්‍රතිඵල ලැබී ඇති අතර අවංකභාවය සහිත කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපාර කටයුතු කිරීමේ පහසුව, මෙහෙයුම් අවදානම් සහ පාලනය කිරීම් සමතුළිත කර ගැනීම කෙරෙහි යොමු කරනු ලබයි. විගණනයේ දී, සියුම් පරීක්ෂාව ඉතා ඉහළ මට්ටමක පවතින බවත් වැරදි සිදුවීමට ඇති ඉඩකඩ පහත් මට්ටමක පවතින බව සහිටුහන් කළ යුතුය.

විගණනයේ වළක්වා ගැනීමේ ප්‍රතිපත්තිවලට අමතරව, අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් ද වංචාවලට එරෙහි නීති සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට බැඳී සිටියි. මෙම දෙපාර්තමේන්තු දෙක විසින් අඛණ්ඩව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ නිරතව සිටින අතර ඒ පිළිබඳ විගණන මණ්ඩලයට හා අවදානම් කළමනාකරණ කමිටුවලට ස්වාධීනව වාර්තා කරනු ලබයි.

ඊට අමතරව, ජීවිත හා ජීවිත නොවන රක්ෂණ කටයුතුවල ප්‍රාරක්ෂණ සහ හිමිකම් ගෙවීම් කිරීමේ ක්‍රියාවලින් විමර්ශන දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතුවලටද භාජනය වේ. ප්‍රාරක්ෂණ හා හිමිකම් ගෙවීමේ අත්දැකීම් තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සහ පාඩු ලැබූ ප්‍රමාණයන් පිළිඹිඹු කරන බවට තහවුරු කිරීම සහ අවදානම් සහ ගෙවීම්වල යම් අසාමාන්‍ය හැසිරීමක් පූර්ණ වශයෙන් සමාලෝචනය කිරීම තහවුරු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව ඉතා පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත වේ.

මානව සම්පත් අවදානම් කළමනාකරණය

යම් ආයතනයක අවදානම්කර තත්ත්වයට මානව සම්පත පත් කරන්නාවූ, එකී ආයතනයේ සේවක පිරිසගේ තත්ත්වය සහ කාර්යසාධනය මත ආයතනයක සාර්ථකත්වය විශාල වශයෙන් රඳා පවතියි. කර්මාන්තය තුළ දිනෙන් දින ඉහළ යන තරඟකාරිත්වයට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ස්වකීය නිපුණත්වයක් සහිත මානව සම්පත් පිළිබඳ නැවත සිතා බැලිය යුතු අතර තිරසාර සංවර්ධනයක් පවත්වාගෙන යාම පිණිස මෙකී ප්‍රමුඛතාවයන්ට සහ අවදානම්වලට සාර්ථකව මුහුණ දීම සඳහා ස්වකීය මානව සම්පත් ක්‍රියාකාරිත්වය පරිවර්තනයකට ලක් කළ යුතුය.

මානව සම්පත කළමනාකරණය කිරීමේදී ආයතන විසින් මුහුණ දෙන අවදානම් පිළිබඳ දැනුවත් වීම වෙනදාටත් වඩා ඉතා තීරණාත්මක කරුණක් වී ඇත. එම නිසා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පහත සඳහන් පරිදි අවදානම් සාධක කීපයක් හඳුනාගෙන ඇත.

දක්ෂතා අත්පත්කර ගැනීම සහ කළමනාකරණය

දක්ෂතා අත්පත්කර ගැනීම සහ කළමනාකරණය ඇතැම්විට, මානව සම්පත් කළමනාකරණයේදී මුහුණ දීමට සිදුවුනු ඉතාමත් තීරණාත්මක අංගයකි. විධිමත් සම්පත් සම්පාදනය අධික කාර්යමණ්ඩලය හෝ හිඟ කාර්ය මණ්ඩලය පවත්වාගෙනයාම වළක්වයි. මෙම අවදානම් හැසිරවීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පහත සඳහන් පියවර ගෙන ඇත.

- ආයතනයට වාර්ෂිකව අවශ්‍ය සේවක සංඛ්‍යාව හඳුනා ගැනීම
- ආයතනයට රක්ෂණ සහයකයන් ලබා ගැනීම සඳහා බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම
- ඇළුතින් බඳවා ගන්නා සාමාජිකයන් ඉතා ඉක්මණින් ඵලදායී සේවකයන් බවට පත් කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රියාවලින් ක්‍රියාත්මක කිරීම

නියාමනය සහ අනුකූලතාවය

මානව සම්පත් වෘත්තිකයන් විසින් දේශීය කම්කරු රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවයෙන් සිටීම අවශ්‍යවන අතර ඔවුන් නිරන්තරයෙන් අනුකූලව කටයුතු කරනු ලබන බවට තහවුරු කළ යුතුය. නියාමන සහ අනුකූලතා අවදානම් අවමකර ගැනීම උදෙසා මානව සම්පත් දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් පියවර ගෙන ඇත.

අ. මූලික මූලධර්ම නිවැරදිව අනුගමනය කිරීම සඳහා දේශීය සහ අදාළ ජාත්‍යන්තර කම්කරු නීති අවබෝධකර ගැනීම
ආ. අනුකූලතාවය තහවුරු කිරීම සඳහා මානව සම්පත් ක්‍රියාවලින් පිළිබඳ අඛණ්ඩව විගණන පරීක්ෂණ සිදු කිරීම

වැටුප් සහ වන්දි

සේවකයන් රඳවා තබා ගැනීම මෙන්ම ඵලදායීතාවය ඉහළ නංවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පහත දක්වා ඇති පරිදි වර්ෂය තුළ ඉතා වැදගත් ක්‍රියා මාර්ග කීපයක් ගෙන ඇත.

අ. වැටුප් සංශෝධන සමඟ 2016 වර්ෂය තුළදී වැටුප් සමීක්ෂණයක් සිදු කිරීම
ආ. වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සංශෝධනය කිරීම සඳහා සාමූහික කේවල් කිරීමේ යාන්ත්‍රණය භාවිතා කිරීම
ඇ. වෛද්‍ය රක්ෂණ සහ කාර්ය මණ්ඩල ණය පහසුකම් ඉහළ නැංවීම අඛණ්ඩව සිදු කිරීම

පුහුණු කිරීම සහ සංවර්ධනය

ආයතනය තුළ සුදුසු සේවකයන් රඳවා තබා ගැනීමට වැටුප් ගෙවීම පමණක් ප්‍රමාණවත් නොවේ. සංස්ථාව තුළ මානව ප්‍රාග්ධනයේ වටිනාකම ඉහළ නංවනු පිණිස සහ සේවකයන්ගේ වෘත්තීමය දියුණුව ලඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පහත සඳහන් පරිදි උපායමාර්ග කීපයක් සඳහන් කර ඇත.

අ. කාර්මික පුහුණු කිරීමේ අවශ්‍යතා විශ්ලේෂණ සිදු කිරීම
ආ. පුහුණු සැලසුමට ඇතුළු කිරීම සඳහා පුහුණු කිරීම්වලට අදාළ කාල සටහන සහ පුහුණු කිරීම් වලට අදාළ අයවැය සකස් කිරීම
ඇ. පුහුණු හා කුසලතා සංවර්ධන වැඩ සටහන් තුළින් ස්වකීය හැකියාවන් වර්ධනයකර ගැනීම සඳහා සේවකයන්ට ඉඩ ප්‍රස්ථා සපයා දීම (දේශීය සහ විදේශීය)
ඈ. ආයතනය තුළ ඉගෙන ගැනීමේ සංස්කෘතියක් ඇති කිරීමට ධෛර්යමත් කිරීම

විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව

2016 වර්ෂයේදී විගණන සහ අනුකූලතා කමිටුව පී. අල්ගම මහතා (අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත) සහ මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා යන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනාගෙන් සමන්විත වූ අතර එම කමිටුවල ලේකම් වශයෙන් සංස්ථාවේ සමාගම් ලේකම් කටයුතු කරන ලදී.

ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහායක කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන ලද වටිනා සහයෝගය සහිතව කමිටුවේ රාජකාරී කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා මූල්‍ය හා රක්ෂණ අංශ පිළිබඳ ප්‍රමාණවත් විශේෂඥ දැණුමක් කමිටුව සතුවේ.

යොමු කිරීමේ අනුදේෂ

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමයන් හුවමාරු කොමිසම සහ ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් එක්ව 2013 වර්ෂයේදී නිකුත් කර ඇති සංස්ථාපිත පාලනය පිළිබඳ විශිෂ්ඨ පරිච සංග්‍රහය ඇතුළුව, විගණන කමිටු පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්ම සහ විශිෂ්ඨ පරිචයන් මත පදනම්වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ විගණන සහ අනුකූලවීමේ කමිටු ප්‍රඥප්තියේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණන හා අනුකූලවීමේ කමිටුවේ යොමු කිරීමේ අනුදේශ, පැහැදිලිව නිර්වචනය කර ඇත. කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කර ඇති මූල්‍ය, ගිණුම්ගතකරණය, ප්‍රසම්පාදනය, නෛතික අනුකූලවීම සහ සාරධර්ම වලට අදාළ සමාගමේ නිරාවරන පාලන පද්ධතියේ සහ අභ්‍යණ්තර පාලන පද්ධතිය සහ ව්‍යාපාර කටයුතු අවදානම කළමනාකරණය කිරීම අධීක්ෂණය කිරීම යනාදිය කෙරෙහි ඇති වැඩිවූ අනවධානය ප්‍රඥප්තියේ විෂයපථය මගින් ආවරණය කරයි. කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලයට වගකිවයුතු වන අතර කමිටුවේ කාර්යයන් පිළිබඳ නිරතුරුවම මණ්ඩලයට වාර්තා කළ යුතුවේ.

කමිටුවේ රැස්වීම්

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය තුළදී, කමිටු රැස්වීම් 4ක් පවත්වන ලදි. කමිටු රැස්වීම්වල කාර්යපටිපාටින් ප්‍රමාණවත් විස්තර සහිතව වාර්තාගත කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලයට ද අඛණ්ඩව වාර්තා කරනු ලබයි. රැස්වීම සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

විගණන හා අනුකූලතා කමිටු රැස්වීම් - 2016

අධ්‍යක්ෂවරයාගේ නම	පැමිණීම
පී. අල්ගම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ සහ කමිටුවේ සභාපති)	4
මහාචාර්ය එල්.ජී. චන්ද්‍රසේන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)	4

විගණන හා අනුකූලතා කමිටුවේ වගකීම් සහ කාර්යභාර

I. මූල්‍ය වාර්තාකරණ පද්ධතිය

මෙහි දී යහපත් මූල්‍ය වාර්තාකරන පද්ධතියක් ක්‍රියාත්මක වනබවට තහවුරු කිරීම සඳහා, වෙනත් කරුණු අතර පහත සඳහන් අංගයන් ද ක්‍රියාවට නංවයි.

- පද්ධති සැලසුම් කිරීම සහ නිර්මානය කිරීම එම පද්ධති ලේඛනගත කිරීම සහ අවශ්‍ය පරිදි ප්‍රතිගත කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සම්පත්
- සෑහීමකට පත්වන පරිදි ක්‍රියාත්මක වීම පිළිබඳ ප්‍රතිචාර ලබා ගැනීම හා සමාලෝචනය කිරීම සඳහා වන පද්ධති
- විශේෂ දේ වාර්තා කිරීම ඇතුළුව, කළමනාකරණ තොරතුරු වාර්තාවල අඩංගු ප්‍රමාණවත් කරුණු සහ ගුණාත්මකභාවය
- ප්‍රමාණවත් මූල්‍ය අධිකාරී සීමාවන් සහිත මූල්‍ය කාර්යයන් නිසි පරිදි පැවරීම ඇතුළුව මූල්‍ය ගනුදෙනු සඳහා යහපත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම
- ස්පර්ශ්‍ය සහ අස්පර්ශ්‍ය යන ආකාර වත්කම් ආරක්ෂා කිරීම සඳහා වන පද්ධතිය
- ස්වයංක්‍රියකරණය කරන ලද පද්ධතියක් තුළින්, මෘදුකාංග/දෘඩාංග භාවිතය පිළිබඳ සමාලෝචනය කිරීම්, තොරතුරු තාක්ෂණ පද්ධතිවලට ප්‍රවේශවීමේ බලය, ප්‍රධාන කාර්ය මණ්ඩලය මත රඳා පැවතීම, තොරතුරු තාක්ෂණය සහ ඒ ආශ්‍රිත අවදානම මත රඳා පැවතීමේ ප්‍රමාණය
- අධ්‍යක්ෂ මණ්ඩලයට තෛමාසික ගිණුම් අනුමත කිරීම සඳහා යෝජනා කිරීම
- ප්‍රධාන සාමාජිකයන් සහ බාහිර විගණකවරුන් සමඟ කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම

II. ව්‍යාපාර අවදානම් කළමනාකරණය

ව්‍යාපාර අවදානම් හඳුනාගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා ක්‍රියාවට නංවා ඇති ක්‍රියාපටිපාටිවල යෝග්‍යතාවය සමාලෝචනය කිරීම උදෙසා

අවදානම් පිළිබඳ නිදර්ශන වලට පහත සඳහන් දේ ඇතුලත්වන නමුදු ඊට සීමා නොවී,

- සිවිල් කැළඹීම් නිසා නිෂ්පාදනය, බෙදා හැරීම සහ අලෙවිය කඩා වැටීම
- තරඟකරුවන් ඇතුලත්වීම
- බදු ඉවත් කිරීම හෝ පැනවීම
- විනිමය අනුපාතය උච්චාවචනය වීම/පොලී අනුපාතය උච්චාවචනය වීම
- ප්‍රධාන සේවකයන් ක්ෂණිකව අහිමිවීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

- තොරතුරු තාක්ෂණ පද්ධතිය අක්‍රියවීම (පරිගණක ආරක්ෂාව සහ විද්‍යුත් දත්ත සැකසීමට අදාළ පාලන ක්‍රම ප්‍රමාණවත් බව ඇගයීම සඳහා ව්‍යාපාර කටයුතුවලට අදාළ තොරතුරු තාක්ෂණයේ වැදගත්කම අපේක්ෂා කරමින්)
- කලාපීය සහ ගෝලීය පරිසරයේ වෙනස්වීම්
- විගණන සැලසුමේ අඩංගු දෑ පිළිබඳ තොරතුරු ලබාදීම සඳහා අභ්‍යන්තර විගණන කණ්ඩායමේ සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් බව තහවුරු කිරීම
- නියමන වෙනස්වීම්

III. අභ්‍යන්තර පාලනය

(අ) සියලුම් කාර්යයන් වලට අදාළ අභ්‍යන්තර පාලනය පිළිබඳ පද්ධති, එනම් නිෂ්පාදනය, අලෙවිකරණය, මූල්‍යයනය, ප්‍රසම්පාදනය, මානව සම්පත් තොරතුරු සහ පොදු කටයුතු යනාදිය මැනවින් අවබෝධ කරගනු ලබන බව සහ ඵලදායීව පරිපාලනය කරනු ලබන බව, මෙන්ම පාලන පද්ධති ක්‍රියාවට නංවා ඇති බවට කාර්යක්ෂමව ක්‍රියාත්මකවන බවට සහ නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික වීම තහවුරු කිරීම;

(ආ) ප්‍රධාන ව්‍යාපාරික වෙනස්වීම් ආරම්භ වීමට ප්‍රථම පාලන කටයුතු උදෙසා සහ එවැනි වෙනස්වීම් අධීක්ෂණය කිරීම සඳහා විධිමත් සැලසුම් තිබෙන බවට තහවුරු කිරීම;

(ඇ) ආයතනයේ අභ්‍යන්තර විගණනෙ කටයුතු සිදු කිරීම සඳහා උපායමාර්ග, සැලසුම් සකස් කිරීම, සේවා සැපයීම් හා සංවිධාන කටයුතු සහ වඩාත් උසස් පරිචයන් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ක්‍රමවේදයක් ක්‍රියාවට නංවන බවට, විශේෂයෙන්,

i. ආයතනයේ අභ්‍යන්තර විගණන සැලසුම් සමාලෝචනය කිරීම උදෙසා සහ එම සැලසුම්වල අනුකූලතාවය, ආවරණය මෙන්ම ක්‍රමවේදයන් සම්බන්ධයෙන් සෑහීමකට පත්වීම සඳහා,

ii. ආයතනයේ නියෝග සහ අනුමත කරන ලද විගණන සැලසුම් සම්පූර්ණ කිරීම සඳහා ඊට හැකිවන පරිදි අභ්‍යන්තර විගණනයට නියාමන සම්පත් සහ යෝග්‍ය තත්ත්වයක් ඇති බවට සෑහීමකට පත්වීම

iii. ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයෙන් ලැබෙන තත්ත්ව වාර්තා සමාලෝචනය කිරීම සහ හඳුනාගනු ලැබූ ගැටළු හෝ කටයුතු වල ප්‍රතිඵලයක් වශයෙන් සුදුසු යැයි සලකනු ලබන යම් පුළුල් සමාලෝචනය කිරීම නිර්දේශ කිරීම.

iv. අභ්‍යන්තර විගණන කටයුතු සඳහා, එකඟවූ අරමුණු ඉටු කිරීම උදෙසා අවශ්‍ය වන වෙළඳපොළ කටයුතු අවසන් කරන සියලුම දෑ, ලේඛන, දේපළ සහ පිරිස් වෙත ළඟා වීමට පූර්ණ නිදහස් හා සීමා නොකරන ලද ප්‍රවේශයක් ඇති බවට සහතික වීම.

V. ආයතනයේ පද්ධතිය ක්‍රියාවිරහිත වීම් සමාලෝචනය කිරීම සහ එකී දුර්වලතාවයන් සඳහා පිළියම් යෙදීමට සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.

VI. විගණනය අවශ්‍යයැයි හැඟෙන යම් විශේෂ විගණනයක් සිදු කිරීමට ඉල්ලා සිටීම සහ එකී විගණනය සමාලෝචනය කිරීම.

(ඈ) ආයතනය තුළ බලය පවරා දෙනු ලැබූ අධිකාරීන් සමඟ එකඟතාවයකින් අභ්‍යන්තර පාලනය අධීක්ෂණය කිරීම සඳහා සෑහීමට පත්විය හැකි ක්‍රියාමාර්ග ගෙන තිබෙන බවට තහවුරු කර ගැනීම.

(ඉ) ආයතනයේ අභ්‍යන්තර විගණන පද්ධතිය පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කිරීම සහ යම් ආකාරයක පරතර ඇත්නම් හඳුනා ගැනීම.

(ඊ) ආයතන කළමනාකරණය සමඟ ඇතිවන අභාලාෂයන් පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන් වාර්තා කිරීම උදෙසා ප්‍රමාණවත් ක්‍රමවේදයන් පවතින බවට සහ එකී ක්‍රමවේදයන් සාධාරණ හා යුක්ති සහගත බවට ඇගයීම සහ පවත්නා රෙගුලාසි සහ ප්‍රමිතීන්ට අනුකූලව වාර්තා කරනු ලබන බවට තහවුරු කිරීම.

(උ) මූල්‍ය අක්‍රමිකතා අයුතු ලෙස භාවිතා කිරීම් රෙගුලාසිවලට අනුකූල නොවීම පිළිබඳ විමර්ශනය කිරීම හා එකී තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සුදුසු පිළියම් ක්‍රියාමාර්ග සහිතව වාර්තා කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයාට අවශ්‍ය ස්වාධීනත්වය තිබිය යුතු බවට සහතික කිරීම.

අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවක් පවතින අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වය දරනු ලබන්නේ සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරිවරයෙකු විසිනි. අභ්‍යන්තර විගණන වැඩපිළිවෙල විගණන හා අනුකූලතා කමිටුවට ඉදිරිපත් කර එහි අනුමැතිය ලබාගන්නා අතර කමිටුව විසින් අභ්‍යන්තර විගණනය සහ විමර්ශන කාර්යභාරය අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

විගණන සහ අනුකූලතා කමිටු වාර්තාව ඉතිරි කොටස.

බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්ති ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයා වශයෙන් විගණකාධිපතිවරයා පත් කරන ලදී. 2015 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්ෂික විගණනය සිදු කිරීමේදී විගණකාධිපතිවරයාට සහය වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) වගන්තිය ප්‍රකාරව සුදුසුකම් ලත් විගණකවරයෙකු වශයෙන් ඊඛ හවුල්කරුවන් පත්කරනු ලැබ ඇත.

විගණන කමිටුවට ගලා එන තොරතුරු

ස්වකීය වගකීම් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට විගණන කමිටුවට ප්‍රමාණවත්, විශ්වාසනීය සහ කාලීන තොරතුරු ආයතන කළමනාකරණයෙන් සහ බාහිර විගණකවරුන්ගෙන් ලැබී ඇති බවට විගණන හා අනුකූලතා කමිටුව විසින් සහතික කිරීම

වත්කම් හා වගකීම් අගය සහ හානිය

සාධාරණ අගය ගණනය කිරීමේ භාවිතය ඉහළ යාම සහ එහි ව්‍යාප්ත වීමේ වැදගත්කම සැළකිල්ලට ගෙන, සාධාරණ අගයන් ව්‍යුත්පන්න කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් උපලේඛන විගණන කමිටු විසින් යෝග්‍ය ලෙස අනාවරණය හොඳින් පරීක්ෂා කර හා අභියෝගයට ලක් කරනු ලැබ ඇති බව විගණන කමිටුව සහතික කිරීම හානියට පත්වීමේ ක්‍රියා සඳහා වන ක්‍රියාමාර්ගය ප්‍රමාණවත් බව වගණන කමිටුවේ මතය වේ.

ස්වාධීන බාහිර උපදෙස්

විගණන කමිටුවේ ප්‍රඥප්තිය මගින්, සුදුසු අවස්ථාවලදී ස්වාධීන බාහිර උපදෙස් ලබා ගැනීමට විගණන කමිටුවට ඉඩ සලසයි.

අනුකූලතා ක්‍රියාත්මක වීම

සමාගමේ අනුකූලතා වැඩසටහන, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය, නියෝජ්‍ය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අනුකූලතා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු - මූල්‍ය විසින්, එක් එක් දෙපාර්තමේන්තුවල අනුකූලතා සම්බන්ධීකාරවරුන් ගේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කරනු ලබයි. අනුකූලතාව සහතික කිරීම සඳහා තමන් වෙත පවරනු ලැබූ සුවිශේෂී බැඳීම් සහිතව වගකියන්නාවූ නිලධාරීන් වශයෙන් නම් කරනු ලැබූ මෙහෙයුම් දෙපාර්තමේන්තුවල මෙහෙයුම් ප්‍රධානීන් විසින් මෙහෙයුම් කටයුතු සිදු කරන අංශවලට අදාළ අනුකූලතා වගකීම් ක්‍රියාවට නංවනු ලබයි. අභ්‍යන්තර වගණන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව මුදල් විශුද්ධිකරණයට එරෙහි කටයුතු විගණනය කරනු ලබයි. ඊට අමතරව, තුන්වන පෙළ ආරක්ෂකයා වශයෙන් අනුකූලතා කටයුතු ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව විගණනය කරනු ලබයි.

යහපාලනය

කමිටුව විසින් සමායතන යහපාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාම අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. කාර්ය මණ්ඩලය විසින් යම් වැරදි ක්‍රියාවන් හෝ වෙනත් සම්මත විරෝධී කටයුතු පිළිබඳව සැක කරන අවස්ථාවන්වලදී අතිශය රහස්‍යභාවය මත ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සියලුම කාර්ය මණ්ඩලය දිරිමත් කරනු ලැබී ඇත. වාර්තාගත වූ එවැනි සියලුම සිදුවීම් සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණ පැවැත්වීම සඳහා සුදුසු කාර්ය පටිපාටීන් ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ඒ ආකාරයෙන් තොරතුරු හෙළිදරව් කරන්නන්ගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් දැඩි රහස්‍යභාවයක් පවත්වා ගනු ලබන බවට කාර්ය මණ්ඩලයට තහවුරු කර ඇත.

නිගමනය

විගණන හා අනුකූළවීමේ කමිටුව විසින් සමාගමේ පාලන කටයුතු ඵලදායීව ක්‍රියාත්මක කරනු ලබන බවටත්, සමාගමේ වත්කම් ප්‍රමාණවත් පරිදි ආරක්ෂා කරනු ලබන බවටත් සෑහීමකට පත්වේ. සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ බාහිර විගණකවරුන් කාර්යක්ෂමතාවයකින් හා ස්වාධීනත්වයකින් කටයුතු කරනු ලැබ ඇති බවට කමිටුව විසින් සෑහීමකට පත්වේ. ඊට අමතරව, ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ යෝග්‍යතාවය සහ ඒ තුළින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන මත විශ්වාසනීයභාවය තැබිය හැකි බවට සාධාරණ තහවුරු කිරීමක් ලබාදෙන බවටද කමිටුව විසින් සෑහීමකට පත්වේ. එසේම, සමාලෝචිත වර්ෂය තුළ, සමාගමේ අනුකූලතා රාමුව මගින් සමාගමට අදාල වන්නාවූ සියලුම නීතිරීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන බවට සහ වාර්තාගත වූ අනුකූල නොවීම් පිළිබඳ නිවැරදි කරන නිවාරන ක්‍රියාමාර්ග ගෙන ඇති බවට තහවුරු කරන බවටද කමිටුව මගින් තවදුරටත් සෑහීමකට පත්වේ.

මෙම වාර්තාව 2017 මැයි 3 වන දින විගණන හා අනුකූලතා කමිටුව විසින් අනුමත කරන ලදී.

සී. අල්ගම
සභාපති - විගණන හා අනුකූලතා කමිටුව
2017 මැයි 25 වන දිනදීය.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ආයෝජන කමිටු වාර්තාව

ආයෝජන උපාය මාර්ග

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආයෝජන අරමුණු සහ අභිමතාර්ථ ප්‍රතිලාභ අපේක්ෂාවන්, අවශ්‍යතා සහ අවදානම් දරා සිටීමේ හැකියාව අනුව සඳහන් කරනු ලැබ ඇත. පහත සඳහන් කරුණු ඊට ඇතුළත් වේ.

- ආයෝජන අරමුණු හා අභාමතාර්ථ ප්‍රමාණය අයත් සම්බන්ධිත සියලුම පාර්ශ්වයන් උදෙසා පැහැදිලි අවබෝධතාවයක් ස්ථාපනය කිරීම.
- අවදානම්වල පවතින ස්වභාවය සහ වියහැකි බව මෙන්ම ප්‍රතිලාභ, ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන සුරක්ෂණ අරමුණු සමඟ එහි ඇති සම්බන්ධතාවය පැහැදිලි කිරීම.
- ආයෝජන ප්‍රතිඵල ඇගයීමට ලක් කිරීම සඳහා පදනමක් ස්ථාපිත කිරීම.
- වත්කම් කළමනාකරණය කරනු ලබන්නා වූ අදාළ ආයෝජන සීමාව ස්ථාපනය කිරීම.
- ආයෝජන උපායමාර්ග එහි දීර්ඝකාලීන අභිමතාර්ථවලින් ඉවත් කිරීමට යොමු කරනු ලැබිය හැකි අද්වේගී තත්ත්වය සහ ක්‍රියාකාරිත්ව ගැටළු ඉවත් කිරීම සඳහා වත්කම් වර්ග සියල්ල ආවරණය වන පරිදි වත්කම් වෙන් කිරීමේ වාර්ගෙ ාපදේශ ඇති කිරීම.
- ආයෝජන ප්‍රතිපත්ති හා උපාය මාර්ග නිර්ණය කිරීම හා අනුමත කිරීම, මූල්‍ය කළමනාකරුවන්, අවසර දියහැකි සුරැකුම් සහ වත්කම් විවිධාංගිකරණයට අදාළ මාර්ගෝපදේශ තෝරාගැනීම.
- අරමුදල් කළමනාකරුවන්, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අරමුදල් කළමනාකරණය සම්බන්ධයෙන් අනෙකුත් වගකිවයුතු පාර්ශවයන් ගේ වගකීම් පැහැදිලි කිරීම

ආයෝජන කමිටුවේ සංයුතිය

Board Members:

- ප්‍රදීප් ලියනමාන මහතා - ආයෝජන කමිටුවේ සභාපති
- හේමක අමරසූරිය මහතා - අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති
- බන්ස ජයා මහතා - සම කළමනාකාර අධ්‍යක්ෂ
- අරුණ සිරිවර්ධන මහතා - සම කළමනාකාර අධ්‍යක්ෂ

ආයෝජන කළමනාකරුවන් :

- ධනුක ලියනගමගේ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි/ ආයෝජන

නිලබලයෙන් සාමාජික

- සුරේෂ් පරණ විතාන මහතා - ප්‍රධාන නිලධාරි (නිලබලයෙන්)
- රංජිත් පෙරේරා මහතා - උපදේශක/ප්‍රධාන මූල්‍ය නිලධාරි
- මාලනී තෙන්නකෝන් මිය - ප්‍රධාන මූල්‍ය නිලධාරි (නිලබලයෙන්)
- නලින් සුභසිංහ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි/ ජීවගණක සේවා (නිලබලයෙන්)
- චමින්ද ගුණසිංහ මහතා - සහකාර සාමාන්‍යාධිකාරි / මූල්‍ය *(රංජිත් පෙරේරා මහතා 2017.04.30 වන දින ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ගන්නා ලදි.)*

යටත් පිරිසෙයින් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු සහ කමිටුවේ කැඳවුම්කරු වන්නාවූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි/ආයෝජන ඇතුලුව ආයෝජන කමිටුවේ ගණ පූර්ණය සාමාජිකයන් 03 දෙනකු වේ.

ආයෝජන කමිටු වාර්තාව ඉතිරි කොටස.

ආයෝජන කමිටුවේ ප්‍රඥප්තිය

ආයෝජන කමිටුවට පහත සඳහන් වගකීම් ඇතුලුව, එහෙත් ඒවාට සීමා නොවූ වගකීම් රාශියක් ඇත.;

1. අනෙකුත් දෑ අතර ක්‍රියාත්මකව පවතින ව්‍යාපාර සහ ආර්ථික පරිසරයේ සිදුවන වෙනස්වීම් හඳුනාගනිමින් ආයෝජන ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම හා එමගින් යෝග්‍ය ලෙස පවත්වාගෙන යාම
2. ආයෝජන ප්‍රතිපත්ති, අරමුදලේ යම් අවශ්‍යතාවයකට උපකාර කිරීමට අවශ්‍යවන්නා වූ වත්කම් හා වගකීම් කළමනාකරණ උපායමාර්ග සමඟ අනුකූලවන බවට තහවුරු කිරීම
3. ඉදිරිකාලයේ කල්පිරීම් සහ පොළී අනුපාත තත්ත්වය සමාලෝචනය කිරීම සඳහා සහ ආයෝජන බැහැර කිරීම් අනුමත කිරීම සඳහා අවශ්‍ය පරිදි නිතර, එහෙත් මාසයකට වඩා අඩු කාලයකදි කමිටු රැස්වීම පැවැත්වීම
4. එකින් එකට වෙනස් බැංකු ගිණුම් හරහා අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම
5. ආයෝජන කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රවාහ අවශ්‍යතා සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට තෛමාසිකව තොරතුරු වාර්තා කිරීම
6. වෘත්තීය කල්ක්‍රියාව පිළිබඳව සීවිෆ්ඒ (කථ) ආයතනයේ වත්කම් කළමනාකාර සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම
7. අනුමත කරනු ලැබූ ආයෝජන ප්‍රතිපත්ති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් යම් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ආයෝජන කටයුතුවලට වෙන් කරන ලද සම්පත් ප්‍රමාණවත් බවට තහවුරු කිරීම

අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම

ආයෝජන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අඛණ්ඩ ශාක්‍යතාවය සහ එකී අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා වන ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයේ යෝග්‍යතාවය නිර්ණය කිරීම සඳහා ආයෝජන කාර්ය සාධනය කාලීනව සමාලෝචනයට ලක් කිරීම

ආයතනය විසින්, ස්වකීය ආයෝජන තනි තනිව සහ කළඹ වශයෙන් විධිමත්ව අධීක්ෂණය කිරීම සඳහා පාලනය කිරීම සහ ආයෝජන කළඹ ඵලදායිලෙස සහ කාර්යක්ෂම ලෙස අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා කළමනාකරණ පරිචයන් ස්ථාපනය කර ඇත.

පී.ඒ. ලියනමාන
සභාපති - ආයෝජන කමිටුව
2017 මැයි 25 වන දින

මූල්‍ය
ප්‍රකාශන

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

පොදු

2007 අංක 7 දරණ සමාගම් පනත, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත, සහ 1955 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් පනත සහ එහි සංශෝධනයන්ටත් අවශ්‍යතාවන්ට අනුකූලව සමාගමේ සහ සමූහ ව්‍යාපාරයේ 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වන විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ එම මූල්‍ය ප්‍රකාශන සහ එම මූල්‍ය ප්‍රකාශන මත වූ විගණකවරයාගේ වාර්තාව සමඟ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්තාව සාමාජිකයන් වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2015.12.31 වන විට සමාගමේ කොටස් සියයට 99.97 ක් ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පැවරී තිබුණි.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පෞද්ගලික) සමාගම, කැනොවින් හොටෙල්ස් හා ස්පා (පෞද්ගලික) සමාගම, සහ සීමාසහිත කළමනාකරණ සේවා රක්ෂණ (පෞද්ගලික) සමාගම යන සමාගම් සම්පූර්ණයෙන්ම සමාගම සතු පාලිත සමාගම් වේ. සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමින් 99.94% ක කොටස් හිමිකාරත්වයක් සහ ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීවිල්සී සමාගමේ 54.61% ක කොටස් හිමිකාරිත්වය සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුවේ. සී/ස කැන්විල් හෝල්ඩින්ස් (පෞද්ගලික) සමාගමේ 45.95% කොටස් හිමිකාරිත්වය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතුවේ. සමූහ ව්‍යාපාරයේ ව්‍යුහය පහත දක්වා ඇති පරිදි වේ.

ආයතනයේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලය " රක්ෂණ මන්දිරය " අංක 21, වොක්ෂෝල් විදිය කොළඹ 02 යන ලිපිනයෙහි පිහිටා ඇත

මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017 04.21 වන දින අනුමත කරන ලදි.

සමාගමේ සහ සමූහ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාව තුළ ජීවිත රක්ෂණ සහ ජීවිත නොවන රක්ෂණ ගණුදෙනු වල නිරතවීම සමාගමේ ප්‍රධාන කාර්ය වේ. සමාලෝචන වර්ෂය ඇතුළත සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රමුඛ වෙනස්කම් කිසිවක් නොමැත.

සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පෞද්ගලික) සමාගම ද්‍රව බනිජ තෙල් ගෑස් (බජඅ) ගබඩා කිරීමේ ද සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා (පෞද්.) සමාගම ගෘහාශ්‍රිත, වාණිජ හා තොග ආකාරයෙන් ද්‍රව බනිජ තෙල් ගෑස් (බජඅ) අපනයන කිරීම සහ බෙදා හැරීමේ ද නිරතව සිටී.

ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පී.එල්.සී. සමාගම සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන් සැපයීමේ ද සී/ස මැනේජ්මන්ට් සර්විසස් රක්ෂණ (පෞද්ගලික) සමාගම විසින් වැටුප් ගෙවීම් කළමනාකරණ සේවයේ ද නිරතව සිටී.

සීමාසහිත කැන්විල් හෝල්ඩින්ස් (පෞද්ගලික) සමාගමේ මූලික කාර්ය වන්නේ හෝටල් ව්‍යාපෘතිය කළමනාකරණය සහ ඒ සඳහා ආයෝජනය කිරීමයි. කැනොවින් හොටෙල්ස් හා ස්පාස් (පෞද්ගලික) සමාගමට මූලිකව දක්ෂිණ අධිවේගී මාර්ගයේ වෙළඳසැල් වල අයිතිය ඇති අතර ඒවා පාලනය කරනු ලබයි.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුගේ වගකීම

සමාගමේ හා සමූහ ව්‍යාපාරයේ කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ මතයක් නිරූපනය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. උචිත පරිදි සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේදී සහ යොදා ගැනීමේදී සහ අවස්ථානුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී, වැරදි හා වංචා හේතු කොටගෙන ඇතිවන සාවද්‍ය ප්‍රකාශන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම් හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම අධ්‍යක්ෂකවරුන්ගේ වගකීමට ඇතුළත් වේ.

ශේෂ පත්‍රය ආදායම් ප්‍රකාශනය, කොටස් හිමියන්ගේ අයිතිය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මෙම වාර්තාවේ අඩංගු වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත සහ 2007 අංක 7 දරණ සමාගම් පනතතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

මූල්‍ය ප්‍රකාශන හා විගණකවරයාගේ වාර්තා

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති සහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති පදනම්කරගෙන 2016.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත.

ප්‍රධාන මූල්‍ය නිලධාරිවරයා සහ අධ්‍යක්ෂවරුන් විසින් අත්සන් කරන ලද සමූහ ව්‍යාපාරයේ සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

විගණකවරයාගේ වාර්තා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියට අනුව බාහිර විගණකවරයා වශයෙන් විගණකාධිපතිවරයා පත්කරන ලදී. 2016.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වාර්ෂික විගණනයේ දී විගණකාධිපතිවරයා සහයෝගය ලබාදීම සඳහා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(4) වගන්තියට ප්‍රකාර, සුදුසුකම්ලත් විගනකවරයෙකු වශයෙන් විගණකාධිපතිවරයා විසින් වරලත් ගණකාධිකරි ආයතනයක් වන ඊඅධ හවුල් ආයතනය පත්කරන ලදී.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉතිරි කොටස.

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ අවශ්‍ය කොටසක් වශයෙන් පවතින මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගනකවරයාගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

විගණන සහ අනෙකුත් අදාළ සේවා සඳහා ගාස්තු

සමාලෝචන වර්ෂය තුළදී විගණන ගාස්තු සහ වෙනත් සම්බන්ධිත සේවාවන් සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණයන් පහත දක්වා ඇත. මෙම පරිච්ඡේදයේ හෙලිදරව් කර ඇති සම්බන්ධතා අයිතීන් වලට වඩා වැඩිමනක් අයිතීන් සමාගම් කෙරේ විගණනවරුන් සතුව නොපවතින බව අධ්‍යක්ෂවරු දැන සිටී.

	2016	2015
	රු.000	රු.000
ව්‍යස්ථාපිත විගණන ගාස්තු	3,700	3,900
විගණනය සම්බන්ධ සේවාවන්	1,000	2,095
විගණනය නොවන සේවාවන්	-	4,740

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අනුගමනය කරන ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

අවදානම හා අභ්‍යන්තර පාලනය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කර අධීක්ෂණය කරනු ලැබ ඇත. අනුගමනය කරන ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටීන් අවදානම් කළමනාකරණ පරිච්ඡේදය යටතේ විස්තර කරනු ලබයි.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මනා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාවට නංවා අධීක්ෂණය කර ඇති අතර සමාගමේ විගණන අනුකූලතා කමිටුව විසින් අභ්‍යන්තර පාලන ක්‍රමවේදය අධීක්ෂණය කරනු ලබයි.

සමාලෝචිත වර්ෂය තුළ ආයතනය තුළ පැවති ඵලදායි අභ්‍යන්තර පාලන හා අවදානම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය සෑහීමකට පත්වේ.

අඛණ්ඩව පවත්වාගෙන යාමේ උවමනාව

සමාගම සහ සමූහ ව්‍යාපාරය විසින් මූල්‍යමය තත්ත්වයන් සහ කාර්ය සාධනය, මුදල් ප්‍රවාහ සහ නියාමන හා ව්‍යවස්ථාවේ කරුණු සැලකිල්ලට ගනිමින් දැනගත හැකි අනාගතය දක්වා එහි මෙහෙයුම් ඉදිරියට ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමාගමට සහ සමූහ ව්‍යාපාරයට ඇති බව මණ්ඩලය විසින් අපේක්ෂා කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අඛණ්ඩව පවත්වාගෙන යාමේ උවමනාව යන පදනම යොදා ගනී.

පිරිවැටුම / දළ ලිඛිත වාරිකය

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුම රු. මිලියන 42,107 ක් වාර්තා කර ඇති අතර සංසන්දනාත්මක (2015) සංඛ්‍යා සඳහා රු. මිලියන 31,156 ක් වාර්තා කරන ලදි.

2016 වර්ෂය සඳහා මුළු දළ ලිඛිත වාරිකය වූ රු. මිලයන 27,614, රු. මිලියන 11,893 ක් වූ ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකයෙන් ද, රු. මිලියන 15,720 ක් වූ ජීවිත රක්ෂණ නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකයෙන් ද සමන්විත විය. 2015 දී වාර්තා වූ මුළු දළ ලිඛිත වාරිකයේ වටිනාකම රු. මිලියන 24,520 ක් වූ අතර එයින් රු. මිලියන 10,470 ක් ජීවිත රක්ෂණ දළ ලිඛිත වාරිකයද රු. මිලියන 14,050 ක් ජීවිත රක්ෂණ නොවන රක්ෂණ දළ ලිඛිත වාරිකය වේ. සමාගම විසින් අත්කර ගන්නා ලද සමස්ථ දළ ලිඛිත වාරිකය සවිස්තරාමත්මක විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

මූල්‍ය ප්‍රතිඵල සහ බෙදා වෙන්කිරීම්

	2016	2015
	රු.000	රු.000
බදු වලට පෙර ලාභය	13,791	4,820
ආදායම් බදු වියදම්	1,050	1,381
බදුවලට පසු ලාභය	12,741	3,439
අනෙකුත් විස්තීර්ණ ආදායම්	(159)	8
කොටස් හිමියන්ට මාරුකිරීම්	600	500
ඉදිරියට ගෙනා බෙදා වෙනා නොකල ලාභය	24,338	23,954
බෙදා වෙන් කිරීමට ඇති ලාභය	37,520	27,901
බෙදා වෙන් කිරීම්		
ලාභාංශ ගෙවීම්	10,011	2,003
අධි ආදායම් බදු	-	635
ජීවිත රක්ෂණ වලින් කොටස් හිමියන්ට අරෝපනය කළයුතු අතිරික්තය	3,845	925
ඉදිරියට ගෙන ආ බෙදා වෙන් නොකල ලාභය	23,664	24,338

ලාභාංශ

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටසකට රුපියල් 10.01 බැගින් (විකතුව රුපියල් 6,003,429,432 ක මුදලක්) නිකුත් කරනු ලැබූ සාමාන්‍ය කොටස් මත ගෙවිය යුතු සහ 2016.08.30 දිනට සම්පූර්ණ යෙන් ගෙවනු ලැබූ ප්‍රථම අන්තර් ලාභාංශයක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරන ලදී. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, කොටසකට රුපියල් 1.67බැගින් (විකතුව රුපියල් 1,001,571,144/- මුදලක්) නිකුත් කරනු ලැබූ සාමාන්‍ය කොටස් මත

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

ගෙවිය යුතු සහ 2016.10.31 දිනට සම්පූර්ණ යෙන් ගෙවනු ලැබූ දෙවන අන්තර් ලාභාංශයක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ අතර, එසේම, 201612.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, කොටසකට රුපියල් 1.67 බැගින්(එකතුව රුපියල් 1,001,571,144/- ක මුදලක්) නිකුත් කරනු ලැබූ සාමාන්‍ය කොටස් මත ගෙවිය යුතු සහ 2016.11.30 දිනට සම්පූර්ණ යෙන් ගෙවනු ලැබූ තෙවන අන්තර් ලාභාංශයක් 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරන ලදී.

තවද, ව්‍යාපරකටයුතු අවසන් කරන 2017.06.30 දිනට ආයතනයේ කොටස් නිකුත් කරනු ලැබූ සහ සාමාන්‍ය කොටස් මත ගෙවනු ලැබූ කොටස් හිමියන්ට 2017.07.01 දිනට ගෙවියයුතු කොටසකට රුපියල් 4.76 බැගින් වූ අවසාන ලාභාංශයක් (එකතුව රුපියල්2,852,097,469,.99/-) අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිර්දේශ කරයි.

ප්‍රකාශිත එකි අතුරු ලාභාංශ සහ අවසාන ලාභාංශ සඳහා 2007 අංක 07 දරණ සමාගම් පනතේ 56 වැනි වගන්තිය යටතේ නුබුන්වත් පිරික්සුම් අවශ්‍යතාවය පිලිබඳ ආයතනය සැහීමකට පත්වන බව අධ්‍යක්ෂකවරුන් විසින් සහතික කර ඇත. නුබුන්වත් සහතික විගණකවරුන්ගෙන් ලබා ගන්නා ලදි.

2015 වර්ෂය සඳහා කොටසකට රුපියල් 3.34 බැගින් රුපියල් 2,003,142,288/- ලාභාංශයක් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ප්‍රකාශයට පත්කරන ලදී

බදු ප්‍රතිපාදන
සමාගමේ බදු තත්ත්වය මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කරනු ලැබේ.

සංචිත
වර්ෂය තුළ සංචිතවල, කොටස්හිමියන්ගේ අයිතිය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත.

රක්ෂණ වකීම් සහ වෙනත් ප්‍රතිපාදන
ජීවිත රකෂණ නොවන රක්ෂණ ව්‍යාපාරවල දරණ ලද එහෙත් වාර්තා නොකරන ලද හිමිකම්පෑම් සහ දරණ ලද එහෙත් ප්‍රමාණවත් පරිදි වාර්තා නොකරන ලද හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන ඇතුළුව නොඉපැයූ වාරික සහ ගෙවීමට ඇති හිමිකම්පෑම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සැපයීම තහවුරු කිරීමට සියලු සාධාරණ පියවර අධ්‍යක්ෂකවරු විසින් ගෙන ඇත. දරණ ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම්පෑම් වල සංචිත අගය කිරීමේ කාර්ය පටිපාටිය සඳහා අධ්‍යක්ෂකවරු විසින් ස්වාධීන ජීවගනකඥ උපදෙස් ලබාගෙන ඇති අතර ඔහුගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 19 සේවක ප්‍රතිලාභ වලට අනුව අවශ්‍ය කරන පරිදි පාරිතොෂික බැරකම් ද ස්වාධීන ජීවගණකඥ විසින් අගය කරන ලදි.

මෙම වාර්තාවේ දිනය වන විට මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන හේතුවෙන් උද්ගත විය හැකි අවස්ථාවන් පිළිබඳව අධ්‍යක්ෂවරුන් නොදැන සිටී.

ආයෝජන
2016 දෙසැම්බර් 31 වන විට සමාගම විසින් දරණු ලැබූ ආයෝජන වල අගය රු. මිලියන 152,445 (2015 රු. මිලියන 147,538) ක් විය. දරණ ලද ආයෝජනවල විස්තරාත්මක දිග හැරුමක් මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

දේපළ, පිරියත හා උපකරණ
දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

සින්නක්කර දේපළවල වෙළඳපොල වටිනාකම
සමාගම විසින් ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත හා උපකරණ වාර්තා කිරීම සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති ලෙස පිරිවැය ක්‍රමය භාවිතා කරයි. සමාගමේ වත්කම් නැවත තක්සේරු කිරීම සම්බන්ධ සමාගමේ ප්‍රතිපත්තිය වන්නේ එය සෑම වසර දෙකකට වරක් කිරීමයි. ඒ අනුව 2016 මුදල් වර්ෂයේදී සුනිල් ප්‍රනාන්දු ඇසෝසියේට් (පෞද්ගලික) සමාගම මඟින් ඉඩම් සහ ගොඩනැඟිලි නැවත තක්සේරු කනර ලදි. එම වත්කම් නැවත තක්සේරු කිරීම කර ඇත්තේ වෙළඳපොල වටිනාකම සඳහා විවෘත වෙළඳපොල වටිනාකම මතය. එම නැවත තක්සේරු කිරීමේ ප්‍රතිඵල ඒවා බලාත්මක වන දිනය වන 2016.12.31 දින සිට මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කර ඇත.

වාර්තාකරණ දිනෙන් පසු හටගත් සිද්ධීන්
මූල්‍ය ප්‍රකාශන සටහන්වල අනාවරණය කරනු ලැබීම් හැර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අංක 24, සම්බන්ධිත පාර්ශව හෙලිදරවු කිරීම අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදා ගන්නා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මෙම වාර්ෂික වාර්තාවේ දක්වා ඇත.

ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ බැඳීම
ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂකවරුන්ගේ බැඳීම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරවු කර ඇත. මෙම බැඳීම් පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ රැස්වීම්වල දී නිසි පරිදි හෙළිදරවු කර ඇත. අධ්‍යක්ෂකවරුන් සමාගමේ කිසිදු කොටසක් දරන්නේ නැත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉතිරි කොටස.

අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික

වසර තුළ අධ්‍යක්ෂකවරුන්ට ගෙවන ලද ගාස්තු සහ පාරිශ්‍රමික රු. මිලියන 19.5 ක් වන අතර පසුගිය වසරේදී වාර්තා කරන ලද සංඛ්‍යාව රු. මිලියන 17.2 ක් වේ.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2007 අංක 7 දරණ සමාගම් පනතට අනුකූලව මූල්‍ය වාර්තාවල දක්වන ලද සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධන රු. මිලියන 6,000 ක් විය. 2016.12.31 වෙනි දිනයට අවසන් වර්ෂය වන විට කොටස් වලින් 99.97%. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත පවරා තිබේ.

ව්‍යවස්ථාපිත ගෙවීම්

තම උපරිම දැනීමේ හා විශ්වාසයේ හැටියට සමාගම විසින් රජයට, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට හා සේවකයන් සම්බන්ධ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවනු ලැබ ඇති බවට අධ්‍යක්ෂකවරු සෑහීමකට පත්ව සිටිති.

අස්පර්ශනීය වත්කම්

2016.12.31 වන විට සමාගමේ අස්පර්ශනීය වත්කම සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත.

පරිසරය

අප ආයතනය පරිසරය ආරක්ෂිත කිරීමට පනවා ඇති සියළුම නීතිර රීති වලට අනුකූලව කටයුතු කරන අතර කිසිදු හානිදායක කටයුත්තක නියැලී නොමැත.

නීති හා රෙගුලාසි වලට අනුකූල වීම

සමාගම විසින් මූල්‍ය වර්ෂය තුළදී ඊට අදාළ වන්නාවූ සියලු නීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාකර ඇත. සමාගමේ අනුකූලතා කාර්යයන් අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒවා පිළිබඳ විගණන හා අනුකූලතා කමිටුව වාර්තා කරනු ලබයි.

ගිණුම් වාර්තා අනුමත කිරීම

විගණනය කරන ලද ගිණුම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2017.05.25 වන දින අනුමත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය

හේමක ඩී. එස්. අමරසූරිය මහතා (සභාපති)
ටී.එම්.ආර්. බන්ස ජයා මහතා (සම කළමනාකාර අධ්‍යක්ෂ)
ඩී.බී. අරුණ පී.එස්. සිරිවර්ධන (සම කළමනාකාර අධ්‍යක්ෂ)
විද්‍යාජෝති මහාචාර්ය වල්.පී. චන්ද්‍රසේන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)
පී. අල්ගම මහාතා (විධායක නොවන අධ්‍යක්ෂ)
අසේල එස්. පද්මපෙරුම මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)
ප්‍රදීප් ඒ. ලියනමාන මහතා (විධායක නොවන අධ්‍යක්ෂ)
(කිත් ඩී. බර්නාර්ඩ් මහතා 2016.12.20 දින සමාගමේ සේවයෙන් ඉවත් වූ අතර ඩී.බී. අරුණ පී.එස්. සිරිවර්ධන මහතා 2016.12.20 දින පත් කරන ලදී)

වාර්ෂික මහා සභා රැස්වීම

කොළඹ 02, වොක්ෂෝල් වීදියේ අංක 21 දරණ ස්ථානයේ පිහිටි සමාගමේ ස්වකීය ලියාපදිංචි කාර්යාලයේ ශ්‍රවණාගාරයේ 2017.06.30 වන දින වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලැබේ.

වාර්තාවේ අන්තර්ගතය පිළිගැනීම

2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 (1) (ඔ) වැනි වගන්තිය මගින් නියම කර ඇති පරිදි, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මෙම වාර්තාවේ අන්තර්ගතය පිළිගනු ලබන්නේ ය.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,



බී.ඒ. රුවනි ධර්මවර්ධන
සමාගම් ලේකම්
2017 මැයි 25 දින දී


අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන්



හේමක ඩී.එස්. අමරසූරිය මහතා



ටී.එම්.ආර්. බන්ස ජායා මහතා



ඩී.බී. අරුණ පී.එස්. සිරිවර්ධන

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශවලට අදාළව අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම පහත සඳහන් ප්‍රකාශනය තුළ පැහැදිලි කර ඇත. මූල්‍ය ප්‍රකාශවලට අදාල විගණකවරුන්ගේ වගකීම වාර්ෂික වාර්තාවෙහි විගණනවරුන්ගේ වාර්තාවේ දක්වා ඇත.

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම යටතේ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතා සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තයේ රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව අධ්‍යක්ෂකවරුන්ගේ මතය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යෝග්‍ය ගිණුම්කරන ප්‍රතිපත්ති අනුකූලව යොදාගෙන ඇති බව හා විචක්ෂණශීලී තීරණ සහ ඇස්තමේන්තු මගින් තහවුරු කරනු ලැබූ බව අධ්‍යක්ෂකවරුන් විසින් තහවුරු කරයි. එසේම මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩව පවත්වාගෙනයාමේ පදනම අදාළ කර ගැනීම සාධාරණීකරණය කිරීම සඳහා මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් රක්ෂණ සංස්ථාව සතුවන බව අධ්‍යක්ෂකවරුන් තහවුරු කරයි. ඊට අමතරව, ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සාධාරණ නිවැරදිභාවයකින් යුතුව අනාවරණය කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන බවට අධ්‍යක්ෂක මණ්ඩලය තහවුරු කර ඇත.

තවද, අලාභය සිදුවන ලද නමුත්, වාර්තා නොවූ හිමිකම් සහ ලැබිය යුතු දෑ ඇතුළුව නොඉපයූ රක්ෂණ වාරික අපේක්ෂිත අවදානම් හිඟ හිමිකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සැපයීම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සියළුම සාධාරණ පියවර ගෙන ඇත.

ශේෂ පත්‍රයේ දිනට ආයතනය විසින් ගෙවිය යුතු සියළුම බදු තිරුබදු සහ අයබදු මෙන්ම ආයතනයේ සේවකයන් වෙනුවෙන් ගෙවිය යුතු සියළුම දායක ගෙවීම් සහ බදු සහ අනෙකුත් සියළුම පිළිගත් ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ ගෙවා ඇති බවට සහ ගෙවීමට සලස්වා ඇති බවට ස්වකීය දැනුමේ හැටියට අධ්‍යක්ෂක මණ්ඩලය තහවුරු කරයි.

ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවලදී රක්ෂණ ඔප්පු හිමියාට ගෙවිය යුතු පාර්තෝෂික සහ කොටස් හිමියන්ට ලබාගත හැකි අතිරික්ත නිර්ණය කරනු ලබන්නාවූ ආයුගණකයේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළිගන්නා ලදි.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,



බී.ඒ. රුවනි ධර්මවර්ධන
සමාගම් ලේකම්
2017 මැයි 25 දින දී

ප්‍රධාන මූල්‍ය නිලධාරියාගේ වගකීම් ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 වන දිනට සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ ආයතනයේ සහ පරිපාලිත (සමූහය) සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් 2007 අංක 07 දරණ සමාගම් පනත සහ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි මගින් නියම කර ඇති අවශ්‍යතාවලට අනුකූලව, පිළියෙල කර ඉදිරිපත් කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශන සහ එහිදී සිදු කරන ලද අනාවරණයන් පිළියෙල කිරීමේදී භාජන කරනු ලැබූ ආකෘතීන් අදාල නියාමන ආයතන විසින් නියම කරන ලද ආකෘතීන්වලට අනුකූල වේ.

මෙම වාර්ෂික වාර්තාවට ඇතුලත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් මූල්‍ය තොරතුරු සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මූල්‍ය තත්ත්වය මෙහෙයුම් ප්‍රතිඵල සහ මූල්‍ය ප්‍රවාහය සෑම වැදගත් අංශයකින් සාධාරණව පිළිඹිඹු කරන බව අපගේ දැනුමේ හැටියට අප විසින් තහවුරු කරන්නෙමු. ඊට අමතරව, ස්වකීය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙනයාම සඳහා අප ආයතනය සතුව ප්‍රමාණවත් සම්පත් පවතින බවත් මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අඛණ්ඩව පවත්වාගෙනයාමේ පදනම යොදාගනු ලැබූ බවත් අප විසින් තහවුරු කරන්නෙමු.


කළමනාකරණය විසින් ස්වකීය මූල්‍ය පිළිබඳ වාර්තා කිරීමේ වගකීම් ඉටු කරනු ලබන බවට සහතික කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම වේ. ප්‍රධාන මූල්‍ය නිලධාරියා වශයෙන් මූල්‍ය වාර්තා කරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහ අභ්‍යන්තර පාලනය ස්ථාපිත කර පවත්වාගෙන යාම මාගේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන සෑම වැදගත් අංශයකින්ම නිවැරදි හා පූර්ණ වට සාධාරණ සහතිකයක් ලබාදීම පිණිස නිර්මාණය කරන ලද අභ්‍යන්තර පාලන පද්ධතියක් කළමණාකරණය සතුවේ. මූල්‍ය වාර්තා විශ්වාශනීය බවට සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා විධිමත් පදනමක් ඇති කරනු ලබන බවටත් වත්කම් විධිමත් පරිදි ගිණුම්ගත කර ආරක්ෂා කරනු ලබන බවත් කළමනාකරණයේ විශ්වාසය වේ.

ස්වාධීන අධ්‍යක්ෂකවරයකු ප්‍රදානත්වය දරනු ලබන විගණන සහ අනුකූලතා කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබ ඇත. විගණන සහ අනුකූලතා කමිටුවේ වගකීම්වලට, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ ඒවා අනුමැතිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට නිර්දේශ කිරීම ඇතුළත් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තියේ විධි විධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් ආයතනයේ කොටස් හිමියන් වෙනුවෙන්, මූල්‍ය ප්‍රකාශන විගණනය කරනු ලැබ ඇත. ස්වාධීන විගණකවරයෙකුට, විගණන සහ අනුකූලතා කමිටුව වෙත පූර්ණ සහ නිදහසේ ප්‍රවේශවීමට හැකි අතර කළමනාකරණය සමඟ හෝ නොමැතිව, විගණන සහ අනුකූලතා කමිටුව හමුවිය හැක.

අප විසින් අපගේ දැනුමේ හැටියට -

i. මූල්‍ය ප්‍රකාශන සටහන්වල ප්‍රකාශිතව සඳහන් කර ඇති පරිදි හැර, සියළුම අදාල නීති රීති සහ නියෝග මෙන්ම මාර්ගෝපදේශවලට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් කටයුතු කර ඇති බවත්,
ii. මූල්‍ය ප්‍රකාශන සටහන්වල ප්‍රකාශිතවම දක්වා ඇති පරිදි හැර වැදගත් අණුනුකූලවීම් නොමැති බවත්,
iii. වාර්තාකරන දිනට සමාගම විසින් ගෙවිය යුතු සියළුම බදු, අයබදු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් මෙන්ම ආයතනයේ සේවකයන් වෙනුවෙන් සහ අදාළව ගෙවිය යුතු දායක ගෙවීම් සහ බදු ගෙවා ඇති බවට හෝ ඒ සඳහා අදාල කටයුතු සලසා ඇති බවටත්,
iv. මතුවට ගැනීම සඳහා වෙන් කර තැබීමේ සහ නුඹුන්වත් මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කරනු ලැබ ඇති අතර, ප්‍රවේශවිය හැකි වත්කම් ගැළපීම මගින් මුළු සංචිතවලට පිටුවහලක් වනු ඇති බවට සහ
v. අඳළ කරගත හැකි රෙගුලාසිවලට අනුව කොටස් ප්‍රාග්ධනය දෙන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලනු ලබන බවටත් සහතික වන්නෙමු.



මාලනී තෙන්නකෝන්
ප්‍රධාන මූල්‍ය නිලධාරී
2017 මැයි 25 වන දින

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

රක්ෂකයාගේ ජීවගණකඥ සහතිකය

Willis Towers Watson

පෞද්ගලිකයි රහසිගතයි

2017 මැයි 05

අධ්‍යක්ෂ මණ්ඩලය
සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 2, ශ්‍රී ලංකා.

2016 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලීන රක්ෂණ කටයුතුවල ජීවගණකඥ අගය

2014 ජුනි 23 දිනැති ගිවිසුම් ලිපිය අනුව, විල්ස් ටවර්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් ("විලිස් ටවර්ස් වොට්සන්" ; " අපි", " අපගේ", "අපට",) 2016 දෙසැම්බර් 31 දිනට සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ දීර්ඝ කාලීන රක්ෂණ කටයුතුවල දීර්ඝ කාලීන රක්ෂණ වගකීම් අගයෙහි ජීවගණකඥ සමාලෝචනයක් සිදුකරනු ලැබ ඇත.

ඒඅනුව,

1. දීර්ඝ කාලීන රක්ෂණ අරමුදල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ වගකීම් ජීවගණකඥ අගය සඳහා භාවිතා කරනු ලැබූ දත්ත පරිපූර්ණ හා නිවැරදි බවට තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සාධාරණ පියවරගෙන ඇති බවත්,

2. 2016 දෙසැම්බර් 31 දිනට සියලුම පවත්නා සහ අවිනිශ්චිත වගකීම් සැළකිල්ලට ගෙනදීර්ඝ කාලීන රක්ෂණ අරමුදලට අදාළ සියලුම වගකීම් සඳහා එදිනට ප්‍රමාණවත් සහ විධිමත් සංචිත සලසා දී ඇති බවත්,

3. අතිරික්ත බෙදාහැරීමේ පදනම මත ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලැබූ දීර්ඝ කාලීන මුළු රක්ෂණ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 43,391.52 ද, අරමුදල තුළ පවත්වාගෙන යනු ලැබූ වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 90,828.43 ද, 2016 වර්ෂය තුළ දී ජීවිත රක්ෂණ අරමුදලින් කොටස් හිමියන්ට මාරුකරනු ලැබූ අතිරික්තය රුපියල් මිලියන 3,471.04 ද, කොටස් හිමියන්ට පවරනු ලැබූ අතිරික්තය යනු, වර්ෂය තුළ දී බාර ගනු ලැබූ හවුල්වීමේ අරමුදලේ හවුල්වීමේ ප්‍රත්පත්ති වල සිට හවුල්නොවීමේ අරමුදල් වලට සම්බන්ධ ව්‍යාපාර කිරීමේ අතිරේක කොන්දේසි පැවරීම සඳහාවන පශ්චාත් දීමනාව බවත්, එසේ පවරන ලද අතුරු වගන්තිවලට අදාළව (එකට බැදුණු ප්‍රතිලාභ වශයෙන් හවුල්කාරී නිෂ්පාදනවලට පිරිනමනලද ඒවා හැර) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදන පැවරීම මෙන්ම, ලැබුණු වාරික, දරනලද වියදම්, ගෙවනලද ප්‍රතිලාභ, අනෙකුත් දේ අතර, වර්ෂය තුළ ප්‍රතිලාභ සහ අලාභ හිණුමේ පැවරුමේ කොටසක් වශයෙන් මුල්‍ය ප්‍රවාහ ඇතුළත්වන බවත්, කොටස් හිමියන්ගේ පැවරුම් වලට යටත්ව, 2016 දෙසැම්බර් 31 දිනට ජීවිත අරමුදල රුපියල් මිලියන 87,357.39 බවත්, මෙයින් සහතික කරන්නෙමු.

මාර්ක් ඇලන් බර්ච් එෆ්අයිඒ
අධ්‍යක්ෂ, අවදානම් උපදේශන සහ මෘදුකාංග ආසියානු පැසිපික්,
ටවර්ස් වොට්සන් සිංගප්පූරු ප්‍රයිවෙට් ලිමිටඩ්

අත්සන :
ස්ථානය : සිංගප්පූරුව
දිනය : 2017 මැයි 05

63 Chulia Street
#09-01 OCBC Centre East
Singapore 049514
T +65 6880 5688
F +65 6880 5699
W willistowerswatson.com
Towers Watson Singapore Pte Ltd (198600361K)

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 මූල්‍ය ප්‍රකාශන
220-248 අතිරේක තොරතුරු

වගකීම් ප්‍රමාණවත්බව පිරික්සුම

Willis Towers Watson

පෞද්ගලිකයි රහසිගතයි

2017 මැයි 05

අධ්‍යක්ෂ මණ්ඩලය
සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
රක්ෂණ මන්දිරය, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 2, ශ්‍රී ලංකා.

වගකීම් ප්‍රමාණවත්බව පිරික්සුම

1.1 ස්වකීය රක්ෂණ ගිවිසුම් යටතේ අනාගත මූල්‍ය ප්‍රවාහයන් පිළිබඳ පවත්නා තක්සේරු කිරීම් භාවිතා කරමින් වාර්තා කරන එක් එක් කාල පරිච්ඡේදයක් අවසානයේදී හඳුනාගත් ස්වකීය රක්ෂණ වගකීම් ප්‍රමාණවත් ද යන්න පිළිබඳ රක්ෂකයා විසින් තක්සේරු කළ යුතු බවට ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්, ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි 4 ට සහ රක්ෂණ ගිවිසුම් මගින් නියම කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 4 (SLFR 4) හි නියම කළ ඇති පරිදි සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලබන දිගුකාලීන රක්ෂණ ප්‍රතිපාදන උදෙසා වන වගකීම් ප්‍රමාණවත්බව පිරික්සුම පිලිස් ටුවර්ස් වොට්සන් සමාගම භාරගෙන ඇත.

1.2 වගකීම් ප්‍රමාණාත්මක පිරික්සුම ක්‍රියාත්මක කිරීමේදී, ආයුගණක වගකීම සමඟ විගණනය කරන ලද ගිණුම්වලට අනුව රඳවා ගනු ලැබූ ප්‍රතිපාදන සංසන්දනය කර ඇත.මේ සඳහා බලපවත්නා රක්ෂණ ගිවිසුම්වලට අදාළ වගකීම් පියවා දැමීම සඳහා අවශ්‍යවන්නාවූ ඇතුලට සහ පිටතට යන සියලුම මූල්‍ය ප්‍රවාහයන්වල පූර්ණ ජීව කාලය ආවරණය කරමින් වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහ ප්‍රවේශයක් භාවිතා කරමින් වගකීම් තක්සේරු කරනු ලබන්නා වූ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියම කරනු ලැබ ඇති පරිදි (නුබුන්වත් සීමා, (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති 2015) අවදානම් පාදක කරගත් ප්‍රාග්ධන රාමුවක් තුළ සඳහන් කර ඇති මූලිකාංග අනුගමනය කරමින් ආයුගණක වාගකීම පිළිබඳ වටිනාකම ගණනය කරනු ලැබේ.

1.3 ප්‍රක්ෂේපතා 2016 දෙසැම්බර් 31 වන දිනට බලාත්මක රක්ෂණ ඔප්පු සහ අතුරු නිර්දේශ මත පදනම් වේ.

1.4 පරීක්ෂාවට අනුව,

- ආයුගණක වගකීම පිළිබඳ වටිනාකම ගණනය කිරීමේදී ජාත්‍යන්තරව පිළිගත් ආයුගණක ක්‍රම පදනම්කරගෙන සහ ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි 4 යටතේ එන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කළ බවත්,
- පවත්නා අධ්‍යයන අත්දැකීම් පදනම් කරගෙන සහ අහිතකර අපගමණයන් සඳහා යෝග්‍ය සීමාවන්වලට ඉඩ හැරීමෙන් පසු වවැහි තක්සේරු කිරීමක් සඳහා භාවිතා කරනු ලැබූ උපකල්පන සාධාරණ තක්සේරු කිරීම් බවත් ; සහ
- 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද ගිණුම්වලට අනුව සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත අරමුදල තුළ පවත්වාගෙන යනු ලබන දිගුකාලීන රක්ෂණ ප්‍රතිපාදන ඉහත ආකාරයෙන් ගණනය කරනු ලැබූ වගකීම්වලට අතිරේකව පවතින බව සහතික කරමි.

මාර්ක් ඇලන් බර්වි, එෆ්අයිඒ
අධ්‍යක්ෂ අවදානම් උපදේශක සහ මෘදුකාංග ආසියා පැසිපික්
ටවර්ස් වොට්සන් සිංගප්පූරු ප්‍රයිවට් ලිමිටඩ්

අත්සන : 
ස්ථානය : සිංගප්පූරුව
දිනය : 2017 මැයි 05

63 Chulia Street
#09-01 OCBC Centre East
Singapore 049514
T +65 6880 5688
F +65 6880 5699
W willistowerswatson.com
Towers Watson Singapore Pte Ltd (198600361K)

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

අලාභය සිදුවන ලද නමුත් (ප්‍රමාණවත් ලෙස) වාර්තා නොවූ හිමිකම් පිළිබඳව සහතිකය

2017 අප්‍රේල් 28

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොටස් හිමියන් වෙත

2016 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ - අලාභය සිදුවන ලද නමුත් (ප්‍රමාණවත් ලෙස) වාර්තා නොව හිමිකම් පිළිබඳ සහතිකය (NBNR) සහ වගකීම් ප්‍රමාණාත්මක පිරික්සුම සහතික කිරීම (LAT)

2016 දෙසැම්බර් 31 වන දිනට 75% ක විශ්වාසනීය මට්ටම පවතින රුපියල් 2,306,368,464 ක අලාභය සිදු කරන ලද නමුත් වාර්තා නොවූ (IBNR) හිමිකම් මුදල ශුද්ධ ප්‍රතිරක්ෂණය (වට්ටම් නොකළ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිමිකම් බැඳීමට අදාළව ප්‍රමාණවත් බවට මෙයින් සහතික කරමි. සමාගම විසින් පවත්වාගෙන යනු ලබන සිද්ධි සංචිත ඇතුළුව මෙම (IBNR) ප්‍රතිපාදන 2016 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ හිමිකම් බැඳීම්වලට අදාළව, හිමිකම් මෙහෙයුම් වියදම් ඇතුළුව අනාගතයේ ඇතිවිය හැකි වගකීම් සඳහා බොහෝ සෙයින් ප්‍රමාණවත් වුවද අනාගත ප්‍රත්‍යක්ෂයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවනු ඇති බවට සහතික කරමි.

වාර්තාවූ එක් එක් කාල පරිච්ඡේදය අවසානයේදී අලාභය සිදුවන ලද නමුත් වාර්තා නොවූ හිමිකම් (SLFRS4) මගින් දක්වා ඇති පරිදි වගකීම් ප්‍රමාණවත් පිරික්සුම සිදු කිරීමට සමාගම්වලට නියම කරනු ලැබේ. නොඉපයූ වාරික සංචිත (UPR) වල පවත්වාගෙන යන මුදල් ප්‍රමාණයේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සඳහා වගකීම් ප්‍රමාණවත් පිරික්සුම (LAT) සිදු කරනු ලැබේ. සමාගම විසින් පවත්වාගෙන යනු ලබන රුපියල් 7,853,248,467 වන නොඉපයූ වාරික සංචිත ප්‍රතිපාදනය, ප්‍රතිරක්ෂණවල ශුද්ධ ප්‍රමාණය, 2016 - දෙසැම්බර් 31 දිට සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අනාගතයේදී ඇති විය හැකි අවදානම්වලට අදාළව ප්‍රමාණවත් වුවද අනාගත ප්‍රත්‍යක්ෂයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවන බව සහතික කරමි. එසේ හෙයින්, සමාගම විසින් හඳුනාගත යුතු රක්ෂණ වාරික හිඟයක් නොමැත.

ජාත්‍යන්තරව පිළිගත් ආයුගණක මූලධර්ම වලට අනුව ප්‍රතිඵල නිර්ණය කරනු ලැබ ඇත.

ඉහත සඳහන් සමාගමේ කළමනාකරණය විසින් සපයා දෙනු ලැබූ තොරතුරු හා දත්ත මත විශ්වාසය නොවූ අතර සපයනු ලැබූ දත්ත තනිව සකස් නොකරනු ලැබූ අතර දත්තවල සාධාරණතවය සම්බන්ධයෙන් මා සෑහීමකට පත්වන අතිරේකව පරීක්ෂා කිරීම අදාළ කරගෙන ඇත.

මැතිව් මැගුයිර්
ඕසට්‍රේලියානු ආයුගණක ආයතනයේ සාමාජික (ඒඅයිඒඒ)
එන්එම්ජී මූල්‍ය සේවා උපදේශක ආයතනය වෙනුවෙන්
2017 අප්‍රේල් 28 දිනැති

T: +65 6325 9855 F: +65 6325 4700 E: contact@NMG-Group.com
www.NMG-Group.com
30 Hill Street #03-02A, Singapore 179360

4-13 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
16-53 කාර්ය සාධන සමාලෝචනය 2016
56-82 පාලනය සහ අභ්‍යන්තර පාලනය
85-217 **මූල්‍ය ප්‍රකාශන**
220-248 අතිරේක තොරතුරු

ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. BAF/E/SLIC/FA/6/2016/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date ๒๖ May 2017

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කොටස් හිමියන් වෙත,

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගම්වල 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව.

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු සටහන්වල සාරාංශයකින් සමන්විත, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (2016) මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම විගණනය කරගෙන යාමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය වන ලදි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (මණ්ඩලය) වගකීම වේ.

විගණකවරයාගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතීන් මගින් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව, උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය, විගණකවරයා සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

තත්වාගණනය කළ මතය සඳහා පදනම

අ. 2009 ජූනි 04 දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නඩු තීන්දුව අනුව සමාගමේ කොටස් වැඩි ප්‍රමාණයක නෛතික අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් තබා ගැනීම සඳහා මහ භාණ්ඩාගාරයේ ලේකම් වෙත බලය පවරන ලදී. තවද එකී නඩු තීන්දුව ප්‍රකාරව, ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පීඑල්සී සමාගම, මෙම සමාගමේ මවු සමාගම ලෙස පැවැති කාල පරිච්ඡේදයේදී ඉපැයූ ලාභ ගණනය කර ඉකුත් මවු සමාගමට ඉපැයූ ආරෝපිත ලාභ පියවන ලෙසත් භාණ්ඩාගාර ලේකම්ට නියෝග කරන ලදි. එකී ආරෝපිත ලාභ නිශ්චය වී නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර නොතිබුණි.

ආ. ශේෂ සනාථ කිරීම් නොමැති වීම හේතුකොට ගෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් 16 හි හෙළිදරව් කර ඇති ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පීඑල්සී සමූහ සමාගමෙන් අයවිය යුතු මුදල්වල සම්පූර්ණත්වය, පැවැත්ම සහ නිරවද්‍යතාවය මට සත්‍යෝක්ෂණය කළ නොහැකි විය. ඒවිවැපැබවීග

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் நாயகம் அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

තත්ත්වාගණනය කළ මතය

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යටතේ විස්තර කර ඇති කරුණුවලින් විය හැකි බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින්, 2016 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

අ) 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) හි නිනයම කර ඇති පරදි පහත සඳහන් දෑ මම ප්‍රකාශ කර

i. මතය සඳහා පදනම, විගණන විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

ii. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යටතේ විස්තර කර ඇති කරුණු හැර මාගේ මතය වනුයේ,

- විගණන කටයුතු සඳහා අවශ්‍ය වූ සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට, සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා තිබුණි.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරයි.
- සමාගමේ සමූහයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ 151 හා 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

ආ) මූල්‍ය ප්‍රකාශනවල සටහන 47 හි විස්තර කර ඇති පරිදි, 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි (සංශෝධන) පනතේ 52 සහ 53 වගන්තිවලට අනුකූලව, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ සමාගම විසින් ක්‍රියාත්මක කරන දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන වෙනම සමාගම් ලෙස වෙන් කර නොතිබුණු අතර අවසරලත් කොටස් වෙළඳපොළේ එහි කොටස් ලැයිස්තුගත නොකර තිබුණි.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනතේ 47 (2) වගන්තිය ප්‍රකාරව මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට ඉහත ඡේදයේ දක්වා ඇති කරුණු හැර සමාගමේ ගිණුම් වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කරන ලද රීතිවල අවශ්‍යතාවලට අනුව සමාගමේ මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණව දැක්වෙන පරිදි පවත්වා තිබුණි.

පාර්ලිමේන්තුවට වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	සමූහය 2016 රු. 000	සමූහය 2015 රු. 000	සමාගම 2016 රු. 000	සමාගම 2015 රු. 000
වත්කම්					
මූල්‍ය ආයෝජන	5	132,314,943	133,784,298	130,184,713	123,694,831
අනුබද්ධිත සමාගම්වල ආයෝජන	6	-	-	21,085,905	21,085,905
අනුබද්ධිත සමාගම්වල ආයෝජන	7	138,448	128,090	138,448	128,090
දේපල, පිරියත හා උපකරණ	8	44,033,232	38,265,273	10,248,900	8,112,393
ආයෝජන දේපල	9	1,396,200	1,241,642	619,200	465,231
කල්බදු දේපල	10	212,255	198,759	20,268	20,537
අස්පෘෂ්‍ය වත්කම්	11	3,201,401	3,269,504	148,272	215,625
ඔප්පු හිමියන් ට ණය	12	1,518,719	1,569,342	1,518,719	1,569,342
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ	13	1,883,063	1,275,104	1,883,063	1,275,104
ලැබිය යුතු වාරික	14	3,404,735	3,229,376	3,404,735	3,229,376
විලම්බිත බදු වත්කම්	15	131,742	95,549	131,317	95,158
වෙනත් වත්කම්	16	8,279,873	5,961,703	5,354,111	3,371,903
විලම්භිත වියදම්	17	441,191	358,991	441,191	358,991
මුදල් හා මුදල් සමාන දෑ	18	16,841,834	17,108,358	1,623,723	3,324,978
මුළු වත්කම්		**213,797,636**	**206,485,989**	**176,802,565**	**166,947,464**
මුළු බැරකම් හා කොටස් කරුවන්ගේ ස්කන්ධය					
ස්කන්ධය					
ප්‍රකාශිත ප්‍රාග්ධනය	19	6,000,000	6,000,000	6,000,000	6,000,000
ප්‍රත්‍යගනන සංචිතය	20	11,623,290	9,167,303	8,159,082	5,850,502
විකුණුම් සඳහා ලබාගත හැකි සංචිත	21	21,055,304	22,390,664	21,055,304	22,390,664
ආදායම් සංචිතය	22	40,158,021	44,611,274	27,706,557	29,435,948
සමාගමේ කොටස්කරුවන් වෙත බෙදිය හැකි මුළු ස්කන්ධය		78,836,615	82,169,241	62,920,943	63,677,114
සුළු කොටස්හිමි අයිතිය		7,961,626	7,509,450	-	-
මුළු ස්කන්ධය		86,798,241	89,678,691	62,920,943	63,677,114

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 4-13
කාර්ය සාධන සමාලෝචනය 2016 16-53
පාලනය සහ අභ්‍යන්තර පාලනය 56-82
මූල්‍ය ප්‍රකාශන 85-217
අතිරේක තොරතුරු 220-248

දෙසැම්බර් 31 දිනට	සටහන	සමූහය 2016 රු. 000	සමූහය 2015 රු. 000	සමාගම 2016 රු. 000	සමාගම 2015 රු. 000
බැරකම්					
